# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 අප්‍රේල් 24 වන අඟහරුවාදා**
2012 ஏப்பிரல் 24 செவ்வாய்க்கிழமை
Tuesday 24th April 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.49 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.49 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.49 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ගමන්ම, 2012 ලැබුවා වූ සිංහල - හින්දු අලුත් අවුරුද්ද ඔබ සැමට සාමය, සෞභාග්‍යය, සතුට පිරි සුභ නව වසරක් වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

# නිවේදන
## ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"මෙතෙක් වගා නොකරන කුඹුරු වගා කළ හැකි ගොවීන්ට ලබා දීම සම්බන්ධව, 2012.01.03 වන දින සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ශ්‍රී ලංකා ජනරජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙතටත්, එමගින් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශ ලේකම් වෙතටත්,*

*පළාත්බද සංවර්ධන සැලසුම් කමිටුවක් පිහිටුවීම සම්බන්ධව 2012.01.17 වන දින සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයටත්,*

*පළාත් පාලන මන්ත්‍රීවරුන්ට ත්‍රීරෝද රථයක් හෝ මෝටර් බයිසිකලයක් මිලදී ගැනීමට පොලී රහිත ණය මුදලක් ලබා දීම සම්බන්ධව 2012.03.06 දින සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතටත්, යොමු කර තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා."*

*ii*

**නිල වාර්තාව නිවැරදි කිරීම :**

*"2012 මාර්තු 06 වන දින නිල වාර්තාවේ, 30 වන පිටුවේ 0419 තීරුවේ බණිජ බදු ප්‍රඥප්තියට ඉදිරිපත් කළ සංශෝධනයේ එනම්, 7(1) වගන්තිය සංශෝධනය කරමින් ඉදිරිපත් කළ වගන්තියේ 4 වන පේළියේ "හැකිය" යන්න, "යුතුය" යනුවෙන් නිවැරදි විය යුතු බව දැනුම් දෙනවා.*

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් අදාළ ලේඛනය සභාවට පිළිගැන්වීමට අවසර පතනවා.

ගරු සභාපතිතුමනි, *"පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2011 වර්ෂය"* නමැති ලේඛනය මෙම සභාවට පිළිගන්වනවා. එහි පිටපත් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට අද දින න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සලස්වා තිබෙනවා. ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂය යටතේ කළ හැකිව තිබෙනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම සභාවට පිළිගන්වනවා.

i. 2012.04.05 වන දින පැවති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2012.03.05 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මීරිගම, පමුණුවත්ත, හේනේපොල, පහළවෙල, අංක 71 හි පදිංචි කේ.ඒ. සම්පත් තුසිර කුමාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. තිඹිරිගස්කටුව, අරලිය මාවත, අංක 120/2 හි පදිංචි විජේරත්න මුදියන්සේලාගේ වින්ධ්‍යා සේනානි අමරසේකර යන අයගේ පෙත්සම සහ,

ii. කටාන, මඩම්පැල්ල, පීටර්හිල් වත්ත, අංක 28 හි පදිංචි එස්.බී. නිලන්ත චම්පික යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සමූපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති තුනක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය එකී සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Udana Wijerathne, Member, under item No. 01 of the agenda, was presented to the Hon. Minister of Cooperatives and as three weeks time was asked for, Hon. Chairman ordered the question to be referred to the said Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට නියමිත ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මා වෙත මේ ප්‍රශ්නයට පිළිතුරු ලැබී තිබුණත් ඒ පිළිතුරු පිළිබඳව සමහර අපැහැදිලි තැන් තිබෙනවා. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විදේශ ගතව සිටින බැවින් සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***න්‍යාය පත්‍රයේ අංක 02 හා 03 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල් බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The questions in the name of the Hon. Nalinda Jayathissa, Member, under item No. 01 and 02 of the agenda, were presented to the Hon. Minister of Health and as two weeks time was asked for, Hon. Chairman ordered the questions to be referred to the next Council sitting.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අද අපි දන්නවා. විශේෂයෙන්ම දඹුල්ලේ පසුගියදා ඇති වුණු ඒ සිද්ධිය උඩ අද මුළු රටේම ඉන්න මුස්ලිම් ජනතාවගේ සිත්වලට විශාල ප්‍රමාණයෙන් හානියක් සිදු වුණාය කියලා කියන්න ඕනෑ. මේ ආණ්ඩුවේ ඉන්න මුස්ලිම් ඇමතිවරු පවා අද ඒකට විරුද්ධත්වය ප්‍රකාශ කරලා යම් යම් නිවේදන නිකුත් කරලා තිබෙන එක අපි දැක්කා. ගරු සභාපතිතුමනි, ඒ දඹුල්ල මුස්ලිම් දේවස්ථානය විශේෂයෙන්ම අනවසර ඉදි කිරීමක් කියලා යම් යම් පුවත්පත්වල පළ වුණත්, එය 1963 දී එතැන පෞද්ගලික ඉඩමක ස්ථාපනය කරලා අවුරුදු ගණනාවක් තිස්සේ මුස්ලිම් දේවස්ථානයක් හැටියට පැවතුණු එකක්. මුස්ලිම් බැතිමතුන් ඒ ප්‍රදේශයට යන එන, වෙළඳාමට යන එන මුස්ලිම් බැතිමතුන් යාඥා කරපු දේවස්ථානයක්. ඒ වාගේම එය අපේ ලංකාවේ නීතිය අනුව, විශේෂයෙන්ම මුස්ලිම් පල්ලි, මුස්ලිම් දේවස්ථාන ලියාපදිංචි කරන්න තිබෙන වකුෆ් Board කියන ඒ ආයතනයේ නීත්‍යානුකූලව ලියාපදිංචි වුණු මුස්ලිම් දේවස්ථානයක්, එහෙම ලියාපදිංචි වුණු දේවස්ථානයක් තමයි පසුගිය සිකුරාදා යම් පිරිසක් එතැනට පැමිණ, ඒකට පහර දීලා, අලාභහානි කරලා ඒක නීති විරෝධී යැයි පැවසුවේ. ගරු සභාපතිතුමනි, මේ රටේ විශාල යුද්ධයක් කරලා, ඒ යුද්ධය වෙනුවෙන් විශාල වන්දි ගෙවලා, ඒ යුද්ධය අවසාන වෙලා අවුරුදු දෙකක, තුනක වාගේ කාලයක් ඇතුළත නැවත වතාවක් මෙන්න මේ වාගේ ක්‍රියාවන් මේ රටේ සිදු වෙනවා නම්, මේ රටේ අනාගතය

ගැන විශේෂයෙන්ම සුළු ජාතික මන්ත්‍රීවරයෙක් හැටියට මට නම් ඉතාම කනගාටුවක් හා කණස්සල්ලක් විතරක් නොවෙයි, රටේ අනාගතය ගැනත් මට යම් බියක් ඇති වෙනවා. විශේෂයෙන්ම මම මගේ ජීවිතයේ එදා ඒ සිකුරාදා දවසේ පහර දීම පිළිබඳ ඒ ආරංචිය ලැබෙන කොට මට ඉතාම කියන්න බැරි තරම් කනගාටුවක් හා දුකක් ඇති වුණා. ඒ මොකද අපේ ඉන්න සියලුම මන්ත්‍රීවරු හැටියට, අපි අදහන ආගම්වලට අපි සියලු දෙනාම ගරු කරනවා. ඒ වාගේම අපි අදහන ආගම අනුව ඒ ආගමික දේවස්ථානවලට කවුරුහරි හානි කරනවා නම් අපි සියලු දෙනාටම එක හා සමාන වේදනාවක් ඇති වෙනවා. ඒක තමයි මනුස්ස ස්වභාවය. මම හිතන්නේ එදා ඒ වේදනාව මේ රටේ ඉන්න සියලුම මුස්ලිම් ජනතාවට ඇති වුණා. නමුත් තිබෙන ප්‍රශ්නය තමයි මේ රටේ තිබෙන නීතිය, මේ රටේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ සියලු දේවල් අතට අරගෙන යම් පිරිසක් මේ විධියට මේ මහ දවල් පොලීසිය ඉදිරියේ, හමුදාව ඉදිරියේ ඇවිල්ලා පහර දෙන කොට ඒ ප්‍රදේශයේ නීතිය ක්‍රියාත්මක කරන්න බැරි වුණේ ඇයි කියන ප්‍රශ්නය මතු වෙනවා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශය නියෝජනය කරන ආණ්ඩුවේ ඇමතිතුමා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමාට. එතුමා මේ පිළිබඳව ඉතාම නිර්භීතව, අවංකව එතුමාගේ ප්‍රකාශය නිකුත් කරලා තිබෙනවා. අද මව්බිම පත්තරේ පවා එතුමා කියලා තිබුණා. මේ මුස්ලිම් පල්ලිය මගේ තාත්තා ඉන්න කාලේ ඉඳන්ම තිබෙන එකක්ය කියන එක මම දන්නවා කියන එක එතුමා නිර්භීතව අද මව්බිම පත්තරේ එතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. මම ඇත්තෙන්ම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුවේ නායකයෝ මේ පිළිබඳව මුනිවත රකිද්දී මේ ක්‍රියාදාමය හෙළා දකින්නේ නැතිව, මේවාට තවදුරටත් අපි මේ රටේ ඉඩ දෙනවාද කියන ප්‍රශ්නය පැන නැගිලා තිබෙන මොහොතකදී, ඒ ප්‍රදේශය නියෝජනය කරන ඇමතිවරයෙක් හැටියට එතුමා මේ පිළිබඳව නිර්භයව අදහස් ප්‍රකාශ කිරීම ගැන මම යම් දුරකට හරි සන්තෝෂ වෙනවා. අඩුම ගණනේ අපි වෙනුවෙන් මෙහෙම භය නැතිව කථා කරන්න හරි ඇමතිවරයෙක් ඉන්නවාය කියලා.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අද මේ රටේ මේ විධියට යම් පිරිසකට පුළුවන් නම් මේ රටේ නීතිය අතට අරගෙන කටයුතු කරන්න, මේ රටේ නීතිය අතට අරගෙන තමන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරන්න අපි මේ රටේ යම් පිරිසකට ඉඩ දෙනවා නම්, එහෙම නම් මේ රටේ අනාගතය ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පල්ලිය නීති විරෝධී එකක් නම්, ඒ පල්ලියත් එක්ක ගැටුම් තිබෙනවා නම්, ඒ පල්ලියේ වෙන වෙන ප්‍රශ්න තිබෙනවා නම් අපට උසාවියක් තිබෙනවා. අපට යම් යම් ක්‍රියාපටිපාටියන් තිබෙනවා. අපට පුළුවන් ඒවා ඉදිරියේ ගිහිල්ලා අපට කරුණු දක්වලා තීරණ ගන්න. එහෙම කිසිම තීරණයක් නැතිව මහා දවල්, ඒ දඹුල්ල ප්‍රදේශවාසීනුත් නොවෙයි. පිට ප්‍රදේශවලින් එතැනට පිරිස් ගෙනැල්ලා, පිට ප්‍රදේශවලින් ජනතාව සම්බන්ධ කරලා, ඒ ජනතාව එතැනට ගෙනැල්ලා මේ කරපු දේ ගැන මම ඉතාම දුක් වෙනවා. ආණ්ඩුව තවම මේ ගැන හෙළා දැක්කේ නැහැ. එහෙම නම් රජය මේක අනුමත කරනවාද? රජය මේ රටේ ජාතික සමගිය හදන්න යන්නේ පල්ලි කඩලා, සුළු ජාතික ජන කොටස් භය කරලා, මේ රටේ ඉන්න අන්තවාදී කොටස්වලට බලය අතට දීලාද මේ ජාතික සමගිය හදන්න යන්නේ. මොකක්ද මේ රජයේ ස්ථාවරය? මේ රජයේ ස්ථාවරය මේකද කියලා මේ ආණ්ඩුව පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අවසාන වශයෙන් මම මේ මව්බිමේ පත්තරේ කතුවැකිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒක සභාගත කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මේ කතුවැකිය මම සභාගත කරනවා.[1] මේ කතුවැකිය කියවන්න. මේක ඉතාම කාලෝචිත කතුවැකියක් මව්බිම පත්තරේ අද තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ආගමික සංහිඳියාව වෙනුවෙන් කටයුතු කිරීම කාරණාව පිළිබඳව -

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්‍ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ආණ්ඩුවේ නියෝජිතයා ඒකට ප්‍රකාශයක් කළා. ආසනයේ සංවිධායකවරයා ඒක හෙළා දැක්කා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආණ්ඩුව තිල ප්‍රකාශයක් කළේ නැහැ. ආණ්ඩුව කරන්න ඕනෑ. (බාධා කිරීම්) ඒක අනුමත කරනවාද නැද්ද කියලා කියන්න ඕනෑ.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් මතු කරන ලද ප්‍රශ්නයට අදාළව අපේ පක්ෂයේ ස්ථාවරය ප්‍රකාශ කරන්න තමයි මම ඔබතුමාගෙන් මේ වෙලාව ලබා ගත්තේ. අපි දන්නවා, අද අපි මේ පසු කරමින් ඉන්න මොහොත කියලා කියන්නේ, අවුරුදු 30 ක යුද්ධයක් ඉවර වෙලා, ඒ යුද්ධයේ භයානක ප්‍රතිඵල තවමත් අපි අත්විඳිමින් ඉන්න මොහොතක්. සිංහල, දෙමළ, මුස්ලිම් මේ සියලු දෙනා එහි ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටිනවා. ඒ බෙදුම්වාදී යුද්ධයට බලපෑම් කරන ලද හේතු අපි තවමත් අත්දැකීම් විධියට පාවිච්චි කරන්නේ නැහැයි කියන එක තමයි අපි දකිමින් තිබෙන්නේ. අපි දන්නවා, 1956 දී සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීමෙන්, ඒ වාගේම 1972 ජාතිකත්ව පදනමින් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීමෙන්, ඒ වාගේම 1983 කළු ජූලියෙන්, ඒ වාගේම ඡන්දවලදී සිංහල, දෙමළ භේදයක් නැතිව ජාතිවාදය පාවිච්චි කිරීමෙන් එහි අවසාන ප්‍රතිඵලය විධියට මතවාදීමය වශයෙන් තිබුණු බෙදීමක්, අවසානයේ ප්‍රචණ්ඩ යුද්ධයක් බවට පත් වුණා. මුල් අවස්ථාවේදී ඒ ඒ දේශපාලන ව්‍යාපාරයන්, ඒ ඒ ආණ්ඩු මේ ජාතිවාදය, බෙදුම්වාදය මත පදනම් වෙමින් පවතින ප්‍රචණ්ඩකාරී වාතාවරණය වළක්වන්න කටයුතු කළා නම් අපට මේ අවුරුදු 30 ක බෙදුම්වාදී යුද්ධයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි, තමුන්නාන්සේලා දන්නවා. අවසානයේ අපේ දහස් ගණන් සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ තරුණියන්ගේ ජීවිත විනාශ කරලා, දේපළ විනාශ වෙලා තමයි මේ යුද්ධය කෙළවර කරන්න සිද්ධ වුණේ. ඒ ඒ වෙලාවේදී ඒ ආණ්ඩුවල වගකීම තමයි එවැනි තැනකට, එවැනි ප්‍රචණ්ඩත්වයකට රට පත් වන එක වළක්වන එක. හැබැයි, ඒවාට ක්‍රියාමාර්ග ගත්තෙත් නැහැ. එය අත්දැකීමක් කර ගත්තෙත් නැහැ. ඒවායින් ගත්ත, උගත් පාඩමකුත් නැහැ. නැවත වතාවක් ආගම මත පදනම් වෙලා, ආගමික ගැටුමකට, ප්‍රචණ්ඩත්වයකට රට තල්ලු කරන්න ආණ්ඩුව ඉඩ දීලා කියන එක තමයි අපට පේන්නේ.

ඒ නිසා මේ දඹුල්ලේ ඇති වුණු සිද්ධිය සුළු කොට තකන්න බැහැ. දැන් මෙතුමා කථා කරන කොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ ප්‍රතිචාරයන් අපි දැක්කා. මේක එහෙම සුළුකොට තකන්න පුළුවන් එකක් නොවෙයි. මේකේ පල්ලිය පටන් ගත්තේ කවදාද? මේකට ඉඩ දුන්නේ කවදාද? කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. ජාතිවාදයෙන් බැට කාපු රටක් ආගමික ප්‍රචණ්ඩත්වයෙන් නැවත වතාවක් එතැනට යන්න හදනවා නම්, ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න ඕනෑ. අපට පෙනෙනවා දැන් මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ හරි ස්ථාවරයක් ඉදිරිපත් වෙන්නේ නැහැ. අගමැතිවරයා එකක් කියනවා. ජනක බණ්ඩාර ඇමතිවරයා තව එකක් කියනවා. අලෙවි මව්ලානා අපේ ආණ්ඩුකාරතුමා තව එකක් කියනවා. අර නැගෙනහිර පළාතේ ඉස්බුල්ලා ඇමතිතුමා තව එකක් කියනවා. ආණ්ඩුවේ ස්ථාවරයක් කියන්නේ නැහැ. මෙවැනි සුළු සුළු සීරීම් තමයි මහා තුවාල බවට පත් වෙලා, පිළිකා බවට පත් වෙලා අවසානයේ කකුල් අත පය කපලා දාන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ සුළු සීරීමට මුල් අවස්ථාවේම ප්‍රතිකාර සපයන්න ඕනෑ. (බාධා කිරීම්) ඒ නිසා අපි ඉල්ලන්නේ ජනාධිපතිතුමා, විශේෂයෙන් ජනාධිපතිතුමා මැදිහත් වෙලා තමන්ගේ ස්ථාවරය මේ වෙලාවේ ප්‍රකාශයට පත් කරන්න ඕනෑ. ආණ්ඩුවේ ඉන්න එක එක දේශපාලන පක්ෂ නොවෙයි. (බාධා කිරීම්) දැන් බොහෝ ප්‍රශ්නවලට ආණ්ඩුවේ උත්තරය තිබෙන්නේ - ආණ්ඩුව හැදිලා තිබෙන්නේ පක්ෂ ගණනාවකින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කරන්න එපා. බොහොම සුළු කාලයක් තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමන්ලාගේ ස්ථාවරය කියන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අපේ ස්ථාවරය තමයි කියන්නේ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කරන්න එපා. ඉතා සුළු කාලයක් තිබෙන්නේ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ආණ්ඩුව හැදිලා තිබෙන්නේ පක්ෂ ගණනාවකින්. ඒ නිසා මේ එක එක පක්ෂවල ස්ථාවරය කියන්න කියලා. නැහැ. මෙවැනි ප්‍රශ්නයක් අතීතයේ අත්දැකීම් පදනම් කර ගෙන ජනාධිපතිවරයා රටේ නායකයා විධියට මැදිහත් වෙලා ප්‍රකාශයක් කරන්න ඕනෑ, මේක විසඳන්න. ඒ නිසා අපේ ස්ථාවරය තමයි මෙවැනි ජාතිවාදී ආගම්වාදී මතවාද ගැටුම් බවට පත් වෙන්න නොදී වළක්වන එක. ආගමික සංහිඳියාව හදන එක. ජාතික සමගිය හදන එක. ජාතික සංහිඳියාව හදන එක. ඒක තමයි ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය. ඒක ආයිත් අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ නිසා නැවත වතාවක් එක පැත්තකින් අධිරාජ්‍යවාදීන්ට මැදිහත් වෙන්න, අනික් පැත්තෙන් ගත්තොත් එහෙම අද ආණ්ඩුව මුහුණ දීලා තිබෙන බඩු මිල ප්‍රශ්නය, උද්ධමන ප්‍රශ්නය වහ ගන්න මෙවැනි

ආගමික ගැටුම්වලට ඉඩ දෙනවාය කියන සැකයක් අපට තිබෙනවා. ඒ නිසා වහාම අපි ආණ්ඩුවෙන්, විශේෂයෙන්ම ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්නේ මේකට මැදිහත් වෙලා ආණ්ඩුවේ ස්ථාවරය කියන්න. මේ සුළු සිද්ධි වළක්වන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, ජාතික ප්‍රජාව අතර අවුළුවාලනු ලැබූ ජාතිවාදී ගිනිදැල් නිසා පුරා අවුරුදු 30 ක කාලයක් තිස්සේ අපි සියලු ජාතීන් පීඩාවට පත් වුණා. පසුව අපේ වත්මන් අතිගරු ජනාධිපතිතුමා මේ රටේ සාමය ස්ථාපනය කළා. සාමය ස්ථාපනය කරලා එතුමා ප්‍රකාශ කළා, මේ රටේ සුළු ජාතියක් නැහැයි කියලා. ජාතීන් දෙකයි තිබෙන්නේ. එකක් රටට ආදරය කරන ජාතිය. දෙවැනි එක රටට වින කරන ජාතිය. ඉතින් රටට ආදරය කරන ජාතියක් වශයෙන් සියලු දෙනා, සිංහල, මුස්ලිම්, දමිළ ජනතාව එකට සහෝදරත්වයෙන් ජීවත් වීමට අද රට තුළ විශාල ප්‍රබෝදයක් ඇති වෙලා තිබෙනවා. අද අපට ජාත්‍යන්තර කුමන්ත්‍රණ, බලවේග එන කොට, අපි දැක්කා ජිනීවා ප්‍රශ්නය එන කොට ලංකා ඉතිහාසයේ කවදාවත් නැති විධියකට මුස්ලිම් ජනතාවගේ විශාල පිබිදීමක් ආණ්ඩුව කෙරෙහි, රජය කෙරෙහි, රටේ නායකත්වය කෙරෙහි තිබුණා. හැම පල්ලියකම යාඥා කළා. හැම මුස්ලිම් ජනතාවක්ම කොළඹ වීදි ගණනේ ඇවිල්ලා ආණ්ඩුවට සහයෝගය පළ කළා. ඒ වාගේම විශේෂයෙන්ම දඹුල්ල පල්ලියේ පවා විශේෂ යාඥා කරලා, මේ ජිනීවා ප්‍රශ්නයේදී විශාල මැදිහත් වීමක් කළා. අන්න ඒ නිසා මම දකිනවා මුස්ලිම් ජනතාව කිසිමදාක නැති ආකර්ශණයක් තුළින් රටේ නායකත්වයත් එක්ක සබැඳියාවක්, සම්බන්ධයක් ගොනු වෙලා තිබෙනවා කියලා. එවන් මොහොතක, ඒ ජිනීවා ජාත්‍යන්තර ප්‍රශ්නයක් බවට පරිවර්තනය වන කොට මේ දේශීය මුස්ලිම් ජනතාවගේ අවදි වීම පිළිබඳව ජාත්‍යන්තර මුස්ලිම් ප්‍රජාව දැක්කා. දේශීය මුස්ලිම් ජනතාව තුළ විශේෂ කැක්කුමක් මේ ආණ්ඩුව කෙරෙහි තිබෙන එක, ඒ අවදි වීම ඒ ජාත්‍යන්තර මුස්ලිම් ප්‍රජාව දැක්කා. ඒ නිසා අපට ඡන්ද 15 ක් හම්බ වන කොට මුස්ලිම් රටවල් අටක් ලංකාවට සහයෝගය පළ කරලා, ඡන්දය ලබා දුන්නා. අන්න ඒ ඉලක්කය පරාජය කිරීමේ දැවැන්ත යටිකුට්ටු කුමන්ත්‍රණයක් අද NGO කුමන්ත්‍රණකාරයන්ගේ මේ ජාතිවාදී උත්තේජකයන් තුළ තිබෙනවා. අන්න ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඒ නිසා ඊළඟ ජිනීවා සැසිවාරය ආරම්භ වන කොට මේ මුස්ලිම් රටවල් අට, ලංකාවට මිත්‍රශීලී රටවල් අට විනාශ කිරීම සඳහා කරනු ලබන්නා වූ කුමන්ත්‍රණයක් වශයෙන් තමයි අපි මේක දකින්නේ. ඒ නිසා අපි NGO ඩොලර් කාක්කන්ගේ ජාතිවාදී කුමන්ත්‍රණකාරයන්ගේ මේ යටිකුට්ටු ක්‍රියාමාර්ග සමහර විට වෘත්තියක් ලෙසින් සිදු කෙරෙන මට්ටමට ජාතිවාදීන් පෙළඹීලා තිබෙනවාය කියන එක අපි මේ අවස්ථාවේදී ඉතාමත්ම ශෝකයෙන් ප්‍රකාශයක් කරන්න ඕනෑ. අපි මේ ක්‍රියාව සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් හෝ වේවා, විපක්ෂයේ තමුන්නාන්සේලා හෝ වේවා මෙවැනි ක්‍රියාදාමයන් අනුමත කරන්නේ නැහැ. (බාධා කිරීම්) අපි දැක්කා, පසුගිය සුමානේ නුවර එළිය පල්ලිය – මේ රටේ රාජ්‍ය නායකයෙක් ඉතිහාසයේ ප්‍රථම වතාවට ගිහිල්ලා පල්ලියක් විවෘත කළ ප්‍රථම අවස්ථාව. අන්න ඒ වාගේ රටක රාජ්‍ය නායකයෙක් ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට පල්ලියක් විවෘත කරලා සතියක් යන්නට පෙර, පල්ලියක් කඩා දැමීම කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් කියලා අපි මේ අවස්ථාවේදී කියනවා. ඒ කුමන්ත්‍රණය ආණ්ඩු විරෝධී ප්‍රතිගාමීන්ගේ කුමන්ත්‍රණයක්ය කියන එක මම මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. (බාධා කිරීම්) ඒ නිසා මේ ප්‍රතිගාමීන්ට ඕනෑ අද සියලු ජාතීන් අතර තිබෙන සමගිය විනාශ කරන්න. රටේ දේශපාලන නායකත්වය අස්ථාවර කරන්න. රට තුළ වාර්ගික අර්බුදයක් නිර්මාණය කරන්න. ජාතීන් අතර අසමගිය ඇති කරන්න. ඒ වාගේම රට තුළ නැවත වතාවක් ජාතීන් අතර සිවිල් යුද්ධයක් ඇති කරන්න අද මේ අන්තවාදීන්ට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා මම එක දෙයක් කියනවා. මුස්ලිම් ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේලා අවදියෙන් ඉන්න. මේ ජාත්‍යන්තර අන්තවාදීන්ට අහු වෙන්න එපා. මේ කුමන්ත්‍රණකාරයන්ට අහු වෙන්න එපා. අපි මේ ක්‍රියාකලාපය සම්පූර්ණයෙන්ම හෙළා දැකලා, මේ කරපු ක්‍රියාදාමයන්ට විරුද්ධව අපි නීතිය තුළ ඔවුන්ට දඬුවම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමුයි කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

(බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. සභාව විහිළුවක් කර ගන්න එපා. දඹුල්ලේ මුස්ලිම් පල්ලියකට බෞද්ධයන් විසින් ප්‍රහාරයක් එල්ල කරන ලදැයි යන චෝදනාව පිළිබඳව ගරු උදය ගම්මන්පිල අමාත්‍යතුමාට විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, බුදු රජාණන් වහන්සේ කාලාම සූත්‍රයේදී දේශනා කළේ, කෙනෙක් යමක් කිව්ව පමණින් විශ්වාසයට ගන්න එපා. කරුණු සොයා බලා එය සත්‍ය වන්නේ නම්, එය තාර්කික වන්නේ නම්, එය පිළිගත හැකි නම් පමණක් පිළිගන්නය කියලා. ගරු සභාපතිතුමනි, මම ඉංග්‍රීසි බසින් මුද්‍රිත කුරානය කියවලා තිබෙනවා. ඒ කුරානයේ කිසිම තැනක තිබුණේ නැහැ, කට කථා මත පදනම්ව කටයුතු කරන්න. කලබල වෙන්නය කියලා. ඒ නිසාම ගරු සභාපතිතුමනි, මේ කාරණය දැන ගත්තාම සියලු

වැඩ පසෙකලා මම දඹුල්ලට ගියා. මම රජමහා විහාරයේ මහා නායක ස්වාමීන් වහන්සේ හමු වුණා. ඒ වාගේම ප්‍රශ්නගත පල්ලියටත් මම ගියා. ඒ පහර දීමට ලක් වුණාය කියන පල්ලිය මම සම්පූර්ණයෙන්ම පරීක්ෂා කළා. මා පැමිණි ආරංචියට එතැනට රොක් වුණු මුස්ලිම් ජනතාවත් එක්ක මම පැයකට ආසන්න කාලයක් සාකච්ඡා කළා. ඊළඟට ප්‍රදේශයේ සිටින ප්‍රධාන රජයේ නිලධාරියා වන ප්‍රාදේශීය ලේකම්තුමියත් එක්ක මම

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල අමාත්‍යතුමා]

මේ ගැන සාකච්ඡා කළා. ඒ වාගේම මේ උද්ඝෝෂණයට සම්බන්ධ වුණු බෞද්ධ පිරිසත් එක්ක මම සාකච්ඡා කළා. ඒ නිසා මම හිතනවා, මේ ප්‍රශ්නය ගැන කථා කරන්න අවශ්‍ය දැනුමින් මම දැන් සන්නද්ධයි කියලා.

ගරු සභාපතිතුමනි, දඹුලු රජමහා විහාරයේ සහ ඒ අවට තිබෙන නින්දගම් ශාසනයට පැවරෙන්නේ මීට වසර 2100 කට කලින්. මේක ලංකාවේ තිබෙන පැරණිතම රජමහා විහාරයක්. රජමහා විහාරයට සම්බන්ධ රාජකාරීවල යෙදෙන පිරිස්වල භුක්තිය සඳහා - ආදි කාලයේ ගරු සභාපතිතුමනි, වැටුප් ගෙව්වේ නැහැ. භුක්තිය සඳහා ලබා දුන්න ඉඩම් රාජකාරී ඉඩම් ලෙස හැඳින්නුවා. මේ ඉඩම එවැනි රාජකාරී ඉඩමක්. 1962 වර්ෂයේ පන්සලෙන් මෙම ඉඩම මුස්ලිම් ජාතිකයෙකුට ව්‍යාපාරික ස්ථානයක් ඉදි කර ගන්න බද්දට දෙනවා. අද මහනුවර නගරයේ තිබෙන දෙමළ, මුස්ලිම් කඩ සියල්ලම වාගේ දළදා මාළිගාවට අයිති ඉඩම්. ඒ වාගේ මේ රජමහා විහාරයට අයිති ඉඩම බදු ලබා දෙනවා 1962 වර්ෂයේදී. මේ මුස්ලිම් ජාතිකයා තමන්ගේ වෙළඳ ව්‍යාපාරයට අමතරව එහි පිටුපසින් තමන්ගේ නිවස ඉදි කර ගන්නවා. නිවසේ කොටසක් මේ හජ්ජියාර් කෙනෙක්, හජ් වන්දනාවේ ගිය කෙනෙක්. ගෙයි කොටසක් ආගම අදහන්නත් වෙන් කර ගන්නවා.

ගරු සභාපතිතුමනි, මේ කාරණාව මේ විධියට සිද්ධ වන අතරේ 1981 මාර්තු මාසේ 17 වැනිදා රජමහා විහාරය අවට අක්කර 300 ක් පූජා භූමියක් විධියට එවකට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමති ආර්. ප්‍රේමදාස මැතිතුමා ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කරනවා. එය 1981 අප්‍රේල් 04 වැනිදා ගැසට් පත්‍රයේ තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ අක්කර 300 රජමහා විහාරයට අයත් ඉඩම්. මේ පූජා භූමිය සංවර්ධනය කිරීම සඳහා රජයට වියදම් දැරීමට පහසු වෙන්න මේ ඉඩම් රජයට අත්පත් කර ගන්නවා. ඒ ගැසට් නිවේදනයෙන් මේ තිබෙන ගොඩනැගිලි සියල්ල විස්තර කරනවා. මේ ගොඩනැගිල්ල වෙළඳ සැලක් මිස පල්ලියක් විධියට හඳුන්වාදීලා නැහැ. ගරු සභාපතිතුමනි, එහෙම නම් පල්ලිය ඇති වෙන්නේ කවදාද? මම එම ස්ථානයට ගිහින්, එතැන සිටි මුස්ලිම් ජාතිකයන් එක්ක කථා කළාම ඒ අය ලබා දුන්න තොරතුරු අනුව අර නිවස එක් පසෙකින් තිබෙනවා. නිවසට එහා පැත්තෙන් තිබෙන හිස් ඉඩමේ සෙවිලි තහඩු භාවිතා කරමින් 2009 වර්ෂයේ තාවකාලික ශාලාවක් ඉදි වෙනවා. මේ මුස්ලිම් ජාතිකයන් මට පැවසූ තොරතුරු අනුවම මේ ශාලාව ඉදි කරන්න - දැන් මේක රජයට පවරා ගත්ත ඉඩමක්. ප්‍රාදේශීය ලේකම්ගෙන් අවසර අරගෙන නැහැ. මේක නාගරික සංවර්ධන ප්‍රදේශයක් විධියට ගැසට් කරපු ඉඩමක්. නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර අරගෙන නැහැ. මුස්ලිම් ජාතිකයෙක් නගරාධිපති වෙලා සිටින නගර සභාවෙන් අවසර අරගෙන නැහැ. කිසිම කෙනෙකුගෙන් අවසර අරගෙන නැහැ. අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා එක් කරුණක් ඉතා නිවැරදිව ප්‍රකාශ කළා. පල්ලිය ඉදි කළාට පස්සේ මුස්ලිම් ආගමික සිද්ධස්ථානයක් විධියට මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම කරපු බව නම් ඒ අය අපට ප්‍රකාශ කරන්න යෙදුණා.

ගරු සභාපතිතුමනි පන්සලේ ඉඩම, පූජා නගරයක් කරන්නටයි එක්සත් ජාතික පක්ෂයේ හිටපු ජනාධිපතිතුමා ඉදිකිරීම් අමාත්‍යවරයා ලෙස කටයුතු කරන සමයේ පන්සලෙන් රජයට ගත්තේ. ගත්තේ, පූජා නගරයක් විධියට මේ ඓතිහාසික, වසර 2100 ක් පැරණි බෞද්ධ විහාරස්ථානයේ ප්‍රතිමූර්තිය වඩාත් ඉහළ නැංවීමට යයි ප්‍රකාශ කරමින්. රජයෙන් වන්දි නොලබා තමයි මේ අක්කර 300 රජයට ලබා දෙන්නේ. ඊට පස්සේ රජයේ අයිතිය යටතේ තිබෙද්දී පූජා භූමි කිසි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. එය ගැසට් පත්‍රයට සීමා වෙනවා. ඊට පස්සේ රජයේ අයිතිය යටතේ තිබෙද්දී 2009 දී මෙතැන පල්ලියක් ඉදි වෙනවා. පන්සලේ ඉඩමේ පල්ලියක් ඉදි වෙනවා. පන්සලේ කැමැත්තකින් තොරව. පන්සල දියුණු කරන්නට යයි ආණ්ඩුව ගත්ත ඉඩමේ මුස්ලිම් පල්ලියක් ඉදි වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙතැන කතෝලික බැතිමතුන් ඉන්නවා. ඉස්ලාම් බැතිමතුන් ඉන්නවා. හින්දු බැතිමතුන් ඉන්නවා. මොහොතකට හිතන්න. ඔබේ පල්ලියේ, ඔබේ කෝවිලේ පන්සලක් ඉදි කරනවා. ඔබේ කැමැත්තකින් තොරව. ඔබට එය කොහොම දැනෙයිද? දැන් පන්සලේ හාමුදුරුවන්ට මේ ගැන ක්‍රියා කරන්න බැහැ. පන්සලේ ඉඩම දැන් රජයේ ඉඩමක් වෙලා ඉවරයි. ඒ නිසා මේ අය රජයෙන් ඉල්ලා සිටියා. මේ සම්බන්ධයෙන් පළාතේ දේශපාලන බලධාරීන්ගෙන් ඉල්ලා සිටියා. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවුණු තැන තමයි මේ බෞද්ධ උද්ඝෝෂණය එන්නේ. නීතිය අතට අරන්. එහෙමයි අපේ සමහර ගරු මන්ත්‍රීවරු මේ කාරණය ගැන සඳහන් කළේ. මම එතැනට ගියාම එතැන සිටි පොලිස් නිලධාරීන්ට පොඩ්ඩක් ඈතට යන්නට කියලා, මුස්ලිම් අය මට කරපු සංග්‍රහය භුක්ති විඳිමින් මම ඒ අයගෙන් ඇහුවා ඔබට පොලීසියේ ආරක්ෂාව ලැබුණාද? ඔබේ ස්ථානයට මේ අය හානියක් කළාද? ඒ අය කිව්වා, පන්දාහක් විතර හිටියා සර්. ඒකෙන් දෙතුන් දෙනෙක් දොරවල් ඇරගෙන ඇතුළට ආවා. ඇවිල්ලා මෙන්න මෙතැන තිබෙන Water Dispenser එක, උණු වතුර සහ ඇල් වතුර එන ජල යන්ත්‍රය පෙරලුවා. ඒක කැඩිලා තිබෙනවා. ඒ ඇරෙන්න. මේ අපේ පූජකතුමා ආගම කියන පුටුව. මේක බිමට පෙරළලා මේකේ උඩ පතුරක් ගැලවිලා තිබෙනවා. වෙන නම් දෙයක් කැඩිලා නැහැ ඇමතිතුමා. ඊළඟට ඔය අයට ගහන්න කරන්න

මේ උද්සෝෂකයෝ උත්සාහ කළාද? නැහැ. මේ ප්‍රශ්නය ඇතිවෙද්දී පොලිස් නිලධාරීන් අපට කිව්වා, පොලිස් ආරක්ෂාව මැද ඕගොල්ලෝ එළියට යන්න කියලා. මේ උද්සෝෂකයෝ ඇවිල්ලා උද්සෝෂණය කරද්දී ශාලාව ඇතුළේ මුස්ලිම් ජාතිකයන් රැඳිලා හිටියා. ඒ අය පොලිස් ආරක්ෂාව ඇතිව එළියට යනවා. කිසිම කෙනෙක් ඒ අයට පහර දෙන්න උත්සාහ කළේ නැහැයි කියලා ඒ අය ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කතා කරන්නේ කොළඹ ඉඳන් මාධ්‍යවල වාර්තා වුණු දේවල් උපුටා දක්වමින් නොවෙයි. දඹුල්ලට ගිහිල්ලා ඒ ජනතාවත් එක්ක කථා කරලා, සිද්ධිය වුණු තැන ඉඳලා ලබා ගත් තොරතුරු මත. ගරු සභාපතිතුමනි, කවුරුවත් නීතිය අතට ගන්නවා නම් ඒක වැරදියි. බෞද්ධයෙක් වේවා, ඉස්ලාම් භක්තිකයෙක් වේවා තමන්ගේ ආගම නීතිය අතට ගැනීමට කිසිම ආවරණයක් නොවෙයි. එවැනි දෙයක් කවුරු කළත් අපි හෙළා දකිනවා. කවුද මෙතැන නීතිය අතට අරන් තිබෙන්නේ. තමන්ගේ ඉඩමේ පල්ලියක් හැදීම ගැන විරුද්ධ වන භික්ෂූන් වහන්සේලාද? අනවසරයෙන් මුස්ලිම් පල්ලියක් ඉදි කරපු පිරිසද? කවුද ආගමික සමඟියට හානි කරලා තිබෙන්නේ. පන්සල් භූමියේ, පූජා භූමියක් ලෙස රටේ නීතියෙන් ගැසට් කරපු භූමියේ පල්ලියක් ඉදි කරන අයද? එයට විරෝධය දක්වන අයද? ගරු සභාපතිතුමනි, අනුරාධපුරයේ මෙවැනි පල්ලියක් ඉදි කරලා තිබුණා. නීති විරෝධීයි. අධිකරණ නියෝගයක් අරන් තිබුණා මෙය ඉවත් කරන්නය කියලා. ඉවත් කළේ නැහැ. අවසානයේ මහා ගැටුමක් වුණා.

අපි ජාතික සමඟිය ගැන ඉතා ගෞරවයෙන් කතා කරනවා. අපේ මුස්ලිම් සහෝදරවරුන් අපි දැක්කා ජිනීවා අර්බුදය ඇති වුණු වෙලාවේ අපි සිංහල, දෙමළ, මුල්ලිම්, හින්දු, බෞද්ධ, කතෝලික, ඉස්ලාම් නොවෙයි අපි ශ්‍රී ලාංකිකයන් කියන හැඟීමෙන් මුස්ලිම් ආගමික නායකයන්ගේ නායකත්වයෙන් පාරට බැස්ස හැටි. මේක අපේ මව්බිම. මේ මව්බිමට විරුද්ධව එද්දී අපි එකමුතුව නැඟී සිටිය යුතුයි කියන හඬ මුස්ලිම් ජාතිකයන් තුළින් ආවා. අපේ ප්‍රණාමය ඒ සඳහා පුද කරනවා. ඒ ජාතික හැඟීම අපේ ජීවිතය තිබෙන තුරාවට අපි අමතක කරන්නේ නැහැ. ඒ වාගේම දෙමළ ජනතාවත් එක්ක දීර්ඝ කාලීන ප්‍රශ්නයක ගැටිලා ආයිත් මුස්ලිම් ජනතාවත් එක්කත් ප්‍රශ්නයකට මේ රට තල්ලු වෙනවාය කියලා කවුරු හරි හිතනවා නම් ඒක භයානක තත්ත්වයක්. එවැනි ප්‍රවණතා සඳහා අපි අනිවාර්යයෙන්ම තිත තැබිය යුතුයි. ඒ විතරක් නොවෙයි ශ්‍රී ලංකාවේ අනාගතයට මුස්ලිම් රාජ්‍යයන්ගේ සහාය තීරණාත්මකයි. ජිනීවාවලදී මුස්ලිම් රටවල් අපිත් එක්ක එකට හිටියා. අපි ඒක ආදරයෙන් සිහිපත් කරනවා. හෙටත් මේ අයගේ සහයෝගය අපට අවශ්‍යයි. ඒක අපි කවදාවත් අමතක කරන්නේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අපි මේ ඉන්න අසරණ තත්ත්වය දැකලා, මේ අසරණ භාවයම පාවිච්චි කරලා, අපට උදව් වුණු බව සිහිපත් කරලා කවුරු හරි මේ රටේ නීතිය අතට ගන්න හදනවා නම් එයට අපට එකඟ වෙන්න බැහැ. රටේ නීතිය බෞද්ධයන් අතට ගත්තත් වැරදියි. ඉස්ලාම් භක්තිකයන් අතට ගත්තත් වැරදියි. කතෝලිකයන් අතට ගත්තත් වැරදියි. වැරැද්ද, කවුරු කළත් වැරැද්ද වැරැද්දමයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ රටේ ආගමික සමඟිය රැකෙන්න නම් තනි අතින් අත්පුඩි ගහන්න විධියක් නැහැ. අපි අත් ඔක්කොම එකට එකතු කළොත් විතරයි ජාතියේ එකමුතු භාවයේ රාවය මුළු ලෝකයටම ඇහෙන්න සද්ද නගා පෙන්වන්න පුළුවන් වෙන්නේ. එහෙම නම් මේ කථා කරන ජාතික සමඟිය රැකෙන්න නම් අද වෙලා තිබෙන ලොකුම බාධාව තමයි විවිධ අය, විවිධ ආගමික කණ්ඩායම් නීතිය අතට අරගෙන, තමන් සමාජයේ ජාත්‍යන්තර වශයෙන් ගොඩ නගා ගෙන තිබෙන බලය අතට අරගෙන ඒවාට කටයුතු කරන්න උත්සාහ කිරීම. ඒ නිසා කවුරු හරි ජාතික සමඟිය ගැන කථා කරනවා නම් අංක එකට රටේ නීතියට ගරු කළ යුතුයි. හොරකම් කිරීම, බලහත්කාරකම් කිරීම නතර කළ යුතුයි. එහෙම වුණොත් අපට මේ ආගමික සමඟිය ගැන දේශන පවත්වමින්, වාද විවාද කරමින් කාලය නාස්ති කරන්න වෙන්නේ නැහැයි කියලා සිහිපත් කරමින්, යුක්තියට යටත්ව ජාතික, ආගමික සමඟිය ගොඩ නැඟිය යුතුය. නීතියට යටත්ව එය සිදු කළ යුතුය කියන එක සිහිපත් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, පසුගියදා ජනතා ඡන්දයෙන් කුණු කූඩයට විසි වුණු, ජනතාවගේ පා පහරට ලක් වුණු කරුණානිධි විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉතා සැහැසි ජාතිවාදී ප්‍රකාශයක් කරනු ලැබූ බව අපි කවුරුත් දන්නවා. ශ්‍රී ලංකාව තුළ ද්‍රවිඩ ඊළාම් රාජ්‍යයක් ගොඩ නැඟීම සඳහා ජනමත විචාරණයකට යා යුතුය කියන ඒ ජාතිවාදී ප්‍රකාශය ඔහු විසින් කරනු ලැබුවා. ඒ විතරක් නොවෙයි. ඊට පෙරද ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබුවා ඔහුගේ එකම සිහිනය ශ්‍රී ලංකාව තුළ ඊළාම් රාජ්‍යයක් නිර්මාණය වීම දැකීමයි කියලා. ඕනෑම පුද්ගලයෙකුට සිහින දැකීමේ අයිතියක් තිබෙනවා. නමුත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එවැනි සිහිනයක් දැකීම හෝ එවැනි ජාතිවාදී සැහැසි ප්‍රකාශයක් කිරීම සඳහා කිසිදු සදාචාරාත්මක අයිතියක් කරුණානිධි මහත්තයාට නැහැ. අපි කවුරුත් දන්නවා. බටහිර කුළී සේනාංකයක් වූ L.T.T.E. සංවිධානය තිස් වසරක් පුරා මේ රට තුළ ගෙන ගිය ඒ බෙදුම්වාදී යුද්ධය විසින් ඉල්ලා සිටියේ, අන් කිසිවක් නොවෙයි. 10 වන සියවසේ අග භාගයේ සහ 11 වන සියවසේ මුල් භාගයේ වසර 77 ක් පමණ කාලයක් උතුරු - නැගෙනහිර ඇතුළු විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු "ඊළාම් මණ්ඩලම්" නමැති ඒ සොළී අධිරාජ්‍යයේ නවවැනි ප්‍රාන්තය නිර්මාණය කිරීම සඳහා තමයි ඒ බෙදුම්වාදී අරගලය L.T.T.E. සංවිධානය විසින් ගෙන ගියේ. මේ රටේ දැය හිතකාමී ජනතාවගේ, වීරෝධාර රණවිරුවන්ගේ ජීවිත පූජාව මතින් සහ අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නිවැරදි දේශපාලන නායකත්වයේ ප්‍රතිඵලයක් හැටියට ඒ ප්‍රතිගාමී, ඒ කුමන්ත්‍රණකාරී යුද්ධය තීරණාත්මකව පරාජයට

පත් කරන්න පුළුවන්කම ලැබුණා. මේක ජාතියේ වාසනාවක්. දේශයේ වාසනාවක්.

ගරු සභාපතිතුමනි, ඒ ඊළාම් බෙදුම්වාදී යුද්ධය තීරණාත්මකව පරාජයට පත් කරනු ලැබුවද අපි දන්නවා, විවිධ ස්වරූපයන්ගෙන් නැවත නැවතත් මේ බෙදුම්වාදය රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වූ කුමන්ත්‍රණ දියත් කෙරෙන බව. පසුගිය දවස්වල ජිනීවා නාඩගම හමුවේ රහ දක්වනු ලැබුවේත්

[ ගරු සුගත් මතුගමගේ]

ඒකේ එක අවස්ථාවක්. මෙවැනි කුමන්ත්‍රණ තව තවත් ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒ සඳහා වන එක ප්‍රකාශයක් හැටියට තමයි අපි දකින්නේ, මේ කරුණානිධි මහතා විසින් කරනු ලබන මේ ප්‍රකාශය. තීරණාත්මකව පරාජයට පත් කරන ලද ඒ බෙදුම්වාදය නැවතත් රට තුළ පෝෂණය කරන්නට කරුණානිධිලා ගෙන යන මේ නින්දනීය, ම්ලේච්ඡ මැදිහත්වීම් තරයේ ප්‍රතික්ෂේප කළ යුතුයි. මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපේ ගෞරවය හිමි වෙන්නට ඕනෑ. පසුගිය දවස්වල ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරු රැස් වෙලා මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රකාශයක් කළා. එහිදී අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා අභිමානයෙන් යුක්තව ප්‍රකාශයක් කළා. ශ්‍රී ලංකාවේ දෙමළ රාජ්‍යයක් නිර්මාණය කිරීම සඳහා සිහින දකින කරුණානිධිට හොඳ පිළිතුරක් දෙනවා එතුමා. එතුමා කියනවා, කෝටි පහකට අධික දෙමළ ජනතාවක් ඉන්න තමිල්නාඩුව තමයි මේ සඳහා වඩාත්ම සුදුසු. ඒ නිසා ලංකාවට ඊළමක් යෝජනා කරනවා වෙනුවට, තමිල්නාඩුවේ ඊළාම් රාජ්‍යයක් පිහිටුවා ගන්නය කියන නිර්භීත ප්‍රකාශය එතුමා විසින් කරනු ලැබුවා. අන්න ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ වාගේම ආරක්ෂක ලේකම්තුමා මේ සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙනුත් අපේ ගෞරවනීය ප්‍රණාමය පුද කරමින්, ශ්‍රී ලංකාවට එරෙහිව මෙවැනි ප්‍රකාශයන් සිදු කිරීම සම්බන්ධයෙන් සමස්ත ලාංකීය ජනතාව වෙනුවෙන් අපගේ විරෝධය නැවත නැවතත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, විශේෂ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව සලසා දීම ගැන පළමුවෙන්ම ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා දඹුල්ල පූජා ස්ථානය ගැන වචන ස්වල්පයක් කථා කරලා මෙතැනින් නැගිටලා ගියා. මට හරි දුකයි. ඇමතිතුමා මෙතැනින් ගිය එක ගැන. ඇත්ත වශයෙන්ම මේ පූජා ස්ථානය ගැන උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා දන්නෙත් නැහැ. එතුමා දැන ගත්තේ පෙරෙයිදා එතැනට ගිහිල්ලා බලලා තමයි. මේක 1963 දී. දඹුල්ලේ පූජා ස්ථානය ගැන මම දන්නවා. මම එතැන ගනුදෙනු කරන්නේ අවුරුදු පනහකට පමණ පෙර සිට. 1963 බිහි වුණු මුස්ලිම් පල්ලියක් මෙය. අද ඊයේ නොවෙයි. 1986 තමයි මේක පූජා ස්ථානයක් විධියට ගැසට් කරලා තිබෙන්නේ. මම අහන්නේ ගරු සභාපතිතුමනි, අවුරුදු 49 ක් මුස්ලිම් ජනතාව ඒ පැත්තෙන් දඹුල්ලට යන අයට, යාපනය, වවුනියා යන අයට එතැන ඉඳලා ආගම කියලා, වැඳලා යන්න තිබුණු ස්ථානයක්. අවුරුදු 49 ක්. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා හරි ඒගොල්ලන්ගේ වටේ හිටිය කට්ටිය තමයි මේවා දැන ගත්තේ නැත්තේ. ජිනීවා ප්‍රශ්නය ඉවර වෙලා තවම මාසයක්වත් නැහැ. තවම මේ ආණ්ඩුවල එක ප්‍රශ්නයක් ඉවර කර ගත්තෙත් නැහැ. එක ප්‍රශ්නයක් ඉවර කරන කොට තව ප්‍රශ්නයක් ඇදලා දානවා. මම අහන්නේ, 1963 දී ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රකාශය පරිදි පූජක ස්ථාන විදුලි බිලෙන් 25% යි ගෙවන්න ඕනෑ. ලංකාවේ හැම තැනම පූජක ස්ථාන රෙජිස්ට්‍රර් කළා 25% යි විදුලි බිල ගෙවන්න ඕනෑ කියලා. අවුරුදු 30 කට කලින් ලංකා විදුලි බල මණ්ඩලයෙන් මේක පූජා ස්ථානයක් කියලා 25% යි මේකට අය කරන්නේ. දඹුල්ල නගර සභාවෙන්, ප්‍රාදේශීය සභාවෙන් මේක පූජක ස්ථානයක් කියලා 1965 ඉඳලා තඹ සතයක්වත් ඒකට බද්දක් අය කරන්නේ නැහැ. ඉතින් එතකල් අපේ ගරුතර ස්වාමීන් වහන්සේලා මොනවාද කර කර හිටියේ? මගේ සහෝදර අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා දැන් මෙතැනින් කථා කරලා ගියා. මේක කුමන්ත්‍රණකාරී වැඩක් කියලා. ඇත්තටම ඒ මුස්ලිම් මන්ත්‍රීතුමා කථා කරපු කථාවෙන්ම තේරුණා මේක ආණ්ඩුවේ සැලැස්මක් කියලා. හිස්බුල්ලා මන්ත්‍රීතුමා කථා කරනවා මේ පූජක ස්ථානය මෙතැනින් වෙනත් තැනකට අරන් යන්න ඕනෑය කියලා. මේක ඇත්තටම අර ගරුතර ස්වාමීන් වහන්සේගේ කථාවෙන් කිව්වා මේක පටන් ගන්නේ දඹුල්ලෙන්. මේක පළමුවැනි එක. මේක අපි ලංකාව වටේටම - උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාගේ කථාවේදී දැන් කිව්වා, මහනුවර කථාවක්. අපි දැන් මේකට භය වෙන්න ඕනෑ. හෙට බස්නාහිර පළාත් සභාවටත් මේ වාගේ ප්‍රශ්නයක් මතු වෙනවා. මෙතැන මුස්ලිම් මන්ත්‍රීවරු 10 දෙනෙක් ඉන්නවා. මම හිතනවා, වැඩි හරියක් අපේ මුස්ලිම්, බෞද්ධ, කතෝලික, හින්දු හැම කෙනාම මේක හෙළා දකිනවා. මට කාලය ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"2012.04.03 දින එළඹුණු සභා සම්මුතියට අනුව අද දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2012.05.22 වන දින පෙ.ව 9.30 ට රැස්විය යුතු අතර, 2012.05.08 වන දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අද දවසේ මම මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්නේ මොන රීතිය යටතේද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය තමයි සභාපතිතුමා හැටියට ඔබතුමා අද උදේම ප්‍රකාශ කළා, මේ සභාව හැටියට සභාව ගත්ත සභා තීන්දු ක්‍රියාත්මක කරන්න කියලා අදාළ අමාත්‍යාංශවලට භාර දීලා තිබෙනවා කියලා. ඒ වාගේ අපි විවිධ කාරක සභාවල ගත්ත තීන්දු, නිගමනයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ අදාළ ආයතනවලට භාර දීලා තිබෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, සභාවක් විදියට අපට ගැලවෙන්න හරි ලේසියි ඒකෙන්. දැන් සාකච්ඡා කළා. දැන් මට මතකයි අර කෘෂිකර්ම අමාත්‍යතුමාට, ඒ වාගේම සලෝචන ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අර පළාත් පාලන මන්ත්‍රීවරුන් ගැන. මම අහන්නේ මේ සභාව අදාළ අමාත්‍යාංශයට මේ යෝජනාව ඇරලා - මේ සභාව විධියට ඒ යෝජනාව එහාට ගියා. ගියාට පස්සේ මොකද වෙන්නේ කියන පසුවිපරමක් මේ පළාත් සභාව තුළ තිබෙනවාය කියලා මම නම් දකින්නේ නැහැ. මේක පෙත්සම් කාරක සභාවටත් අදාළයි. මිනිස්සු බොහොම බලාපොරොත්තු ඇතිව තමයි මේ පෙත්සම් කාරක සභාවලට එන්නේ. සමහර වුද්තයෝ මේ පෙත්සම් කාරක සභා හැල්ලුවට ලක් කරනවා. ඒ නිසා මම කියන්නේ, මේවා ගන්න පුළුවන්. පළාත් පාලන ආයතන අදාළ ආයතනවලට කියලා මේ සම්බන්ධව නීති මගින් කටයුතු කරන්න විශාල බලපෑම් - පළාත් පාලන ආයතනයක් සම්බන්ධව මමම දාපු පෙත්සමකට ඒ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා, නිලධාරීන් සියලු දෙනා මෙතැනට ඇවිල්ලා තීන්දු අරගෙන ගියාට පස්සේ, අදාළ පෙත්සම්කරු ගියාම කියනවා, මෙහෙන් ලියුම ගිහිල්ලා නැති නිසා තවම අපට ක්‍රියාත්මක කරන්න බැහැයි කියලා. ඉතින් මම දන්නේ නැහැ කොහේද මේ අඩුපාඩුව තිබෙන්නේ කියලා. මම කියන්නේ, අපි සභාවක් විධියට ගන්න තීන්දු තීරණ - මේ සභාව ශක්තිමත් වෙන්න නම් මේවා මීට වඩා ක්‍රියාශීලීව පත් විය යුතුයි. නැත්නම් මේ පළාත් සභාවේ කාර්ය භාරය දවසින් දවස හැල්ලුවට පත් වෙනවාය කියන එක තමයි ගරු සභාපතිතුමනි, මට මතක් කරන්න තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ ගැන ගන්න තීන්දු පසු විපරමක් කරමින් ඉස්සරහාට තල්ලු කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය පිළිබඳව අපි ඉදිරියේදී පසුවිපරමක් කිරීම විතරක් නොවෙයි අපි අදාළ අමාත්‍යවරයා සමඟ සම්බන්ධ වෙමින් ඒ ගැන පියවරක් ගන්නවා.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."* යැයි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2011 වර්ෂය
AMENDMENTS TO LIMITATIONS OF PROVINCIAL COUNCIL ADVANCE ACCOUNTS - YEAR 2011

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා** [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2011 නමැති උප ලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමාවන් සංශෝධනය කිරීමේදී, 2010 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලැබී ඇති හෙයින්ද,*

*එම උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි."* යන යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් ඉදිරිපත් කරපු එම සංශෝධන යෝජනාව පිළිබඳව සාකච්ඡාව ආරම්භ කිරීමට අපට අවස්ථාව තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපේ සභා කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 12002 වැය ශීර්ෂය යටතේ උපරිම හර සීමාව කියලා මෙතැන තිබෙනවා, රුපියල් 15,488,000 ක්. ඊට පස්සේ අවම බැර සීමාව කියලා තිබෙනවා රුපියල් 14,588,000 ක්. ඊට පස්සේ හර ශේෂයේ උපරිම සීමාව කියලා තිබෙනවා විසි හතර ලක්ෂයක්. ඒ අනුව අපට මෙතැන පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා ගරු සභාපතිතුමනි. මේ 2011 වසරේදී මේ මූල්‍ය ප්‍රතිපාදනය - මේකෙන් කියන්නේ මධ්‍යම රජයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය

ප්‍රමාණයන්ගෙන් බීජ ලබා ගැනීමට අසීරු වීම නිසා පිරිවැටුම පහත වැටීම හේතුවෙන් විකුණුම් ආදායම පහත වැටී ඇත කියලා. මීට කලින් නම් මේ වාගේ දෙයක් අමාත්‍ය මණ්ඩලය අනුමත කර ගෙන ප්‍රධාන ලේකම්ට යැව්වාම මේ සභාවට ගෙනැල්ලා ආපහු දාන්න අවශ්‍යතාවයක් නැහැ. දැන් මේක 2011 එකක්. දැන් 2011 එකක් ගේනවා 2012 වර්ෂයේ හතර වන මාසයේ. මේ පිළිබඳව අපට පොඩි අපැහැදිලිතාවයක් තිබෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යයි කියන එක මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, විශාල මුදල් ප්‍රමාණයක් මේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, 2010 අංක 07 දරණ විසර්ජන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රකාරව සහ ඒ අවස්ථාවේ මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය නිර්දේශ කරලා තිබෙන්නේ, සභාවේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කරන්න කියන යෝජනාවයි. ඒ අනුව තමයි මෙම ලේඛනය සභාවට ඉදිරිපත් වෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමා, දැන් මේක 2011 එකක්. එතකොට මීට කලින් කැබිනට් අනුමැතිය අරගෙන ප්‍රධාන ලේකම්ට ගියාම ඒවා ගෙවනවා. දැන් ආපහු මේක සභාවේ අනුමැතියට යටත්ව කියන කොට - දැන් මේක 2011. අද 2012 හතර වන මාසය.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මේ සංශෝධනවලට අනුමැතිය ඉල්ලන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි. මේ සංශෝධනවලට අනුමැතිය ගන්න මේක අලුත් ක්‍රමවේදයක්. මේක අපට පැහැදිලි කිරීමක් අවශ්‍යයි කියන එක තමයි මම නම් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ, ඔබතුමා සභා කටයුතු කාරක සභාව නියෝජනය කරන්නේ නැහැ. එදා එම කාරක සභාවට අපේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) - එතුමා සම්බන්ධ වුණා. එතුමා මේ කාරණය පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. මොකද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යම් යම් අවස්ථාවලදී යම් යම් බීජ ගැනීමේදී ප්‍රමාදවීම් නිසා එදා තිබුණු පිරිවැටුමට විකිණීමේදී, එම අමාත්‍යාංශයට පොඩි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසයි මේ ප්‍රශ්නය මෙපමණ උපරිම බැර සීමාවක් සඳහන් වෙලා තිබෙන්නේ. අනික් හැම කාරණාවක්ම එහෙම තමයි. තව තිබෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කළුතර. ඒ ගෙවීම් සම්බන්ධවත් එම ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මම හිතන්නේ මේ පිළිබඳව සභා කටයුතු කාරක සභාවට එදා නම් ඒ ගැන පැහැදිලි කිරීමක් කළා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අරන් ප්‍රධාන ලේකම් අනුමත කළාම ඒක දෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

2010 අංක 07 දරණ විසර්ජන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ දාන්න ඕනෑ.

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Consequently, question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.34 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspened untill 11.34 a.m. and then resumed.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I

## නොමිලේ අධ්‍යාපනය ලැබිය හැකි පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම
COMMENCING A PRE-CHILDHOOD DEVELOPMENT CENTERS PROJECT TO FACILITATE FREE EDUCATION

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයන්හි මූලික ශික්ෂණය නොලබා පාසලට ඇතුළත් වීමත්, එමෙන්ම දරුවන්ගේ පෝෂණ තත්ත්වය අඩු මට්ටමක පැවතීමත් හේතුවෙන් දුප්පත් දූ දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය පහළ මට්ටමක පැවතීමේ ප්‍රවනතාවක් ඇත. මේ සඳහා මූලිකවම බලපා ඇත්තේ දෙමාපියන්ගේ නොසැලකිලිමත්කම හා පවුලේ ආදායම ශක්තිමත් නොවීමයි.*

*සියලු පළාත් පාලන ආයතන හරහා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ පෝෂණ තත්ත්වය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළක් සමඟ නොමිලේ මූලික අධ්‍යාපනය ලැබිය හැකි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් බස්නාහිර පළාත් සභාව තුළින් ආරම්භ කරන ලෙස ද, එය දිවයිනේ සියලුම පළාත් පාලන ආයතන මට්ටමින් පොදු තීරණයක් ලෙස ගෙන ක්‍රියාත්මක කරන මෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිය යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි."*

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief  Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

[ පූ.භා. 11.36 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, අද මේ දරුවන් හෙට රටේ අනාගතය භාර ගැනීමට පුරෝගාමී වනු ඇත.  ඒ නිසා මෙම දූ දරුවන් සාරධර්ම පිරි යහපත් ආකල්පයන්ගෙන් හෙබි රටට ආදරය කරන පිරිසක් ඇති කිරීමේ මූලික අඩිතාලම වන්නේ පූර්ව ළමා වියයි.  එවැනි ශක්තිමත් අඩිතාලමක් ලබා දීම වැඩිහිටියන් ලෙස අපගේ වගකීම මෙන්ම යුතුකමද වන්නේය.  පූර්ව ළමා වියෙහි පුංචි සිත් සතන් තුළ රෝපණය වන යහපත් ආකල්ප, සිරිත් විරිත් හා සොබාදහමට ආදරය කිරීම එම දරුවා වැඩිහිටි තත්ත්වයට පත් වී මරණ මංචකය දක්වාම රැගෙන යනු ඇත.

ඉතින් මම මේ සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරන්න විශේෂයෙන්ම හේතු වුණේ.  මොකද, මම ඇත්තටම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට සිටින කාලයේ මෙවැනි ව්‍යාපෘතියක් සිදු කළා.  විශේෂයෙන්ම මම දැකපු දෙයක් තිබුණා මේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව තුළ කරපු සේවය නිසා.  ඒ සේවයත් එක්ක බස්නාහිර පළාත තුළ ඒ සේවය යමක් කරයි කියන බලාපොරොත්තුව උඩ තමයි අපව පළාත් සභාවට එව්වේ.  ඉතින් ඒ නිසා තමයි අපි බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව තුළ ඉතා සාර්ථකව වැඩ පිළිවෙළක් අරන් ගියා.  මේ අඩු ආදායම්ලාභී දරුවන්ට මේ පූර්ව ළමා විය, නැත්නම් පෙර පාසල් පද්ධතියක් ඇති කරලා, ඒ අඩු ආදායම්ලාභී දරුවන් වෙනුවෙන් යමක් කරන්න.  ඒකට හේතු ගණනාවක් තිබුණා.  ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඒකට හේතු වුණේ. එකක් තමයි විශේෂයෙන්ම බැලුවාම බණ්ඩාරගම ආසනය කියන්නේ, බණ්ඩාරගම ඇරුණාම, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශය වන කොට දුෂ්කරතාවය වැඩියි.  එහි ගොඩක් දුරට දුප්පත් ජනතාව ඉන්නේ.  වැලි ගොඩ දාලා, ඒ වාගේම කිරි කපලා ජීවත් වන ජනතාවක් වැඩිපුර ඉන්නවා.  කම්කරු වෘත්තියේ සිටින විශාල පිරිසක් ඉන්නවා.  මේකත් එක්ක බැලුවාම අපි දැකපු දෙයක් තිබුණා.  අපට මේ තුළ විශේෂයෙන්ම පෙර පාසලට නොගිහිල්ලා පාසලට යන දරුවන් ප්‍රමාණය වැඩි වීමක් තිබුණා.  මේක බැලුවාම ඒ සම අධ්‍යාපනය ඒ දරුවාට ලැබෙන්නේ නැහැ. මොකද, පෙර පාසලට දරුවකු ගිහිල්ලා, අනික් දරුවා පෙර පාසලට නොගිහිල්ලා ඒ පාසලට ඇතුළත් වුණාට පස්සේ මේ දරුවෝ දෙදෙනාගේ පොඩි වෙනසක් තිබෙනවා.  අපි සොයලා බැලුවා මේකට හේතුව මොකක්ද කියලා.  පෙර පාසලට නොයන්න හේතු අතරින් එකක් තමයි.  අපි දැක්කා සමහර පෙර පාසල් තිබෙනවා, පැහැදිලිවම ඒ ගුරුවරුන් ඉතා අවංකව වේතනයක් නොලබා කරන පෙර පාසල් තිබුණා.  සමහර පෙර පාසල් තිබෙනවා අධික මුදල් උපයා ගන්න මේ පෙර පාසල් පද්ධති ඇති කර ගෙන යනවා.  මේක ව්‍යාපාරයක් කර ගෙන තිබුණා.  පළාත් පාලන ආයතනය හැටියට මේ පෙර පාසල්වලට නොයන දුප්පත් දරුවන්ට පෙර පාසලක් ඇති කිරීම සඳහා තමයි අපි කටයුතු කළේ.  මේකේදී අපි දැකපු දෙයක් තිබුණා.  ගොඩක් වෙලාවට අපට කියපු දෙයක් තමයි මන්ද පෝෂණ තත්ත්වයේ හිටපු සමහර දරුවන් හිටියා.  මේ දරුවන්ට අපට යමක් කරන්න ඕනෑකම තිබුණා.  ඒ නිසා තමයි අඩු ආදායම්ලාභීන්ගෙන් මේක පටන් ගත්තේ.  එතකොට පළාත් පාලන ආයතනයට අඩු ආදායම්ලාභී දරුවෝ සියලු දෙනා පළාත් පාලන ආයතනයට එනවා.  අපි හොඳ පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දෙන්න වැඩ පිළිවෙළක් හැදුවා.  ඒ වැඩ පිළිවෙළ තුළින් ඒ දරුවන්ගේ පෝෂණ තත්ත්වය නගා සිටෙව්වා.  ඒකත් එක්කම පෙර පාසලට නොයන සියලු දරුවන්ව පෙර පාසලට යවන වැඩ පිළිවෙළක් හැදුවා. ඒ වැඩ පිළිවෙළ මම ඉල්ලා සිටින්නේ, මෙම බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කරලා, ඒ වාගේම රජයෙන් ඉල්ලා සිටින්නය කියලා මේ සියලුම පළාත් පාලන ආයතනවල මේක පිහිටුවන්න කියලා.  අඩු ආදායම්ලාභීන්ට. එතකොට අර පුද්ගලික පෙර පාසල්වලටත් ගැටළුවක් වෙන්නේ නැහැ.  මොකද, පුද්ගලික පෙර පාසල්වලට මුදල් නොගෙවන අය තමයි අපි ගන්නේ.  පෙර පාසලට නොයන අයව තමයි අපි ගන්නේ.  එතකොට පුද්ගලික පෙර පාසල්වලටත් මේක ගැටළුවක් වෙන්නේ නැහැ.

මෙහිදී ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගොඩනැගිල්ලට විතරයි අපෙන් ගියේ.  අපේ ගුරුවරයාට අපි දීමනාවක් දුන්නා. අනික් එක පෝෂ්‍යදායී ආහාර වේලක්, ඇඳුම් පැලඳුම් මේ සියල්ලම ලබා දුන්නේ ජනතාව.  මේක පළාත් පාලන ආයතනයට හරි ලස්සනට කරන්න පුළුවන් වැඩක්.  මගේ අතේ තිබෙනවා ඒ ව්‍යාපෘති වාර්තාව.  මම ව්‍යාපෘති වාර්තාවත් මගේ කථාවෙන් පස්සේ සභාගත කරනවා.[2]  මේකේ සම්පූර්ණයෙන්ම තිබෙනවා.  අපි කොහොමද ජනතාවත් එක්ක එකතු වෙලා, රජයේ මුදල් නැතිව පළාත් පාලන ආයතනයේ අපි, මේක කළේ කියලා. මේ පෙර පාසල් පද්ධතිය තුළින් අපි දැකපු දෙයක් තිබුණා. ගරු සභාපතිතුමනි, සියලුම දරුවන්ට සමාන අධ්‍යාපනය

---

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ලැබෙන ක්‍රමයක් පෙර පාසල් තුළ තිබුණා.  ඒ වාගේම සියලු දරුවන් පෙර පාසලකට යවන මට්ටමකට අපි ගෙනාවා. ඒ වාගේම හොඳ පෝෂ්‍යදායී ආහාර වේලක් මේ දරුවන්ට දුන්නා. ඒ වාගේම මේක තුළ පෙර පාසලේ දරුවන්ට විතරක් නොවෙයි, දෙමව්පියන්ට ඉතිරි කරන්න ඒගොල්ලන්ව ඒ පැත්තට නැඹුරු කළා.  ඒ කියන්නේ අපි පෙර පාසලේ සියලු දෙනාට ගිණුමක් ආරම්භ කරලා, ඒකේ පෙර පාසල අවුරුදු දෙක අවසන් වන කොට ඒ පෙර පාසලෙන් ඉවත් වෙලා යන කොට රු. 10,000 ක ගිණුමක් ඇතිව තමයි අපේ පෙර පාසලකින් දරුවකු ඉවත් වෙලා යන්නේ.  මෙන්න මේ විධියේ වැඩ පිළිවෙළකට අපි ගියා.  ඒක ඒ දෙමව්පියන්ට ලොකු උපකාරයක් වුණා. කවදාහරි ඒ දරුවා උසස් අධ්‍යාපනයක් කරන කොට.  ගරු සභාපතිතුමනි, ඒ ගිණුම

[ ගරු ලලිත් එල්ලාවල ]

ප්‍රයෝජනයට ගන්න පුළුවන් තත්ත්වයට ගෙනාවා. මොකද, දුප්පත් පවුල්වලින් ආපු අය හැටියට අපි දන්නවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මේක හැදින්වූයේ, - අපේ ප්‍රදේශවල ගත්තාම විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ වැඩිපුර රබර් වගාව තිබෙනවා.  රබර් වගාව වර්ෂා කාලයේ මාස දෙක තුනක් එක දිගට වැස්සාට පස්සේ ඒ දෙමව්පියන්ට, ඒ දරුවන්ට අධ්‍යාපනය දී ගන්න බැරි මට්ටමක් එනවා.  මොකද, එක දිගට වහින්න ගියාම.  කිරි කපන අයට.  වැලි ගොඩ දාන අයට.  ඉතින් මේකත් එක්ක මෙන්න මේ වාගේ අසරණ අයට තමයි මේක ගොඩක් ප්‍රයෝජනවත් වෙන්නේ.  ඉතින් මේ තුළින් ලොකු වැඩ පිළිවෙළකට ගියා.  ඉතින් මේකත් එක්කම අපි දැකපු දෙයක් තිබුණා.  මේක පළාත් සභාවත් පළාත් පාලන ආයතන සමඟ ඒකාබද්ධ වෙලා - මෙහි අපට ගැටළු වගයක් ආවා.ගුරුවරුයා අනුමත කර ගන්න ගියාම අපට ලොකු ගැටලු ආවා.  පළාත් සභාව මැදිහත් වෙලා පළාත් පාලන ආයතනයට ඒ ගුරුවරයාව අනුමත කරලා දෙනවා නම්, මෙන්න මේ කාර්යය ඉතාමත් සාර්ථක කර ගන්න  පුළුවන්කම ලැබෙනවා.  ඒ විතරක් නොවෙයි. අපි දැකපු දෙයක් තිබුණා.  අපට මතකයි අපි පළාත් පාලන ආයතනයේ ඉන්න විට රටවල් ගණනාවක් අපේ  මේ ව්‍යාපෘති බලන්න ආවා.  ඒ විදේශ රටවල්වලින් බලන්න ආවා. අපි සතුටු වෙනවා.  ඒ අය අපිත් එක්ක සාකච්ඡා කරලා මේ වනවිට මදුරාවල ප්‍රදේශයේ මදුරාවල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අද විශාල පරිමාණයේ පෙර පාසල් ගොඩනැගිල්ලක් හදන්න කටයුතු කර ගෙන යනවා.  විදේශ රටවල්වලින් ඇවිල්ලා මේක දැකලා මෙය ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම මේ අවුරුද්දේ හොරණ ප්‍රාදේශීය සභා බල සීමාව තුළත් ක්‍රියාත්මක කරන්න කටයුතු කර ගෙන යනවා.  මේ වැඩපිළිවෙළත් එක්ක මේ වාගේ අය ගොඩාක් මැදිහත් වෙනවා.

ගරු සභාපතිතුමනි,  මම ඊළඟට දැකපු දේ තමයි අද පළාත් සභා මන්ත්‍රීවරුන්ට පවා රුපියල් පහළොස් දහසක පමණ මුදලක් තමයි පෙර පාසලකට යොදන්න පුළුවන්කම තියෙන්නේ.  ඒ නිසා මම ගරු සභාපතිතුමා හරහා ගරු ප්‍රධාන  අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මන්ත්‍රීවරයෙකුට රුපියල් පහළොස් දහසක් කියන්නේ, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා වාගේ කබඩ් එකක් අරන් දුන්නොත් රුපියල් 11,000/- ක් 12,000 /- විතර වෙනවා.  ඒ නිසා මම ඉල්ලා සිටින්නේ  මන්ත්‍රීවරුන්ට පෙර පාසලකට දෙන්න පුළුවන් ප්‍රමාණය අඩු ගණනේ රුපියල් 30,000/- ක් වත් කරන්න ඕනෑ කියලා.  මෙන්න මේ වාගේ පහසුකම් ටිකක් අපේ පළාත් සභාව තුළින් ඉටු කරලා දුන්නොත් හොඳ පෙර පාසල් පද්ධතියක් අඩුආදායම්ලාභී දරුවනට ඇති කරන්න පුළුවන් හැකියාව ලැබෙනවා.  ඒ වාගේම මෙන්න මේ තත්ත්වය අපි තේරුම් අරගෙන අපි කටයුතු කරන්න ඕනෑ.  එහෙම කටයුතු කළොත් ගරු සභාපතිතුමනි, ඉතාමත් සාර්ථකව හොඳ පෙර පාසල් පද්ධතියක් බස්නාහිර  පළාත තුළ ආරම්භ කරන්න පුළුවන්කම ලැබෙනවා.  ඒ වාගේම සියලුම අඩු ආදායම්ලාභී දරුවන්ට, පෙර පාසල් නොයන දරුවන්ට පෙර පාසලක් හිමි වෙනවා. ඒ වාගේම මේ තුළ හොඳ පෝෂ්‍යදායී ආහාර වේලක් ඒ දරුවකුට දීලා යම් මන්දපෝෂණ තත්ත්වයක් තිබෙනවා නම් ඒ තත්ත්වය මග හරවා ගන්නත් පුළුවන් වෙනවා. සමහර පළාත් පාලන ආයතන දැක්කාම ගරු සභාපතිතුමනි, අද කරන්නේ පළාත් පාලන ආයතන  විෂය තුළ දේවල් නොවෙයි. මේ පෙර පාසල් කියන්නේ, පැහැදිලිවම  පළාත් පාලන ආයතනයේ විෂයයක්.  ඉතින් මේ පෙර පාසල් මේවා පැත්තකට තියලා,  අද ගොඩාක් දුරට සමහර පළාත් පාලන ආයතන අපි දැකලා තියෙනවා ගොඩාක් වේලාවට තමන්ගේ  විෂයට බාහිර දේවල් තමයි කරන්නේ.  මේ පළාත් පාලන ආයතන තමන්ගේ විෂය පථයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩි පහක් තියෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මේ පළාත් පාලන ආයතන තුළ පැහැදිලිවම තමන්ගේ විෂය පථයට තමන් වැඩ කරනවා නම් මේ කටයුත්ත කෙරෙනවා.  ගොඩාක් වෙලාවට අපි දැකලා තියෙනවා අද පළාත් පාලන ආයතනවල මුදල්, පළාත් පාලන ආයතන විෂයෙන් පිට කරුණු සඳහා මුදල් යොදවන නාස්තිවෙන වැඩ පිළිවෙලවල් තියෙනවා.  මම කියන්නේ මෙන්න මේවායි පළාත් පාලන ආයතන තුළින් කරන්න ඕනෑ.  ඒ නිසා මම ඉල්ලා සිටිනවා.  අපි ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි දැකපු දෙයක් තිබුණා.  පළාත් පාලන ආයතනවල අපේ ගරු විපක්ෂ නායකතුමාත් එක්ක මාත් එකඟ වෙනවා.  එතුමා කිව්වා අපි යෝජනා ඉදිරිපත් කරනවා.  මේ යෝජනා ඉදිරිපත් කළාට පස්සේ එහි පසු විපරමක් වෙන්න ඕනෑ කියලා. අපි යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ඒවාට තවම අපට සාර්ථක පිළිතුරු නැහැ.  ඉතින් ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ.  මේ අපි ඉදිරිපත් කරලා මේ තියෙන යෝජනා පිළිබඳව පසුවිපරමක් කරන්න.  මේ වෙනුවෙන් කවුරු හරි නිලධාරියෙක් පත් කරලා අපි ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කරන්න වැඩපිළිවෙළක්

කරන්නය කියලා. ගොඩාක් වෙලාවට අපි මේ යෝජනා ඉදිරිපත් කළාම මාස ගණනක් බලා ඉඳලා තමයි යෝජනාව සභාවට එන්නේ. ඒකත් එක්කම ලොකු වියදමක් අපි කරනවා. ඒකත් එක්කම මේ යෝජනා අපි සම්මත කරලා ක්‍රියාත්මක වුණේ නැත්නම් අපි කරන කථාවල, කාලය නාස්ති කරන එක, මේ අපේ මුදල් සියල්ල අපතේ යනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මෙන්න මේවාට මූලිකත්වය දීලා අපි ඉදිරිපත් කරන යෝජනා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළකට යන්න කියලා. මේ පෙර පාසල් පද්ධතිය බස්නාහිර පළාත තුළත්, මුළු රටේම ඇති කරන්නත් පුළුවන් වැඩ පිළිවෙළකට යන්න කියලා ඉල්ලීම කරමින්, ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ පූ.භා. 11.48 ]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම හිතනවා රටේ පාලකයින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යමත් රට කරන්න යද්දී අධ්‍යාපනය නැත්නම් උගත්කම මේ රටේ සංවර්ධනය කරන්න පුළුවන් නම් අර කියන විධියට ශ්‍රී ලංකාව ලෝකයේම ආශ්චර්ය රට කරන්න පුළුවන්. නමුත් වර්තමානය වන විට අපි දකිනවා, පෙර පාසලේ සිට විශ්ව විද්‍යාලය දක්වාම අධ්‍යාපනය කඩා වැටෙමින් පවතිනවා කියලා. අධ්‍යාපනය මෙලෙස කඩා වැටෙමින් පවතින වේලාවේ අපේ ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා පෙර පාසල හරි හදන්න යෝජනා කිරීම ගැන නැත්නම් පෙර පාසලෙන් හරි පටන් අරගෙන මේ අධ්‍යාපන නගා සිටුවීමේ කර්තව්‍යයට එක්වීම ගැන ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම පෙර පාසල ගැන කථා කළොත් පෙර පාසල කියන්නේ අපේ ජීවිතයේ සුවිශේෂී සන්ධිස්ථානයක්. මොකද, චූටි දරුවෙක් අම්මාගේ තාත්තාගේ හුරතලයට ඉඳලා නැත්නම් සීයාත්, ආච්චිත් එක්ක සෙල්ලම් කර කර ඉඳලා අධ්‍යාපන ගමනකට යන පළමුවැනි පියවර තමයි පෙර පාසල කියන්නේ. විශේෂයෙන්ම ලංකාවේ සිටින දෙමව්පියන්ගේ බලාපොරොත්තුව තියෙන්නේ තමුන්ගේ දරුවාට හොඳට උගන්වන්න. තමුන්ගේ දරුවා උගතෙක් කරන්න තමයි ලංකාවේ දෙමව්පියන්ගේ ඕනෑකම තියෙන්නේ. ඉතින් මේ උගතෙක් කරන්න යන ගමනෙදි පෙර පාසල කියන්නේ ජීවිතයේ අත්තිවාරම. ඒ උගතෙක් කරන්න යන ගමනේදී අත්තිවාරම තමයි පෙර පාසල කියන්නේ. එහෙම නම් පෙර පාසල ගැන අවධානය යොමු කිරීම මම හිතනවා විශේෂයෙන්ම වැදගත් වෙනවා. ඒ වාගේම ලංකාවේ අය උගත් අය බිහි කරන්න ලැහැස්ති වෙනවා වාගේම මම හිතනවා, ඊටත් වඩා විශේෂ වශයෙන් බස්නාහිර පළාතේ සිටින දෙමව්පියෝ තමන්ගේ දරුවා උගතෙක් කරන්න යන ගමන තුළ විශේෂත්වයක් ගන්නවා කියලා. හැබැයි වර්තමානයේ උගතෙක් කරන්න යන ගමන පෙර පාසලෙන් ඇරඹුවාට අපි දකිනවා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේම මේ පිළිබඳව යම් ප්‍රශ්නයක් තියෙනවා. දෙමව්පියෝ මේ උගත්කම කියන එක දන්නේ නැතුව පෙර පාසලට යොමු කරනවා අපි දැකලා තියෙනවා. මොකද, උගත්කම කියලා කියන්නේ, ගරු සභාපතිතුමනි, දැනුම, ආකල්ප, කුසලතා. මේ තුනේම එකතුව තමයි උගතෙක් කියන දේ කියන්නේ. අද අධ්‍යාපන ආයතනවලින් පේන්නේ දැනුම තියෙන පුද්ගලයන් බිහි කරන සමාජයක් නිර්මාණය කරනවා විතරයි. බොහෝ විට පෙර පාසලකට යැව්වත් දෙමව්පියෝ ගිහිල්ලා පෙර පාසල් ගුරුවරයාගෙන් අහන්නේ මගේ ළමයාට වක්කරේ ඉගැන්නුවාද? මගේ ළමයාට අකුරු ඉගැන්නුවාද? කියලා තමයි පෙර පාසලේ ගුරුවරයාගෙන් ගිහිල්ලා අහන්නේ. නමුත් පෙර පාසල කියන්නේ අකුරු උගන්වන ස්ථානයක් නොවෙයි. වක්කරේ පාඩම් කරන ස්ථානයක් නොවෙයි. පෙර පාසල කියන්නේ පාසල් අධ්‍යාපනයට යන ගමනේදී ඒ ගමනට මුහුණ දෙන්න ශක්තිමත් කරන ස්ථානයක්.

විශේෂයෙන්ම පෙර පාසල ගැන කථා කරන විට ගරු සභාපතිතුමනි, ඉතාලි ජාතික මාරියා මොන්ටිසෝරි මහත්මිය මතක් කළ යුතුයි. වෛද්‍ය මාරියා මොන්ටිසෝරි මහත්මිය තමයි මේ පෙර පාසල පළමුවෙන්ම ආරම්භ කළේ. මොකද, ඉතාලි රජය විශේෂ ආබාධිත පුද්ගලයන් සමාජගත කිරීමේ ක්‍රියාවක් වශයෙන් තමයි දරුවන් කිහිප දෙනෙක් වෛද්‍ය මාරියා මොන්ටිසෝරි මහත්මියට භාර දීලා තියෙන්නේ. ඒ විශේෂ ආබාධිත දරුවෝ සාර්ථකව සමාජගත වීම නිසා තමයි පෙර පාසල කියන එක ආරම්භ වෙලා මේක පූර්ව පාසල් අධ්‍යාපන ක්‍රියාවලියක් ලෙස වර්ධනය වී තිබෙන්නේ. පාසල් අධ්‍යාපනය සඳහා යන දරුවන්ට, පාසලට යන්න ඉස්සරවෙලා විශේෂ සුදුසුකම් මින් ලබා ගන්න, එහෙම නැත්නම් ඒකට හැසිරෙන්න, සැරසෙන්න විධියක් තමයි පෙර පාසල නිර්මාණය වුණේ. නමුත් අද වන විට පෙර පාසල තවත් ඉස්කෝලයක් බවට පත් වෙනවා. අපි කොපමණ පෙර පාසල් හැදුවත් වැඩක් නැහැ ගරු සභාපතිතුමනි, මේක තවත් ඉස්කෝලයක් වෙනවා නම්. මේක තවත් දැනුම දෙන ස්ථානයක් වෙනවා නම් ඒක වඩක් නැහැ. එහෙම නම් මම හිතනවා, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකතු කරන්න, මේ පෙර පාසල් හදනවා විතරක් වැඩක් නැහැ. මේ දෙමව්පියන්ට පෙර පාසලේ තියෙන දේ මොකක්ද? කියන එකත් විශේෂයෙන්ම දැනුවත් කරන්න වෙනවා. මම එහෙම කියන්න හේතුව, අද පෙර පාසලේ විතරක් නොවෙයි. පාසලත් උත්සාහ කරන්නේ සහතික එකතු කරන සමාජයක් ගොඩනැගීම. නැත්නම් දැනුම ගොඩ නගන සමාජයක් විතරක් ගොඩ නැගීම. අධ්‍යාපන බලධාරීන් දරුවෙකුගේ මනින්නේ දැනුම. නමුත් කුසලතාවය, ආකල්ප මනිනවා අපි දකින්නේ නැහැ. ශිෂ්‍යත්ව විභාගය පාස් වීමෙන් ලබන්නේ දැනුම. නමුත් ඒවා කුසලතාවය, ආකල්ප කියලා අපට කියන්න බැහැ.

නමුත් අපි අද සමාජයේ තියෙන දේවල්වලිනුත් දකිනවා කොපමණ උගත් අය බිහි වුණත් කොපමණ දැනුම තියෙන පුද්ගලයෝ බිහි වුණත් සමාජයේ අපරාධ රැල්ල නම් අඩු වෙලා

නැහැ. කොපමණ ඉස්කෝල හැදුවත්, කොපමණ ජාත්‍යන්තර පාසල් බිහි වුණත්, කොපමණ විශ්ව විද්‍යාල හැදුවත්, පෞද්ගලික විශ්ව විද්‍යාල හැදුවත් එන්න එන්නම රටේ අපරාධ රැල්ල නම් වැඩි වේගෙන යනවා. එහෙම නම් අධ්‍යාපනයේ යම් වැරැද්දක් තියෙනවා. අර මම කිව්වා වාගේ මට දැනෙන විදිය නම්, අධ්‍යාපනය කිව්වාම කුසලතාවය, ආකල්ප කියන එක අධ්‍යාපනයෙන් බැහැර කරලා දැනුම විතරක් දෙන සමාජයක් නිර්මාණය කරන්න අධ්‍යාපනය පෙළ ගැහිලා තියෙනවා. මේ අවස්ථාව බොහෝ විට අපේ ශ්‍රී ලංකාවේ දෙමව්පියන්ගේ පිපාසයක් තියෙනවා, අපේ දෙමව්පියන්ගේ ඕනෑකමක් තියෙනවා, මගේ දරුවා උගතෙක් කරන්න ඕනෑය කියන එක. එතකොට මේකේ මිම්ම, නැත්නම් මේ පිපාසය දැන ගෙන බොහෝ විට

[ ගරු අජිත් මාන්නප්පෙරුම ]

ව්‍යාපාරිකයෝ ලැහැස්ති වෙලා තියෙනවා ටියුෂන් කඩ දාන්න. එහෙම නැත්නම් International පෙර පාසල් ඇති කරලා නමින් වෙනස් කරලා දෙමව්පියන්ව රවට්ටන්න. මේ වාගේ විවිධ රැවටිලි රැල්ලකට ගිහිල්ලා අර දෙමව්පියන්ට උගතෙක් බිහි කරනවා වෙනුවට දැනුම තියෙන පුද්ගලයෙක් බිහි කරන තත්ත්වයට පත් වෙලා තියෙනවා. මේ දැනුම විතරක් තියෙන සමාජය බැලුවාම දැනුම තියෙන මිනිස්සුන්ගේ රටවල් අතුරින් ලෝකයේ හත්වැනියාට අද අපේ රට පත් වෙලා තියෙනවා. නමුත් තවමත් දියුණු වෙමින් පවතින රට. දියුණු වෙලා නැහැ. අපට වඩා දැනුම අඩු රටවල් සීඝ්‍ර දියුණුවක් ලබලා තියෙනවා, අපි දැකලා තියෙනවා. දැනුම නැතිවුණාට උගත්කම ලැබිලා තියෙනවා. නමුත් අපට වෙලා තියෙන්නේ සහතික ලබා ගන්න සමාජයක්. නැත්නම් දැනුම හොයා ගන්න සමාජයක් බවට පත් වෙන්න. දැනුමේ කුසලතාවය, ආකල්ප නොමැති නිසා මේ දැනුම රට වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්න එහෙම නැත්නම් අප වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්න මේ දැනුම තියෙන පුද්ගලයාට නොහැකි වෙලා තියෙනවා. ඉතින් ඒ නිසා මම හිතනවා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වාගේම මේකට එකතු වෙන්න ඕනෑ, දෙමව්පියන්ව දැනුවත් කිරීමේ ක්‍රියාවලියක්. මේ දෙමව්පියන්ට පෙර පාසල මොකක්ද? අධ්‍යාපන කියන දේ මොකක්ද? එහෙම නැත්නම් නිසි ප්‍රතිමිකරණයකට කොහොමද මේක ගෙනියන්නේ කියලා විශේෂයෙන්ම හඳුනා දෙන්න ඕනෑ වෙලා තියෙනවා.

බොහෝ පෙර පාසල්වල ගුරුවරයා මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි පෙර පාසල් තිබුණාට දෙමව්පියෝ ඇවිල්ලා අහන්නේ, මගේ ළමයාට චක්කරේ පුළුවන්ද? නැත්නම් ටියුෂන් පන්ති යවන ළමයි ඉන්නවා. වර්තමානයේ පෙර පාසලට දරුවා යවලා පෙර පාසලේ චක්කරේ උගන්වන්නේ නැහැ කියලා ටියුෂන් පන්ති යවන මොන්ටිසෝරි දරුවෝ ඉන්නවා. අන්න ඒ තරමට අධ්‍යාපනය කඩා වැටිලා තියෙනවා. මේ අධ්‍යාපනය තුළින් අපි බලාපොරොත්තු වන සමාජයට වැඩදායී පුද්ගලයන් නිර්මාණය කරන්න බැරි වෙලා තියෙනවා. මේකට මම හිතන්නේ විශේෂම හේතුව ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේ අධ්‍යාපනය ව්‍යාපාරිකයන් විසින් ඩැහැ ගෙන තියෙන සමාජයක් නිර්මාණය වෙලා තියෙනවා. ඒ නිසා මම හිතනවා, පළාත් සභාවක් වශයෙන් අපි පෙර පාසලේ ඉඳන්ම අපේ අත යොමු කරලා මේ ව්‍යාපාරිකයන් අධ්‍යාපනය උදුරා ගැනීම නවත්වන්නේ කොහොමද? නිවැරදි අධ්‍යාපනයක් සමාජය දැනුවත් කරන්නේ කොහොමද කියන තැනට අපට විශේෂයෙන්ම යන්න වෙනවා. එහෙම නම් මම හිතනවා විවිධ නම් දාන කොට ජාත්‍යන්තර පෙර පාසලක් කියලා කියන කොට මොකක්ද? ජාත්‍යන්තර කියන එකේ ප්‍රමිතියක් තියෙන්න ඕනෑ. එහෙම නැත්නම් පෙර පාසලේ උගන්වන නිර්දේශය මොකක්ද කියන ප්‍රමිතියක් අප තුළ තියෙන්න ඕනෑ. අපි දකිනවා, අර මම කලින් කිව්වා වාගේ පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල දක්වා වූ අර්බුද. අපේ රටේ අධ්‍යාපනය කඩාකප්පල් වෙලා පල්ලෙහාට වැටෙනවා. අපට ලෝකයේ ආශ්චර්ය වෙන්න පුළුවන්. ආසියාවේ නොවෙයි. ලෝකයේම ආශ්චර්ය වෙන්න පුළුවන්, උගත් අය මේ රටින් අපනයනය කරන රටක් බවට පත් කළොත්. උගත්කම විකුණන්න පුළුවන් රටක් බවට පත් වුණොත් මම හිතනවා ලෝකයේම උගතුන් බිහි කරන රට ශ්‍රී ලංකාව වන එක නවත්වන්න විධියක් නැහැ.

එහෙම නම් ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අවධානය යොමු කරනවා. මම හිතනවා, පෙර පාසල් අපි හැදුවා කියලා - සමහර පළාත් පාලන ආයතනවලින් පෙර පාසල් හදනවා. හැදුවාට ඒකට ප්‍රමිතියක් නැහැ. ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා වාගේ එතුමා මේ අධ්‍යාපනය ගැන විශේෂ අවධානයක් යොමු කරන නිසා එතුමාගේ ප්‍රාදේශීය සභාවේ එදා හොඳ පෙර පාසලක් තියෙන්න ඇති. නමුත් සමස්තයක් දිහා බැලුවාම නමට පෙර පාසල් පවත්වා ගෙන යන පළාත් පාලන ආයතන තියෙනවා. එහෙම නම් පෙර පාසල් ඇති කරන්න ඕනෑ. පෙර පාසල් අවශ්‍යයි. හැබැයි ඒක ආදර්ශවත් පෙර පාසලක් වෙන්න ඕනෑ. එහෙමනම් පළාත් පාලන ආයතනයට අපි කියන්න ඕනෑ, මේ පෙර පාසලේ දරුවෙකු වෙනුවෙන් මෙපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න ඕනෑය කියලා. නමුත් නමට පෙර පාසලක් වෙලා වැඩක් නැහැ. පෙර පාසල් දරුවෙකු වෙනුවෙන් එම පළාත් පාලන ආයතනය අදාළ මුදල වියදම් කරන්න ඕනෑ. මොකද, අපේ බලාපොරොත්තුව උගත් පුද්ගලයන් බිහි කිරීම. නමුත් ඒ උගත් පුද්ගලයෙක් බිහි කරන්න යන ගමනේදී නමට පෙර පාසලක් දාලා - ජාත්‍යන්තර පෙර පාසල කියලා නම දැම්මොත් හෝ ගාලා දෙමව්පියෝ එනවා. නමුත් කරන්නේ මොනවාද කියලා දන්නේ නැහැ. මොකද, පෙර පාසල කියන්නේ තවත් විශේෂත්වයක් ගන්න ස්ථානයක්. අනික් ඉස්කෝලෙකට යන දරුවා අම්මාට ඇවිත් කියනවා. තාත්තාට ඇවිත් කියනවා. තාත්තේ ඉස්කෝලේ උගන්වන්නේ නැහැ. මාව වෙන ඉස්කෝලෙකට දාන්න. තාත්තේ මේ ටියුෂන් පන්තිය හරි නැහැ. මාව වෙන ටියුෂන් පන්තියකට දාන්න කියලා දරුවාට කියන්න හැකියාවක් තියෙනවා. නමුත් පෙර පාසල් යන දරුවාට ඒ හැකියාව නැහැ. අම්මා හරි තාත්තා හරි යවන ඉස්කෝලෙට මිසක් දරුවාට පෙර පාසල තෝරා ගැනීමේ හැකියාවක් නැහැ.

එහෙම නම් වැඩිහිටියෝ වශයෙන් පෙර පාසල ගැන අපි මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑය කියන එක ඇත්තටම පිළිගන්නවා. මොකද, ශ්‍රී ලංකාව උගතුන්ගෙන් බබළවන්න පුළුවන් රටක්. අපට තියෙන විශේෂත්වය අපේ රටේ උගත් පුද්ගලයන් බිහි කිරීම කියන එක නිසා අපි පළාත් සභාව වශයෙන්, මහ ආණ්ඩුව වශයෙන්, රජයක් වශයෙන් හෝ වේවා අධ්‍යාපනය ගැන උනන්දු වන විට පෙර පාසල ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑය කියලා කියනවා. හැබැයි අපි දැක්කා, පහුගිය දවස්වල බස්නාහිර පළාත් සභාව පෙර පාසල් ගුරුවරුන්ව ලියාපදිංචිය පටන් ගත්තා. එතැන්දි අපි දැක්කා අවුරුදු 20 ක්, 30 ක් පෙර පාසල් කරලා ගණන් පාස් කරපු නැති Teacher කෙනෙක් පෙර පාසලේ මූලිකයා වුණාම ඒක ලියාපදිංචි කර ගත්තේ නැති අයුරක්. නමුත් අර අලුත් අධ්‍යාපන ඇමතිතුමාගේ කථාවලදී මම අහලා තියෙනවා, නැටුම් උගන්වන කෙනාට ගණන් ඕනෑ නැහැ කියලා. නටන්න දන්නවා නම් පහයි පහයි දහයයි කියන්න එයා ඕනෑ නැහැ. එයා නැටුමට ඕනෑ දේ කිව්වාම ඇති කියලා. නමුත් එතැනත් අර්බුදයක් නිර්මාණය වුණා, බස්නාහිර පළාත් සභාව තුළින්. ප්‍රඥප්තිය හදන එක හොඳයි. ඒ ලියාපදිංචි කිරීම හොඳයි. පෙර පාසල ගැන අවධානය යොමු කිරීම හොඳයි. හැබැයි, අපි ප්‍රඥප්ති හදන්නේ, ලියාපදිංචි කරන්නේ සාර්ථකව කර ගෙන ආපු ව්‍යාපාර බිමට වට්ටන්න නොවෙයි. ඒකට තවත් රුකුලක් වෙන්නයි අපි ප්‍රඥප්ති හදන්නේ. නමුත් අපි දැක්කා පහුගිය දවස්වල බස්නාහිර පළාත් සභාවේ ඒ හදපු ප්‍රඥප්තිය තුළ අවුරුදු 20 ක් 30 ක් කර ගෙන ආපු පෙර පාසල් කඩා ගෙන වැටීමට පත් වුණා. මොකද, ඒ අවුරුදු 20 ක් 30 ක් තිස්සේ ළදරු අධ්‍යාපනය දීලා සාර්ථක පුද්ගලයන්, මේ රටට නිර්මාණය කරපු පෙර පාසල් ලියාපදිංචි කිරීමේ නොහැකියාව පැවතුනා. සමහර වේලාවට සමහර පෙර පාසල් ලියාපදිංචි නොකර පැත්තකට විසි වුණා. එහෙත් සමහර අය කාගෙ හරි නමක් ගෙනැල්ලා එයාගෙ නමට අර පෙර පාසල ලියාපදිංචි කරන්න පටන් ගත්තා. මම කියන්නේ, ඒ වාගේ අපහසුතාවලට පත් කරන්න හොඳ නැහැ. එහෙම නම් විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ කියනවා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව බොහොම හොඳයි. මේක වෙන්න ඕනෑ. හැබැයි අපේ අවධානය යොමු කරන්න ඕනෑ. අපි පෙර පාසලක් හදනවා කියන්නේ, පැහැදිලි කරන්න ඕනෑ. දැනුමට නොවෙයි තැන දෙන්න ඕනෑ. මාරියා මොනටිසෝරි තුමිය මේ පෙර පාසල ආරම්භ කළේ, දැනුම මුල් කරලා නොවෙයි. ආකල්ප කුලසකා වැඩිදියුණු කරලා හොඳ පුද්ගලයෙක් පාසල් යවලා පාසලේ දෙන දැනුම ලබා ගන්න පුළුවන් පුද්ගලයෙක් බවට පත් කිරීමේ පරමාර්ථය ඇතුවයි. එහෙම නම් විශේෂයෙන්ම මෙතුමා ගෙන ආ යෝජනාවට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ පූ.භා. 11.59 ]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා පෙර පාසල් අධ්‍යාපනය විධිමත් ආකාරයෙන් කරන්නේ කොයි ආකාරයෙන්ද? සියලුම දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙන්නේ කොහොමද? කියන එක පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරලා තියෙනවා.

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනයක හිටපු ප්‍රධානියෙක් වශයෙන් මමත් අවධානය යොමු කරනවා. මේ පෙර පාසල් අධ්‍යාපනය අයිති කාටද කියන එක පිළිබඳව තවමත් නිශ්චිත වැඩපිළිවෙළක් නැහැ. නමුත් පෙර පාසල් අධ්‍යාපනය මේ යුගයේ වන විට සියලු දරුවන්ට අවශ්‍ය යයි කියන එක අද කාගේත් සිත්වලට ඇතුළත් වෙලා තියෙනවා. එදා පෙර පාසල් අධ්‍යාපනය පටන් ගත්තේ මේ රටේ අවිධිමත් ආකාරයේ වැඩපිළිවෙළකට. ඈත පිටිසර ගම්බද ප්‍රදේශයක දරුවෙක් ඉගෙන ගෙන ගෙදර නිකන් ඉන්න නිසා වටපිටාවේ සිටින කුඩා දරුවන්ව ඒකරාශී කර ගෙන මොනවා හරි අකුරු ටිකක් කියා දෙන්න, පාසලට යන්න කලින් මොනවා හරි දේවල් ටිකක් උගන්වන්න ආකාරයේ ඉතාමත් අඩු පහසුකම් මැද. මම දැක්කා. ඉතා දුෂ්කර ප්‍රදේශවල වතුකරයට ගියායින් පස්සේ තේ දළු එකතු කරන මඩුවේ, පුල්ලේ මඩුව කියන මඩුවේ උඩුකයට වස්ත්‍රයක් නැතුව ලණු පැදුරුවල මේ පෙර පාසල් ආරම්භ කරපු යුගයක් තිබුණා. ඒ වාගේම නගරයට ආවාට පස්සේ නගරයේ පෙර පාසලකට ගියාම ළමයින් 50 ක් ඉන්නවා නම්, වාහන 50 ක් නවත්වලා තියෙන ඉතාම සුපිරි ගණයේ පෙර පාසල් පද්ධතියක් තිබුණා. මෙන්න මේ අවිධිමත් ආකාරයෙන් කර ගෙන ගිය පෙර පාසල් පද්ධතිය තුළ සිටින දරුවෝ රජයේ පාසලට ඇතුලත් වුණාට පසුව රජයේ පාසලේ පළමු ශ්‍රේණියේ ගුරුතුමියට ඒ දරුවනට අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. විවිධ මට්ටමේ දරුවන් ඉන්නේ. යම් පාඩමක් පටන් ගන්න කොට ඒ පාඩම කරලා ඉවර නිසා අර ළමයි කෑ ගහලා කියනවා මම ඕක දන්නවා කියලා. ළමයි එක මට්ටමට ගේන්නේ නැතුව මේක කර ගන්න බැහැ. පෙර පාසල් පද්ධතිය තුළ අවිධිමත් ආකාරයේ වැඩපිළිවෙළක් තිබුණා.

ඒ නිසා පසුගිය යුගයේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විශේෂයෙන් බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශය මේ සඳහා අවධානය යොමු කරලා පෙර පාසල්වලට යම් කිසි විෂය නිර්දේශයක් හැදුවා. අපේ කලාප කාර්යාලවල පෙර පාසල් අංශයක් වෙනම තියෙනවා. ඒකට අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. ඒකට මග පෙන්වීමක් තියෙනවා. සියලු පෙර පාසල් ගුරුතුමියන්ලාව පුහුණු කිරීමේ වැඩ පිළිවෙළකට ගෙනි යනවා. මෙය යම්කිසි එකම තලයකට ගේන්න පසුගිය කාලය තුළ දැඩි උත්සාහයක් ගත්තා. ඒ වැඩ පිළිවෙළ නිසා අද සියලු දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය අවශ්‍යයි කියන එක සියලු දෙනාගේ මතයක් බවට පත් වෙලා තියෙනවා. ඒක ඇත්තක් වෙලා තියෙනවා. පෙර පාසලක අධ්‍යාපනය ලබපු දරුවෙක් පාසල් අධ්‍යාපනය පටන් ගන්න විටත්, පෙර පාසලක නොගිය දරුවෙක් පාසලට ඇතුළත් කරන විටත් ආකාර දෙකක් තියෙනවා.

ඒ දරුවන්ගේ පාසල තුළ පෙර පාසලින් බලාපොරොත්තු වන කාර්යභාරය, පෙර පාසලේ දරුවන්ව හුරු කර ගැනීම, ගුරුතුමියට ආශාවක් ඇති කිරීම, තමන්ගේ බත් ටික කොයි ආකාරයෙන්ද කන්නේ? තමන්ගේ අත පය කොහොමද හෝදා ගන්නේ? මේවාට දරුවෙකුව තනියෙන් හැසිරවීමට හුරු කිරීමක් පෙර පාසල තුළ කරලා, දරුවාගේ සබකෝලය ඇරලා, වේදිකාවට රංගනයක් ඉදිරිපත් කරන්න, ශබ්දයකට ඇහුම්කන් දෙන්න, ගීතයකට ඇහුම්කන් දෙන්න සහ මේ තුළින් දරුවා පාසලට ඇතුළත් කිරීමේ ආශාවක් ඇති කිරීමේ වැඩපිළිවෙළක් පෙර පාසල තුළින් කරන්න කාර්යභරය පවරලා තියෙනවා. ඊට එහා පැත්තේ ගිය වැඩපිළිවෙළක් සමහර පෙර පාසල්වල කරනවා කියන එකයි අර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ. ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ගේ අරමුණ තිබුණේ ඔතැන නොවෙයි

[ ගරු යසපාල කෝරළගේ ]

ගරු සභාපතිතුමනි. අපේ අවධානය යොමු වෙන්න ඕනෑ තැන ඔතැන නොවෙයි. අපට අවශ්‍ය වෙලා තිබුණේ පළාත් පාලන ආයතන මට්ටමේ පෙර පාසල් යම් යම් තැන්වල ඇති කර ගෙන ගියා. ඒ ඇති කර ගෙන ගිය පෙර පාසල්වල පෙර පාසල් ගුරුවරු තමන්ගේ කාර්යභාරය කරන විට දෙමව්පියන්ට විශාල බර පැනක් ගෙවන්න සිදු වුණා. ඒ නිසා පළාත් පාලන ආයතනයෙන් යම්කිසි දීමනාවක් ලබා දීලා ඒ පෙර පාසල් කර ගෙන යන විට සියලු දරුවනට මේ පෙර පාසල් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන්කමක් ඇති වුණා. නමුත් සිද්ධ වෙන්නේ මේකයි. මේ පෙර පාසල් ගුරුවරුන් ස්ථිර කරන්නයි කියන අරමුණයි ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමාගේ අදහස වුණේ. මේ අයට රජයේ දීමනාවක්, නැත්නම් පළාත් පාලන ආයතනයේ දීමනාවක් දෙන්න පුළුවන් තත්ත්වයකට ගේන්න කියන අරමුණයි ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ අදහස වුණේ. එහෙම වුණොත් සියලු දරුවන්ට නොමිලේ පෙර පාසල් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් කියන එකයි එතුමාගේ අදහස වුණේ.

ගරු සභාපතිතුමනි, අද තියෙන තත්ත්වය මත පෙර පාසල් ගුරුවරිය ඉතාමත් අනතුරුදායක තත්ත්වයක ඉන්නවා. මම ඒක පෙන්වා දෙන්නම් මෙන්න මේ ආකාරයෙන්. පෙර පාසල් ගුරුවරියක් වුණාම ඒ සියලු දෙනාට වඩා හොඳ රංගනයක් ඉදිරිපත් කරන්න පුළුවන් හැකියාවක් තියෙනවා පෙර පාසල් පාලිකාවට. ඒ පෙර පාසල් පාලිකාවට හොඳ ගායන හැකියාවක් තියෙන්න ඕනෑ. ඒ පෙර පාසල් පාලිකාවට හොඳ පෙනුමක් තියෙන ආකාරයේ තමන්ගේ රූපය තියෙන්න ඕනෑ. ඒ ආකාරයෙන් පෙර පාසල් ගුරුවරු සිය ගණනක් දහස් ගණනක් එකතු කරලා වැඩ පිළිවෙළක් සඳහා පසුගිය කාලේදී අපේ රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන ආකාරයක් තිබුණා. මේ ආකාරයෙන් සිටින පෙර පාසල් ගුරුතුමිය තමන් ලස්සනයි. තමන්ගේ සාරිය ලස්සනයි. තමන්ට ගායන හැකියාව තියෙනවා. තමන්ට නාට්‍ය හැකියාව තියෙනවා. මේ නිසා සියලු දරුවන් තමන්ගේ පෙර පාසලට එන්න පටන් ගන්නවා. ඒ එනකොට පෙර පාසල දරුවන්ගේ ප්‍රමාණය වැඩියි. දැන් තමන්ට ආදායම හොඳයි. මේ ආසාව නිසා පෙර පාසල් දිගින් දිගට කර ගෙන යනවා. මෙහෙම කර ගෙන ගිහිල්ලා අවුරුදු 15 ක් 20 ක් යන විට තමන්ගේ පළපුරුද්දත් එක්ක මේ පෙර පාසල කර ගෙන යන විට මේ ගමේම තවත් රැකියාවක් බලාපොරොත්තු වන දරුවෙක් එයත් අර වාගේම ලස්සනට ගායන, හැකියාව තියෙන අර වාගේම ලස්සන රූපයක් තියෙන අර වාගේම ලස්සනට සාරියක් ඇඳගෙන මේ ගායන හැකියාවත් එක්ක අලුත් පෙර පාසලක් මේ ගමේම හදනවා. හැදුවට පස්සේ අර අවුරුදු 15 ක් තිස්සේ දුක් විඳපු පෙර පාසල් පාලිකා තුමියට දැන් ගායනා හැකියාව නැහැ. දැන් වයසට ගිහිල්ලා. ඒ නිසා මේ දරුවන් ටික යනවා අර අලුත් පෙර පාසලට. අර අපේ පළපුරුදු පෙර පාසල් පාලිකාවට වුණේ තමන්ගේ වටිනා කාලය, තමන්ගේ තරුණ කාලයේදී තමන්ට වෙනත් රැකියාවකට යන්න වුණොත් නැහැ. තමන්ගේ ජීවිතය අස්ථිර තත්ත්වයට පත් වෙලා අද පෙර පාසලේ ළමයි ඇත්තෙත් නැහැ. ආදායමක් ඇත්තෙත් නැහැ. ඒ නිසා ඉතාමත්ම අනතුරුදායක තත්ත්වයක තියෙනවා මේ පෙර පාසල් ගුරුවරිය. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා. මෙතුමාගේ කථාවෙන් ඉල්ලුවේ. පළාත් පාලන ආයතනය හෝ එහෙම නැත්නම් පළාත් සභාව මගින් හෝ ඒ අයගෙන් මුදලක් අයකර ගෙන හෝ අපෙන් මුදලක් ඒ වෙනුවෙන් වැය කරලා හෝ මොනයම් වැඩ පිළිවෙළක් යටතේ - අපි පෙර පාසල් ප්‍රඥප්තියක් හැදුවා. ඒ පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ හෝ වැඩ පිළිවෙළක් ගොනු වෙන්න ඕනෑ මේ පෙර පාසල් පාලිකාවට ස්ථිරත්වයක් ඇතිවන ආකාරයෙන්. එහෙම නොවුනොත් එය අප සමාජයට කරන අසාධාරණයක් වශයෙනුයි, පෙර පාසල් පාලිකාවට කරන අසාධාරණයක් වශයෙනුයි මම දකින්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරලා මේ පෙර පාසල් පද්ධතිය අයිති පළාත් පාලන ආයතනයට නම් ඒ පළාත් පාලන ආයතනය තුළ පෙර පාසල් පාලිකාවට නිසි තැන සහ ඒ ස්ථිර වැඩපිළිවෙළක් වන ආකාරයේ ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහෙම නැත්නම් පෙර පාසල් පද්ධතිය අයිති පළාත් සභාවට නම් පළාත් සභාවේ පෙර පාසල් ප්‍රඥප්තියත් එක්ක මේ සියලු පෙර පාසල් පාලිකාවන්ට ස්ථිර වැඩපිළිවෙළක් ගේන්න ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. එහෙම වුණොත් සියලු දරුවන්ට විධිමත් ආකාරයේ පෙර පාසල් අධ්‍යාපනයක් ලබා දෙන්න පුළුවන් වේවි කියන විශ්වාසයයි මා තුළ තියෙන්නේ. ඒ නිසා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මේ ගෙන ආ යෝජනාව තුළින් ඉදිරි අනාගතයේ බස්නාහිර පළාත තුළ වත් පෙර පාසල් පද්ධතිය තුළ විධිමත් ආකාරයෙන් සියලු දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය ලබා ගන්න පුළුවන් ආකාරයේ පරිසරයකුත්, ඒ වාගේම පෙර පාසල් පාලිකාවන්ට තමන්ගේ ජීවිතයේ වටිනා තරුණ කාලය අපතේ නොයන ආකාරයේ වැඩපිළිවෙළකට, තමන්ගේ ජීවිතයේ අනාගතයේ ස්ථාවරත්වයක් ඇති වන ආකාරයේ වැඩපිළිවෙලකට ගොනු වෙයි කියලා විශ්වාසය තබමින් මේ යෝජනාවට මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.10 ]

**ගරු පෝල් පෙරේරා**
Hon. Paul Perera

ගරු සභාපතිතුමනි, ස්තුතියි කාලය ලබා දුන්නාට. ඇත්තෙන්ම අපේ හිතවත් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාමත් හොඳ කාලෝචිත යෝජනාවක් කියලා හිතනවා. ඒකෙන් කියැවෙන්නේ, පාසලට යන්න ඉස්සරවෙලා පෙර පාසල් අධ්‍යාපනයක අවශ්‍යතාවත් ඒ වාගේම දරුවාගේ පෝෂණය සම්බන්ධ ප්‍රශ්නයත් තමයි මම දකින්නේ. මම හිතනවා එතුමා එල්ල කරනවා මේකට දෙමව්පියන්ගේ නොසැලකිල්ල සහ දෙමාපියන්ගේ අඩු ආදායම් තත්ත්වය කියලා. මෙතුමා හරියටම හරි. ඇත්තෙන්ම අද සමහරවිට පාසලට, ප්‍රාථමික අංශයට හෝ පෙර පාසලකට පුංචි දරුවෙක් යවන විට මම දකිනවා සමහර දරුවෝ තේ එකක්වත් බීලා නැහැ. සමහර දරුවෝ කෑම කාලා එන්නේ නැහැ. බොහෝ දරුවන් පාසලට ආපු හැටියේ අසරණව දුර්වලව සමහර විට පාසලේ කාර්යාලයට වෙලා ඉන්නවා. හේතුව ඇහුවාම අම්ම කෑම කවලා නැහැ. නැත්නම් දෙමව්පියන් කෑම කවලා නැහැ. තේ එකක්වත් පොවලා නැහැ. මේවායේ ප්‍රතිඵලය විශාලව ලැබෙනවා. දරුවාගේ වර්ධනයත් එක්ක. හේතුව දරුවා සමහර විට තේ එකක්වත් කෑම ටිකක්වක් කාලා එන්නේ නැත්නම් පාසලට මේ දරුවා ලෙඩ රෝගවලින් පෙළෙන්න පටන් ගන්නවා. විශේෂයෙන් අපි දකිනවා උදේට තේ එකක්වත් බිව්වේ නැත්නම් Gastritis හැදෙනවා. මගේ පාසලේ මම දැකලා තියෙනවා Gastritis හැදිලා තියෙන දරුවෝ දහයක් පහළොවක් උදේට බුදි. වෙන පාසල්වල මේ වාගේ කොපමණ ඉන්න පුළුවන්ද? ඒ නිසා පෝෂණය සම්බන්ධ ගරු මන්ත්‍රීතුමා කියන ප්‍රශ්නයක් මේක. වැරදිකාරයෝ අම්මලා. තාත්තලා. විශේෂයෙන් තාත්තාට දරුවා ගැන බලන්න කාලයක් නැහැ. ආර්ථිකයත් එක්ක දහලන කොට අම්මා තමයි දරුවාගේ සේරම කටයුතු ටික බලන්නේ. ඒ නිසා අම්මලාව දැනුවත් කිරීම මේ අවස්ථාවේදී හුඟාක් වැදගත් වෙනවා. අම්මා මේ දරුවාගේ පෝෂණය අවශ්‍ය බව දන්නේ නැත්නම් එයත් ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ වාගේම අපි හැමෝම දන්නවා දරුවා පුංචි කාලයේදී තමයි මොළය වර්ධනය වෙන්නේ. ඒ නිසා ඒකට නිසි පෝෂණයක් ලැබෙන්නේ නැත්නම් දරුවාගේ මොළය වර්ධනය වන්නේ නැතුව මන්දපෝෂණ තත්ත්වයට ඇත්තෙන්ම දරුවා පත් වෙනවා.

ඒ නිසා මෙය ඇත්තෙන්ම විශාල ප්‍රශ්නයක්. අපේ පරපුර මන්දපෝෂණයෙන් පෙළෙනවා නම් අපේ අධ්‍යාපනයේ ආශ්චර්ය අපට ලබා ගන්න බැරි වෙනවා. මා හිතන්නේ පළාත් සභා මට්ටමෙන් ආවොත්, පළාත් පාලන ආයතන කිහිපයක් තියෙන කොට මේ ප්‍රශ්නය ගොනු කරලා ගන්න හරි අමාරුයි. තවත් කථා කළොත්, මම හුඟාක් මොන්ටිසෝරි පෙර පාසල්වලට සම්බන්ධ වෙලා තියෙනවා. ඇත්තෙන්ම ගරු සභාපතිතුමා හරහා ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමතියි. ඒ ඉන්න පෙර පාසල් පාලිකාවන් ඇත්තෙන්ම දරුවන්ට පුදුම ආදරයකින් බැඳිලා ඉන්නේ. සමහරක් අය දරුවා කෑම ගෙනැත් නැත්නම් එතුමියගේ කෑම එක තමයි දරුවා කන්නේ. සමහර විට දරුවාට ගෙදරින් කෑම ලැබෙන්නේ නැත්නම්, දරුවා යාලුවෙකුගෙන් කෑම ඇඳලා අරගෙන කන්න බලනවා. එහෙම දෙන්නේ නැත්නම් දරුවා හොරකම් කරනවා. අපි පෝෂණය ගැන කථා කරන කොට ඒ දරුවට නිසි කෑමක් ගෙදරින් ලැබෙන්නේ නැතුව ගියාම දරුවාව තවත් වැරදි පැත්තකට යොමු කරනවා. පාසලේ ප්‍රාථමික අංශයෙන්ම දරුවා හොරෙක් බවට පත් කරනවා. මෙය සමහර විට උඩට යන කොටත් සිදු වෙනවා. කෑම ගැන ගෙදරින් උනන්දු නැති වෙන විට යාලුවන්ගේ කෑම හොරෙන් අරගන්න පටන් ගන්නවා. සමහර විට මේවා පාසල්වල අපට දකින්න ලැබෙන සුලභ දර්ශන. හොරෙන් කෑම කාලා. අනෙක් දරුවාට කෑම කන්න නැහැ. සමහර විට ගුරුවරුන්ට සේරම දරුවන්ව බලා ගන්න බැහැ. මේ වාගේ පෝෂණය සම්බන්ධ ප්‍රශ්න රාශියක් මතු වෙනවා. අද සමහර විට මේ පුංචි දරුවෙකුට අම්මා කෑම අරන් දෙන්න යනවා නම් පිටින් මොනවද අරන් දෙන්නේ? අද රෝල් එක රුපියල් 40 ක් විතර වෙනවා. රුපියල් 40 ක් අම්මාට වියදම් කරන්න බැහැ දරුවාට. මේ ගැන අවබෝධයක් නැහැ. එහෙත් අපි දකිනවා ගරු සභාපතිතුමනි, මඤ්ඤොක්කා රුපියල් දහයකට දෙන්න පුළුවන්. හොඳ පිහානක් රුපියල් දහයකට දෙන්න පුළුවන්. දැන් රුපියල් 30 ක් වෙනවා මඤ්ඤොක්කා. සමහර අය නම් රුපියල් 60 ටත් විකුණනවා. මේවා අපේ මුතුන් මිත්තෝ කාපු දේවල්. අල, බතල, මඤ්ඤොක්කා. මම හිතනවා ගරු මන්ත්‍රීතුමාලා දන්නවා ඇති, පත්තර කියවලා දන්නවා ඇති මඤ්ඤොක්කා දරුවෙකුට දෙනවා නම් ඒ දරුවාට කවදාවත් පිළිකාවක් හැදෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. මොකද, මඤ්ඤොක්කාවල B 17 කියන විටමිනය තියෙනවා. මේ B 17 කියන විටමිනය සයනයිඩ් කොටසට කැඩෙනවා ඇඟට ගියායින් පස්සේ. මේ සයනයිඩ් කොටස පිළිකා ශෛල තිබේ නම් එකක් හෝ දෙකක් හෝ කිහිපයක් පස්සෙන් එලවා එලවා ගිහිල්ලා මේ පිළිකා ශෛල සේරම විනාශ කරනවා. පිළිකා තියෙන කෙනෙකුට දුන්නොත් එහෙම මඤ්ඤොක්කා ඒ පිළිකා විනාශ කරනවා. පිළිකා නැති කෙනෙකුට දුන්නොත් එහෙම කවදාවත් පිළිකාවක් හැදෙන්නේ නැති වෙනවා. මොකද, ශෛලයක් එන කොට අර සයිනයිඩ් කොටස ගිහිල්ලා ඒක විනාශ කරනවා. අපට ඇයි බැරි පුංචි දරුවන්ට උදේට මඤ්ඤොක්කා ටිකක් ලුණු මිරිස් ටිකක් හදලා දෙන්න රුපියල් දහයක්වත් යන්නේ නැහැ. අපි රෝල් එකම කාගෙන තෙල් සේරම ඇඟේ නාගෙන ඊට පස්සේ Gastritis හැදිලා සේරම දහජරාව කාලා මේ පුංචි දරු පරපුර අපි විනාශ කරනවා.

ගරු සභාපතිතුමනි, මට අපේ ගරු මන්ත්‍රීතුමාට කියන්න අවශ්‍යයි. අපට මේක සංවිධානාත්මකව අපේ පළාත් සභාව තුළින් ව්‍යාපෘතියක් හදන්න පුළුවන් නම් ඒක පළාත් පාලන ආයතනවලට පවරන්න පුළුවන්. දරුවාගේ හැම දෙයක්ම

පෝෂණය වාගේම. මම දකිනවා ඇත්තටම ඒ පෙර පාසල්වල ගුරුවරුන්ට ආදායමක් නැහැ. සමහරක් අය ඇහුවාම කියනවා අපි රුපියල් 200 යි ළමයාගෙන් ගන්නේ කියලා. රුපියල් 200 ට පෙර පාසලක් කරන්න බැහැ. එතකොට ගුරුවරුන්ට පඩියක් ඇත්තේ නැහැ. එයත් කැප වෙලා තමයි කරන්නේ. සමහර විට එයාගේ ප්‍රශ්නවලදී කිසි කෙනෙක් උදව් දෙන්නේ නැහැ. මට මතකයි පෙර පාසල් කිහිපයකට මම ගියා. ඇඳ ගන්න සාරියක් නැහැ. හැමදාම එකම සාරිය. මම සාරි පනහක් ඇරියා එකම පාට. Uniform එකක් වශයෙන් අඳින්න කියලා. ඒ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. ඇත්තෙන්ම හැම ගමකම තියෙනවා මේ වාගේ මොන්ටිසෝරියක් හෝ දෙකක්. ඉතින් ඉස්සරවෙලා මේවා ගැන බලලා මේ අයට හයියක් දුන්නොත් - ඒ අය අම්මලා වාගේ මේ දරුවන්ට ආදරය කරමින් උගන්වනවා. අපට වෙනම කණ්ඩායමක් හදලා ගෙනයනවාට වඩා ඉස්සෙල්ලා අපට

[ ගරු පෝල් පෙරේරා ]

තියෙන්නේ මේ කණ්ඩායම හොඳට හදා ගන්න කටයුතු කිරීමයි. ඇත්තෙන්ම මේ අය ගුරුවරු වුණාට, මේ අය ගුරු මෑණිවරු. මේ අම්මලාට හයියක් දීලා එක්කෝ පළාත් සභාව තුළින් ඒ අවශ්‍ය කරන වටාපිටාව හදලා, පුංචි පඩියක් හරි මොකක් හරි දීලා ගුරු මෑණිවරුන්ට ජීවත් වෙන්න විධිමත් වැඩ පිළිවෙළක් හැදුවා නම් ඒ අය මේවා ගෙනි යයි. අපි මේක බදාගන්න වුවමනා නැහැ. මොකද, ඒක බලපුවාම තේරෙනවා. මම ගිය හැම තැනකම හැම ගමකවම මොන්ටිසෝරියක් තියෙනවා. ළමයි තිහක් හතළිහක් ඉන්නවා. මොකද, අර අවසානයේදී පවත්වන Concert එකට අපව කැඳවනවා. ඒ ගියාම තමයි මේවාවල නියම තත්ත්වය පේන්නේ. ඉතින් පුදුම දුකකින් තමයි ඒ අය ඒ කාර්යභාරය කර ගෙන ඒ දරුවන් යහමගට හදන්න යන්නේ. ඒ නිසා අපට ගොඩාක් හොඳ වෙන්නේ පළාත් සභාව තුළින් පරිපාලනයක් අරගෙන සමහර විට පළාත් පාලන අංශවලත් අපි ආධාරය අර ගෙන අපට පුළුවන් මේ දැන් සිටින ගුරු මෑණිවරුන්ව හදන්න. ඒ අය පළාත් සභාවේ Register වෙලා තියෙනවා. නීත්‍යානුකූල නොවෙනවා නොවෙයි. නීත්‍යානුකූල වන ඒවා. ඒ නිසා මම ඇත්තෙන්ම සභාපතිතුමා හරහා ඉල්ලීමක් කරනවා ඉස්සෙල්ලා මේ අයව හදා ගත්තා නම් අපට මේකෙන් සියයට පනහක් හැටක් ඉවර කර ගන්න පුළුවන්. ඉතිරි සියයට හතළිහ අපට මොකක් හරි ක්‍රමවේදයක් හදලා පළාත් සභාව තුළ කථා බහ කරලා මම හිතන්නේ මෙය හුඟාක් ඉහළ මට්ටමකට ගන්න පුළුවන් කියලා අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට කියන්න ලැහැස්තියි.

ඒ වාගේම සමහර විට දුප්පත් දරුවන් ගැන - දැන් දුප්පත් දරුවෙකුට අම්මාට කන්න දෙන්න බැරි නම් අපි මොකක්ද කරන්නේ? එතැන වෙන පැත්තකට අපට යන්න සිද්ධ වෙනවා. එහෙම නම් මේ පවුල හදන්න සිදු වෙනවා. මොකක් හරි ව්‍යාපෘතියක් කරලා ඒ අයට පුංචි පුංචි ආදායම් මගක් හදලා මේ දරුවාට පෝෂණය ලබා දෙන්න. දරුවාට අසනීපයක් හැදුනාම බෙහෙත් හේත් ගන්න ඒ වාගේ පදනමකුත් දාන්න වෙනවා. මේ විතරක් කරලා මදි වෙනවා. මොකද? සල්ලි තියෙන අයට අපේ ගරු මන්ත්‍රීතුමාලා කිව්වා වාගේ ඉහළ මොන්ටිසෝරිවලට ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන්. එතකොට සල්ලි නැති අයටයි ප්‍රශ්නයක් තියෙන්නේ. ඒ පවුල හදන්නේ නැතුව අපට මේ ගැන කථා කරලා තේරුමක් වෙන්නේ නැහැ. මොකද, ගුරු මෑණියන්ට සේරම දුප්පත් දරුවන්ට කෑම දෙන්නත් බැහැ. එයාට එක්කෙනෙකුට දෙන්නෙකුට කෑම දෙන්න පුළුවන්, එයා ගේන කෑම එකෙන්. එතකොට මෙතැන්දී පවුල සෑදීමත් ප්‍රශ්නයක් වෙනවා. අපට මෙය හුඟාක් දුරට ප්‍රාදේශීය සභා මටටමින් අඩු ගණනේ ප්‍රාදේශීය ලේකම්තුමා සම්බන්ධ කර ගෙන මොකක් හරි වැඩ පිළිවෙලක් හැදුවොත් පවුලේ සංවර්ධනය කරන්න පුළුවන් කියලා මට හිතෙනවා. ඒ නිසා මේ ගැන අපට දෙපැත්තක් ගැන හිතලා තමයි හුඟාක් දුරට ඉස්සරහාට කටයුතු කරන්න වෙන්නේ.

ඇත්තෙන්ම අධ්‍යාපන පිළිබඳව - මම ගොඩාක් දරුවන් එක්ක ඉඳලා තියෙනවා. සමහර විට දරුවෝ ලක්ෂ දෙකකට විතර උගන්වලා තියෙනවා. අපේ අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමාත් මගේ ගෝලයෙක්. එතුමාගේ නෝනත් දොස්තරවරියක්. මගේ ගෝලයෙක්. එහෙම ගොඩාක් අය ඉන්නවා. ඒ නිසා අපිත් හරි ආසයි මේ වාගේ දරු පරම්පරාවක් හදන්න. මම නැණ පෝෂ කියලා එකක් හදා ගෙන යනවා. රුපියල් දහයකට පහළොවකට දරුවෙකුට කවන්න - මෙහි බෙහෙත් නෙල්ලි, ගොටුකොළ, ලුණුවිල සහ එරමුසු නැණ වශයෙන් අරගෙන පෝෂ්‍ය කොටස වශයෙන් සෝයා, සහල්, ඉරිඟු සහ මුංඇට හදලා ඉතාමත් අඩු මුදලකට හැම දරුවෙකුටම නැණ පෝෂ පැකට් එකක් හදන්න, ඒක බෙදා හැරීමට කටයුතු කරනවා. දරුවන්ගේ මොළය වඩලා තමයි පෝෂණ පැත්ත ගැන හිතන්න වෙන්නේ. ඒක මම හිතන්නේ, ලබන මාසයේ ලැහැස්ති කරන්න හදනවා. අපෙන් විය යුතු සේවාවන් තියෙනවා. අපි සමාජ සේවකයන් වශයෙන් ඇවිල්ලා තියෙන්නේ දරුවන්ට ඒ දේවල් කරන්න. ඒ නිසා ඉදිරියේදී ඔබතුමා කිව්වා වාගේ පෝෂණය සම්බන්ධව ඔබතුමාට දැන ගන්න ලැබෙයි. නැණ පෝෂ කියන එක අලුත් එකක්. දරුවන්ගේ මොළය වර්ධනය කරන්නේ. මොකද, පුංචි කාලයේ මොළය වැඩෙන්න ඕනෑ. නැත්නම් දරුවාට ඉගෙන ගන්න හම්බ වෙන්නෙත් නැහැ. ඉස්සරහට යන්න හම්බ වෙන්නේත් නැහැ. ඒ නිසා ඔබතුමා අද ගෙනපු අදහස ඉතාම කාලෝචිතයි කියමින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[ අ.භා. 12.20 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් අද මේ සභාවට ඉදිරිපත් කළ ඉතාමත් කාලෝචිත යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, දියුණුවන රටක් හැටියට අපේ රටේ තියෙන දරිද්‍රතාවය, දිළිඳු බව,

තුරන් කරන්න හැකි එකම මාර්ගය ලෝකයේ පවතින ඉල්ලුමට සරිලන අධ්‍යාපනයක් අපේ දරුවන් වෙත ලංකර දීම කියන එක අපි කවුරුත් පිළිගන්නා කාරණාවක්. අපේ නිවෙස්වලට එන අහිංසක දුප්පත් අසරණ මිනිස්සු සමග අප නිතර කථා බහ කරලා කියන්නේ, පවුල කවදා හරි දවසක මේ අගාධයෙන් ගොඩ ගන්න පුළුවන් නම්, ඒ පුළුවන් වන්නේ දරුවා තුළට ලංකර දෙන අධ්‍යාපනයෙන් පමණක් බව. විශේෂයෙන්ම මීට වසර තිහකට හතළිහකට පෙර තිබුණු අධ්‍යාපන රටාවට වඩා ඉතාමත් සංකීර්ණ අධ්‍යාපන රටාවක් අද අපේ සමාජය තුළ දකින්නට ලැබෙනවා. ඉස්සර අපේ දෙමාපියන් එසේත් නැත්නම් අපේ මුතුන් මිත්තන් අධ්‍යාපනයේ මූලික අවස්ථාවට මුහුණ දුන්නේ, විධිමත් පාසලට ඇතුළත් වීමෙන් මිස, පෙර පාසලකට එහෙම නැත්නම් පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයකට ඇතුළත් වීමෙන් නොවෙයි. ඔවුන් කෙළින්ම ගියේ විධිමත් පාසලකට. එදා විධිමත් පාසලට ගියාම දෙමව්පියන්ගේ ඇඟිල්ලේ එල්ලිලා දරුවෝ විශාල ප්‍රමාණයක් ගෙදර යන්නේ බෙරිහන් දීලා කෑ ගහමින්. පාසල් පරිසරය ඒ දරුවන්ට හුරු පුරුදු නැහැ. ඒ නිසා ඔවුන් හුඟාක් වෙලාවට දෙමව්පියන් එක්ක එකට ජීවත් වෙලා පාසලට මුලින්ම යන කොට පාසලේ පරිසරය ඔවුන්ට හුරුපුරුදු නැති නිසාම සතියක් හමාරක්, එහෙම නැත්නම් මාසයක් විතර යන කල් විශාල කරදරයකට අපහසුතාවයකට මුහුණ දෙනවා, පාසලේ පරිසරයට හුරු පුරුදු වෙන්න. නමුත් අද එහෙම නොවෙයි. වසර තුන, තුනහමාර, හතර වන කොට අපේ දරුවන් පාසල් පරිසරයට හුරු පුරුදු වෙලා යම්කිසි අවබෝධයකින් හා හැඟීමකින් යුතුව තමයි විධිමත් පාසලට ඇතුලත් වෙන්නේ. නමුත් වසර ගණනාවක් - දැන් උදාහරණයකට ගත්තොත් මා ජීවත් වන ප්‍රදේශයේ පානදුර මලලසේකර පෙර පාසලට පහුගිය දවසේ පනස් වෙනි වසර සම්පූර්ණ වුණා. දැන් ඒගොල්ලෝ එපමණ ඉතිහාසයක් පුරා මේ කාර්ය භාරය ඉෂ්ට කරමින් පැවතියා. නමුත් පසුගිය දශකයේ තමයි අපි පෙර පාසල් ප්‍රඥප්තිය මේ සභාව තුළ සම්මත කළේ. එතෙක් ඔවුන් මේ කටයුත්ත තමන්ගේ හැකියාව පදනම් කර ගෙන, දක්ෂතාව පදනම් කර ගෙන ක්‍රියාත්මක කරමින් පැවතියා. අපේ ගරු මන්ත්‍රීතුමෙක් කරුණු ඉදිරිපත් කළා පවතින පෙර පාසල් ප්‍රඥප්තිය අනුව අද විශාල ගැටලුවකට මුහුණ දීලා තියෙනවා, පැරණි පෙර පාසල් පවත්වා ගෙන යාමේදී කියලා. ලියාපදිංචිය පිළිබඳ ගැටලු පවතිනවා කියලා. මම හිතන්නේ ඒකේ පුංචි වෙනස් වීමක් වෙන්න ඕනැ. අලුතෙන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන පෙර පාසල් සඳහා තමයි පෙර පාසල් ප්‍රඥප්තිය තුළින් මේ කොන්දේසි දැඩි ලෙස පනවා තියෙන්නේ. ඒ අයට අලුතෙන් ක්‍රියාත්මක කිරීමේදී තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් සහ පෙර පාසලක් පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන පරිසරය, ඒ පෙර පාසල තුළින් දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට සුදුසු වාතාශ්‍රය පිළිබඳව විවිධ කරුණු රාශියක් ප්‍රඥප්තිය තුළට ඇතුළත් කරලා තියෙනවා. මොකද? ප්‍රඥප්තියක් කියන්නේ නීතියක්. ඒ නීතියත් විද්‍යාත්මක පදනමක් මත ගොඩනගන්න ඕනැ. පවතින ජාත්‍යන්තර හෝ දේශීය වශයෙන් දරුවාට උචිත පරිසරයක් තුළ මේ කටයුත්ත කර ගෙන යාම සඳහා. ප්‍රඥප්ති සකස් කිරීමේදී ඒ තත්ත්වයන්, ප්‍රමිතිය ඒ තුළ නැත්නම් ඒක ප්‍රඥප්තියක් හැටියට සමස්ත රජය පිළිගත් ආයතනයකට ව්‍යවස්ථාපිත ආයතනයකට ඒක ක්‍රියාත්මක කිරීමට අපහසුයි.

ගරු සභාපතිතුමනි, මට මතකයි, මම පළාත් සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන කාලයේ විදේශීය රටකින් ඉල්ලීමක් කළා මීරිගම ප්‍රදේශයේ පෙර පාසලක් හදන්න ඉඩමක් සපයා දෙන්න කියලා. ඔවුන් ඉඩම ඉල්ලුවේ අක්කර හතරක පෙර පාසල හදන්න. දැන් අපේ පෙර පාසලක් තියෙනවා, පර්චස් හතරක. ඒ අය පෙර පාසලක් හදන්න ගියාම ඒ භූමියේ ප්‍රමාණය අක්කර හතරක්. විශාල ඉඩමක්. ඒ ඉඩම අවශ්‍යයි කිව්වා පෙර පාසල හදන්න. දරුවන්ට පරිසරය තුළ විඳ දරාගන්න තියෙන විශේෂ අත්දැකීම් මේ සියල්ල විඳගන්න අවශ්‍ය කරන නිදහස් පරිසරයක් තුළ පෙර පාසලක් හදන්න ඕනැ කියන මතය තමයි ඒ ඔවුන් තුළ තිබුණේ. ජපානයේ කණ්ඩායමක්. ඔවුන්ගේ අදහස වුණේ එයයි. අපේ දෙමව්පියන් නිසා විශේෂයෙන්ම අද පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයකට එන ගුරුවරයා දැඩි අපහසුතාවට පත් වෙනවා. මූලික හේතුව, අපේ ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ දෙමව්පියන් මේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳව මනා අවබෝධයක් නැහැ. පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් තුළ දරුවාට අධ්‍යාපනයේ රුචිකත්වය ඇති කරන්න, පාරිසරික අත්දැකීම් ලබා දෙන්න, ජීවන අත්දැකීම් ලබා දෙන්න මේ දරණ වෑයම පෙර පාසල් පෙළ පොතට අනුකූලව ලබා දුන්නාට දෙමව්පියෝ සන්තෝෂ වෙන්නේ නැහැ. අම්මා බලාපොරොත්තු වෙන්නේ තමන්ගේ පුතා කවද්ද මගේ නම ලියන්නේ කියලා. අම්මා කියලා ලියන්නේ කවද්ද කියලා. තාත්තා බලාපොරොත්තු වෙනවා තාත්තා කියලා ලියන්නේ කවද්ද කියලා. අත මිට මොලවලා අකුරු ලියවනවා. අපට මතකයි අපේ පුංචි කාලයේ අපට ගල් ලෑල්ල අතට දීලා, ගල් කූර අතට දීලා 'අ' යන්න ලියලා 'අ' යන්න උඩ දහ පාරක් විතර ලියවනවා. ලියලා ඉවර වෙලා පෙළට ලියා ගෙන යන්න කියනවා. ගුරුවරයා ලියපු විධියට මම ලිව්වේ නැත්නම් මම ටොක්කක් කන්න ඕනැ. එහෙම නැත්නම් අත තද වෙන්න මිරිකලා ලියවනවා. එහෙම කාලවකවානුවක් අපේ පුංචිකාලයේ තිබුණේ. අද එහෙම නොවෙයි. අද දියුණු අධ්‍යාපන විද්‍යාඥයන්ගේ මතය වෙලා තියෙන්නේ, දරුවාගේ සිතට කිසිම අසහනයක් නොවන ආකාරයට අධ්‍යාපනයේ ප්‍රවේශය ලබා දීමට වැඩපිළිවෙළ සංවිධානය වෙන්න ඕනැය කියන මතය.

ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකුට තමන්ගේ ශිෂ්‍යයන්ට උගන්වන්න හරි ලේසියි. ඔහුට තියෙන්නේ පන්සියයක් විතර දේශන ශාලාවට කැඳවලා තමන්ට රිසි සේ මේ දේශනය පවත්වා ගෙන යාමේ කටයුත්ත කිරීමයි. කැමති ළමයා ලියා ගන්නවා. බැරි එක්කෙනා නිකං ඉන්නවා. නිකං හිටියා කියලා කිසි ප්‍රශ්නයක් ගුරුවරයාට නැහැ. නමුත් පෙර පාසලකට ළමයි විසි දෙකක් භාර ගන්නා ගුරුවරයා සමස්තයක්

වශයෙන් මේ හැම ළමයෙක් ගැනම පෞද්ගලික අවධානයට ලක් කර ගනිමින්, ඔවුන්ගේ විෂය ධාරාව තුළ ගුරුවරයා කටයුතු කරන කොට හැසිරෙන විධිය පිළිබඳව බලහත්කාරකම් කරලා විනය පාලනයක් නොකර බොහොම කරුණාවෙන් දයාවෙන් මේ ටික ඒ දරුවාගේ ශරීරගත කරන්න විදින දුක කරදර වේදනා, කිව්වාම ඉතා අමාරු කතාන්දරයක්. ඒ නිසා මම හිතන්නේ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකුටත් වඩා සංකීර්ණ වැඩ කොටසක් පෙර පාසල් ගුරිවරියකට තමන්ගේ දරුවන් වෙනුවෙන් ඉෂ්ට කිරීමට සිදු වෙනවා. ඒ නිසා මෙය ඉතාම විධමත් ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම මුළු සමස්ත අධ්‍යාපන රටාවටම වැදගත් කාරණාවක්. දරුවාට අධ්‍යාපනය කෙරේ ඇතිවන රුචිකත්වය, අවධානය, ඒ පිළිබඳව විවිධ විෂයයන් හැදෑරීම විනෝදාංශයක් බවට පත් කර ගැනීම, ගුරුවරයා ඉතාම සොඳුරු වස්තුවක් ලෙස දරුවා තුළ ආකර්ශනීය තත්ත්වයන් ඇති වීම කියන මේ සියල්ල දරුවාගේ ජීවිත අධ්‍යාපනය කියන එකට ඇති වන කැමැත්ත හෝ අකමැත්ත මත තීන්දු වෙනවා.

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

ඒ නිසා මෙය ඉතාම වැදගත් සංකීර්ණ අවස්ථාවක්. මේ අවස්ථාව පිළිබඳව අපි රටක් හැටියට අධ්‍යාපන ක්‍රමවේදය සකස් කිරීමේදී පල්ලෙහාට දාලා, මෙය අධ්‍යාපනය පිළිබඳ ඉතාමත් ප්‍රවීන ආයතනයකට නැතුව, නිකම් පළාත් පාලන ආයතනයකට වුණත්, පළාත් සභාව ඉතාම දැඩි අධීක්ෂණය යටතේ, පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ විෂය බද්ධ කාරණාව පිළිබඳ විශාල අවධානයකින් හා අවබෝධයකින් කටයුතු කරමින් - ප්‍රඥප්තියේ අඩුපාඩු තිබෙනවා නම් නැවත ඒවා සංශෝධනය කරමින් මේ විෂයට අවශ්‍ය කරන පරිසරය සකස් කිරීම ඉතාම වැදගත් කාරණාවක් හැටියට මා දකින්නේ. අපේ පෝල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කළා දරුවන්ගේ පෝෂණය සම්බන්ධව. දරුවන්ගේ පෝෂණය පිළිබඳව කථා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් තිබෙන්නේ. රට තුළ දරුවන්ට ගැලපෙන පෝෂ්‍යදායී ආහාර නැතිකම නිසා නොවෙයි, අද රූපවාහිනිය සහ විවිධ මාධ්‍ය ජාලයන් තුළ බහුජාතික සමාගම්වලින් දූෂණය කරපු පරිසරයක් තුළ, දෙමව්පියන්ටත් දරුවන්ටත් පෝෂණය කියන විෂය පිළිබඳව කථා කරන්නවත්, ඒ තුළ හැසිරෙන්නවත් තියෙන මානසිකත්වය ගිලිහී ගොස් තිබෙන නිසා. ඒ නිසා හරිම අවාසනාවන්තයි. ඉතාමත් පෝෂ්‍යදායී ආහාර වටපිටාවේ පිරී තිබෙනවා. අවශ්‍ය ප්‍රමාණයට දරුවාට පෝෂණය ලබා දෙන්න. නමුත් ඒ ආහාර වේල් දහයක් පාවිච්චි කරන්න යන වියදම එක ආහාර වේලකට පාවිච්චි කරලා දරුවාව රෝගී තත්ත්වයට පත් කරන පරිසරයක් සකස් වෙලා තියෙනවා. මේවා පිළිබඳව දැඩි ලෙස අවධානයට ලක් කරමින්, අපි මේ විෂයෙන් විෂය, කාරණාවෙන් කාරණාව වෙන් වෙන්ව අරගෙන දරුවාගේ පෝෂණය සහ අධ්‍යාපනය කියන මේ විෂය මාතෘකාව යටතේ කතිකාවතක් ඇති කරලා ඔවුන්ගේ අනාගතය යහපත් කරවීම සඳහා අප විසින් විධිමත්ව කටයුතු කළ යුතුව තිබෙනවා. අපි සර්ම කලාපීය රටක ජීවත් වන මිනිසුන්ට ගැලපෙන පරිදි මේ පරිසර පද්ධතිය තුළ දරුවාගේ අහාර වේල සහ ආහාර රටාව සකස් කිරීම තුළත්, අධ්‍යාපනය විධිමත්ව ලංකර දීම තුළත් අපි නැවත වතාවක් සිතා බැලීමට සුදුසු අවසථාවක ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මගේ ගෞරවය සහ ප්‍රසාදය එතුමාට පිරිනමමින් ගරු සභාපතිතුමාටත්, මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[ අ.භා. 12.30 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මේ යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීම පිළිබඳව. විශේෂයෙන් මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා නම් මොන ආකාරයටද ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා එලෙස තම අදහස් දැක්වීම පිළිබඳව. මම ඉතාම කෙටියෙන් කිව්වොත් අපේ පෝල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා හා අනික් මන්ත්‍රීවරු පෝෂණය පිළිබඳව ඉතා වටිනා අදහස් ඉදිරිපත් කළා. ඇත්තටම මම මේක කරපු නිසා දන්නවා. මෙහි මහා ලොකු ගැටලුවක් නැහැ. පෝෂණය කියන්නේ පළාත් පාලන ආයතනයකට - පළාත් පාලන ආයතනයේ සභාපතිතුමාටත් හොඳයි මේ වැඩපිළිවෙළ. මොකද? මට ඒක සාර්ථක වුණ නිසා මම මේ කියන්නේ. මම පෙර පාසල ගැන ලොකු විධියට හිතුවේ නැහැ. ගමක පිහිටවපු පෙර පාසලකට අනූ දෙනෙක් හදා ගත්තා. ඒ ගමේ ඉන්න දානපතීන් අනූ දෙනාට භාර දුන්නා, ඒ දරුවන් ගේ පෝෂණ කටයුතු. එතකොට අවුරුද්දේ මාසෙකට එක දවසයි එක්කෙනෙකුට එන්නේ. මාස හයකට එක්කෙනයි. අවුරුද්දට දෙවතාවයි. එයා දරුවන්ගේ සම්පූර්ණව පෝෂණ කටයුතු ටික භාරව කටයුතු කළා. ඒක මට ඡන්දේදීත් ලොකු වැඩ පිළිවෙළක් වුණා. ගමේ දේශපාලන නොකරන මධ්‍යස්ථ අනූ දෙනෙක් ඡන්දෙදි මට පොඩි සහයෝගයක් දෙන්න හිටයා. මේක පළාත් පාලන ආයතනයේ සභාපතිතුමාටත් හොඳයි. ඒ අයත් බොහොම සතුටින් දුප්පත් දරුවන්ට උදව් කරනවා. ඒක ලෙහෙසි කාර්යයක් පළාත් පාලන ආයතනයකට. එහෙම තමයි මම පෝෂණ වැඩ පිළිවෙළ අපි බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ අපි මන්ත්‍රීවරු සියලු දෙනා එකතු වෙලා කටයුතු කළේ. ඒකයි මම කිව්වේ. මේක පළාත් පාලන ආයතනයකට හරි පහසුයි කරන්න කියලා. ඒ නිසා මේ කියැවුණු කරුණු සියල්ල සත්‍ය දේවල්. ආදරය කරුණාව කියන එක නම් පැහැදිලිවම තියෙන්න ඕනෑ.

මොකද මම අවසාන වශයෙන් කියන්නේ ආදරය, කරුණාව - මම මේ ඊයේ පෙරේදා දැක්කා අධ්‍යාපනය සම්බන්ධ ව්‍යාපෘති වාර්තාවක්. පුහුණු වෙන්න පාසලකට දාලා. ඒ පුහුණු වෙන්න දාපු මහත්මිය හදලා තිබුණා ව්‍යාපෘති වාර්තාවක්. ව්‍යාපෘති වාර්තාව හදන්න එයා තෝරා ගෙන තිබුණේ, 11 වසරේ පාසලේ ඉන්න, ගුරුවරු දඩබ්බරයි, මේ ගොල්ලන්ට උගන්වන්න බැහැ කියලා පැත්තකට දාල හිටිය දරුවෝ තුන්

දෙනෙක්. මේ ව්‍යාපාති වාර්තාව හදන්න මාස හයක කාලයක් එයා අරගෙන තිබුණා. එයා පාසලේ ඉඳගෙන පාසලේ පුහුණුවීම් කටයුතු කරන ගමන් තමයි මේක කරලා තිබුණේ. මුලින්ම ඒ දරුවෝ තුන් දෙනා මෙහෙම වෙන්න හේතුව හොයලා තිබුණා. හේතුව හොයන කොට මේ දරුවෝ තුන් දෙනාට පොඩි කාලයේ ඉඳන්ම, පෙර පාසලේ ඉඳන්ම ආදරය කරුණාව කියන දෙය ලැබිලා තිබුණේ නැහැ. ඒ ව්‍යාපෘති වාර්තාවේ පැහැදිලිව කියලා තිබුණා ඒ දරුවෝ තුන් දෙනාගෙන් එක දරුවෙකුගේ අම්මා විදේශගත වෙලා. අනෙක් දරුවාගේ තාත්තා හොඳටම බීමට හුරු වෙලා. ඔන්න ඔහොම ප්‍රශ්න ගණනාවක් වෙලා තිබුණා. අවසානයේ මේ ව්‍යාපෘති වාර්තාව හදලා ඉවර වෙන කොට, ඒ ව්‍යාපෘති වාර්තාව හදපු ඒ මහත්මිය ඒ දරුවන්ට දක්වපු ආදරය කරුණාව නිසා – මුලින්ම ප්‍රශ්න පත්තරයක් දීලා තිබුණා විෂය උගන්වන ගුරුවරුන්ට මේ දරුවෝ තුන් දෙනාගේ අදහස් කියන්න කියලා. ගරු සභාපතිතුමනි, ඒ හැම ගුරුවරයෙක්ම කියලා තිබුණේ මේ දරුවෝ තුන්දෙනාව හදන්න බැහැ. නරකයි කියලා. ව්‍යාපෘති වාර්තාව හදලා අවසන් වුණාට පස්සේ ප්‍රශ්න පත්තරේ දුන්නාම ඒ ව්‍යාපෘති වාර්තාවේ හැම ගුරුවරයෙක්ම කියලා තිබුණේ මේ දරුවෝ තුන් දෙනා දැන් ඉතා හොඳයි කියලා. අර ව්‍යාපෘති වාර්තාව හදලා එළියට යනකොට ඒ දරුවෝ තුන් දෙනා අඬලා තිබුණා, ඒ ගුරුතුමිය ඒ ඉස්කෝලෙන් යනවා කියලා. ඒ පාසලේ හොඳම දරුවෝ තුන් දෙනා බවට පත් වෙලා තිබුණා. මම ඒකයි කියන්නේ මුල ඉඳන්ම ආදරය, කරුණාව මේ සියල්ල අවශ්‍ය වෙනවා. ඒක මම මතක් කරමින් නැවත නැවතත් මේ යෝජනාව ගේන්න අවස්ථාව ලබා දුන් ගරු සභාපතිතුමා, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලු දෙනාටම මගේ ගෞරවණීය ස්තුතිය පුද කරමින් මේ වෙනුවෙන් කථා කරපු, අදහස් දැක්වූ සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්තීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ පිළිබඳ සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ අදට නියමිත දෙවැනි යෝජනාව. මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

# නෙළුම් පොකුණ මාවත හා ආනන්ද කුමාරස්වාමි මාවත
NELUM POKUNA MAWATHA AND ANANDA KOOMARASWAMY MAWATHA

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාව වන්නේ,

*“බස්නාහිර පළාතේ මෙන්ම විශේෂයෙන්ම කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ මංමාවත් නම් කිරීමේදී අනුගමනය කළා වූ අගය කළ යුතු කටයුත්තක් වූ, එනම් රටට, ජාතියට, ආගමට මෙන්ම කලාව, සාහිත්‍ය ඇතුළු විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දේශීයව මෙන්ම විදේශීයවද අතිමහත් සේවාවන් ඉටු කරමින්, අප මව්බිමේ කීර්තිනාමය ලොව සුපතල කළ විද්වතුන්, සම්භාවනීය පුද්ගලයින් සිහිවන පරිදි රටේ ප්‍රසිද්ධ ස්ථාන, මංමාවත් එතුමන්ලාගේ නමින් නම් කර තැබීම ඔවුන් වෙත පුදනු ලබන උපහාරයකි.*

*එමෙන්ම එතුමන්ලාගෙන් ඉටුවූ සේවාව කෘතවේදීව, නිරන්තරයෙන් සිහිපත් කිරීමට අපේක්ෂා කරන රටේ අනාගත පරපුරටද, එමගින් අත්වනුයේ මහත් පිටුවහලකි.*

*ඒ අනුව එක් පසෙකින් කොළඹ කලාගාරය, නව නගර ශාලාව, මහවැලි කේන්ද්‍රය ද අනෙක් පසින් කොළඹ මහජන පුස්තකාලය, විහාර මහා දේවී උද්‍යානය ද සහිතව කලාවට ප්‍රමුඛස්ථානය දෙන ආයතනවලින් සමන්විත වූ මාර්ගය, කලාව පිළිබඳ ලොව පිළිගත් විශාරදයෙකු වූ ද විද්‍යාඥයකු හා දාර්ශනිකයකු වූ ද, භාෂාවන් පිළිබඳ ප්‍රඥයෙකු වූ ද, ආනන්ද කුමාරස්වාමි විද්වතානන් නමින් නම් කරන ලද්දේ, එතුමන් සැමරීමට මෙන්ම එතුමන් හට කරන උපහාරයක් ද වශයෙනි.*

*එහෙත් වර්තමානයේ මෙම ඓතිහාසික මාර්ගය නෙළුම් පොකුණ මාවත නමින් නම් කිරීම මගින් හෙළිදරව් වනුයේ මෙරට සංස්කෘතියේ හා සදාචාරයේ අන්ත පරිහානියයි.*

*ඒ නිසා මෑතකදී නගරයට එක්වූ නෙළුම් පොකුණ රඟහල එනමින් තිබියදීම නෙළුම් පොකුණ මාවත ලෙස නම් කරන ලද්දා වූ, ඓතිහාසික ආනන්ද කුමාරස්වාමි මාවත සුපුරුදු එම ගෞරවනීය නාමයෙන් නම් කර, එම ප්‍රඥයාණන්ගේ ගෞරවය හා අභිමානය ආරක්ෂා කළ යුතු යැයි, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි.”*

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

*[විසින් ස්ථිර කරන ලදී.]*
*[Seconded]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව සම්බන්ධව ඔබතුමාට විනාඩි පහක කාලයක් ලබා දෙනවා. මම ඉතාමත්ම ගෞරවයෙන් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාට වෙන්කර ඇති නියමිත කාලයට කථාව අවසන් කරන්න. එතකොට අපට පහසු වෙනවා නියමිත වේලාවට සභාව අවසන් කරන්න.

[ අ.භා. 12.39 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම සංතෝෂ වෙනවා. ඒ වාගේම අපි දන්නවා මේ රටේ ඉතිහාසය ගොඩ නගපු, රටට යම් සේවයක් කරපු යම් යම් පුද්ගලයන්ගේ නම්වලින් කොළඹ නගර සභා බල ප්‍රදේශය

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

තුළ යම් යම් පාරවල් නම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නා විධියට සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මාවත, ටී.බී.ජයා මාවත, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, ඒ වාගේ පාරවල් නම් කරලා මේ රටට සේවය කරපු ශ්‍රේෂ්ට පුද්ගලයන් ගැන යම් මතකයක් මේ රටේ පරපුරට තියා ගන්න අපි ක්‍රියා කරලා තියෙනවා. අපි දන්නවා විශේෂයෙන්ම ඔවුන්ට ඒ ගෞරවය කරන්න තමයි ඔවුන්ගේ නම්වලින් මේ පාරවල්වලට නම් තියලා තියෙන්නේ. ඔවුන් මේ රටේ කරපු සේවය ගැන යම් ඇගයීමක් හා ඒ වාගේම අනාගත පරපුරට යම් මතකයක් හා සිහිවටනයක් හැටියට තමයි අපි මේ නම් කරන්නේ. අපි දැක්කා පසුගියදා විශේෂයෙන්ම නෙළුම් පොකුණ රඟහල ඉදිකිරීමත් සමගම ඒ ආනන්ද කුමාරස්වාමි කියන මාවත නෙළුම් පොකුණ නම කියලා වෙනස් කළ අයුරු.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ඒක ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාට කරපු අගෞරවයක් හැටියට තමයි මම දකින්නේ. ඔහු මේ රටේ ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයෙක් වුණත් මේ රටේ කලාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරපු පුද්ගලයෙක්. ඒ වාගේම ඉන්දියානු කලාව පිළිබඳවත් ආසියාවේම විශාල ප්‍රකට වූ විද්වතෙක් හැටියට තමයි අපි සියලු දෙනාම ඔහුව දන්නේ. මම හිතනවා සමහර විට ලංකාවටත් වැඩිය ඉන්දියාවේත් විශේෂයෙන්ම ප්‍රසිද්ධ කෙනෙක්. ඇත්තටම කලාව පිළිබඳ නොවෙයි, ඔහු ඔහුගේ අචාර්ය උපාධිය පවා සිදු කළේ. නමුත් ඔහු කලාවට සම්බන්ධ වුණා. ඔහු කලාවට සම්බන්ධ වෙලා කලාව පිළිබඳව ඔහු කළ දේවල්වලින් - මම හිතනවා ඔහු ලොව ප්‍රකට වුණෙත් ඒ කලාව පිළිබඳ කරපු මහා සේවය උඩ තමයි. ඒ නිසා ඔහුට විශාල ගෞරවයක් මුළු ලෝකය පුරාම තියෙනවා. එහෙම පුද්ගලයෙකුගේ නමක් අපි අලුතෙන් ගොඩ නගපු ස්ථානයක නමක් දමන්න, ඒ නම වෙනස් කිරීම මම හිතන්නේ ඒ තරම්ම උචිත නැහැ. එහෙමනම් අපට තිබුණා, නෙළුම් පොකුණ රඟහලට එතැන තියෙනවා වටරවුමක්. අපට අවශ්‍ය නම් එතැන නෙළුම් පොකුණ වටරවුම කියලා ඒකේ නම වෙනස් කරන්න තිබුණා. නමුත් ඒ කිසි දෙයක් කරන්නේ නැතුව ඒ ආනන්ද කුමාරස්වාමි කියන නම එතැනින් අයින් කිරීම මම හිතනවා ඒක විශාල වරදක්. මම හිතන්නේ මේ මොහොතේ කරපු ලොකු වරදක්. සමහරවිට ඔහු ද්‍රවිඩ ජාතිකයෙක් හින්දද දන්නෙත් නැහැ ඒ නම වෙනස් කළේ. එහෙමත් ගැටලු මතු වුණා. එහෙමත් පුවත්පත්වල පළ වුණා. ඒක මම දන්නේ නැහැ. සමහර විට එම පාර අනගාරික ධර්මපාල මාවත කියලා තිබුණා නම් සමහර විට ඒක වෙනස් නොවෙන්නත් ඉඩ තිබුණා. එහෙමත් වෙන්න පුළුවන්. එහෙමත් කල්පනා කරන්න පුළුවන් කෙනෙකුට. එහෙම නොවෙන්නත් ඉඩ තිබුණයි කියලා. මොකද, ආනන්ද කුමාරස්වාමි මහතාගේ නම ඒ පාරට යෝග්‍ය වුණේම ඒ පාරේ තියෙනවා කලාවට සම්බන්ධ ආයතන ගණනාවක්. විශේෂයෙන්ම විහාරමහා දේවී උද්‍යානය, කලා භවන, ජෝන් ද සිල්වා සමරු රඟහල, මහවැලි කේන්ද්‍රය, ඒ කලාවට සම්බන්ධ ඒ සියලු ආයතන ඒ පාරේ පිහිටලා තියෙන නිසා තමයි ඒ පාරට ආනන්ද කුමරස්වාමි මාවත කියන නම යෝජනා කළේ. වෙන හේතුවක් නොවෙයි. ඒ නිසා ඒ නම ඒ පාරට උචිතයි. ඒ නිසා එතැනට නෙළුම් පොකුණ රඟහල ආවයි කියලා එතුමාගේ නම එහෙම්මම තිබ්බයි කියලා, ආනන්ද කුමාරස්වාමි මාවත නම එතැන තිබුණයි කියලා නෙළුම් පොකුණට කිසිම අසාධාරණයක් වන්නේ නැහැ. මොකද, එතුමා ශ්‍රේෂටයින් එක්ක වැඩ කරපු කෙනෙක් නිසා. ඒ නිසා මම හිතනවා අපි මේ රටේ ශ්‍රී ලාංකිකයන් හැටියට ඔවුන් කරපු ඒ විශාල සේවය වෙනුවෙන් ඔවුන්ට කෘතගුණ සැලකීමක් හැටියට මේ නම් වෙනස් කරන්න එපා. අපි මේවා වෙනස් කළොත් අපේ අනාගත පරම්පරාවට අපි දෙන ආදර්ශය, අපි දෙන පණිවිඩය ඉතාම වැරදි පණිවිඩයක් හැටියට මේවා යන්න පුළුවන්. මේවා වැරදි අදහස් හැටියට සමාජයට යන්න පුළුවන්. ඒ නිසා ඒක මගේ පෞද්ගලික අදහසක් හැටියට, ඒ නම නැවත වතාවක් ඒ පාරට නම් කළ යුතුයි. ඒ ආනන්ද කුමාරස්වාමි කියල තිබුණ නම ඒ නෙළුම් පොකුණ රඟහල ළඟින් පටන් ගන්නා ඒ පාර කොල්ලුපිටිය හන්දියේ ලිබර්ටි ප්ලාසා දක්වා ඒ පාර දිවෙනවා. ඒ පාර පටන් ගත්ත තැන සිටම නැවත වතාවක් ආනන්ද කුමාරස්වාමි කියන නම ඒ පාරට දැමිය යුතුයි කියලා තමයි මගේ යෝජනාව. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති රංජිත් සෝමවංශ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [ සුනිල් විජෙරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළගට ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක රේණුක පෙරේරා මැතිතුමාට අවස්ථාව - විනාඩි 15 ක් නියමිතව තිබෙනවා.

[ අ.භා. 12.45 ]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මුජිබර් රහුමාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධව කථා කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මම කනගාටු වෙනවා, මුජිබර් රහුමාන් මන්ත්‍රීතුමා වාගේ කෙනෙක් අන්ත වාමාංශික පක්ෂයකින් දේශපාලනය ආරම්භ කරලා, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අද අන්ත ජාතිවාදී පදනමකට ඇද වැටීම පිළිබඳව. දිගින් දිගටම ජාතිවාදය ඉස්මතු කරමින්, ජාතිවාදී ගිනිදැල් අවුළුවමින් මේ රට ඉතාමත් අභාග්‍ය සම්පන්න තැනකට ගෙන යාමට හැම මොහොතම උත්සාහ කිරීම මෑත කාලයේ හරිම කනගාටුදායක තත්ත්වයක්. මම එහෙම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආනන්ද කුමාරස්වාමි මාවත නාමය වෙනස් කිරීම - ආනන්ද කුමාරස්වාමි කියන මාවතේ නම සම්පූර්ණයෙන්ම ඉවත් කරලා නැහැ. මම හිතන්නේ මේ නම, නම් කරපු වෙලාවේත් එතුමා මේ සම්බන්ධව සභාවේ ප්‍රකාශයක් කළා. ඒ සම්බන්ධව එතුමා අදහස් පළ කළා. මේක නැවත යෝජනාවක් හැටියට ගෙනැල්ලා ජාතිවාදය ඉස්මතු කිරීමට කටයුතු කිරීම - මේක ද්‍රවිඩයෙකුගේ නමක් නිසා වෙනස් කළාද කියලා නැවත විවිධ අර්ථකථන දෙමින් කනගාටුදායක පහත් තත්ත්වයකට මේ දේශපාලනය ගෙන යාම පිළිබඳව ඇත්තෙන්ම අපි කනගාටු වෙන්න ඕනෑ. කුහකත්වයයි, ජාතිවාදයයි කියන දේවල් මේ යෝජනාවේ තුළ ගැබ් වෙලා තියෙනවා. ආනන්ද කුමාරස්වාමි මහතා පිළිබඳව මේ රටේ සෑම කෙනෙකුගේ තිබුණු ගෞරවය කොයි යම් ආකාරයක හෝ අඩුවක් වෙලත් නැහැ. එහෙම අඩුවක් වෙන්න දෙන්නෙත් නැහැ. මොකද, ඒ තරම් රටට වටිනා මහත් සේවාවක් කරපු ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ලෝකයේ බබලවන, අදටත් එතුමා ජීවතුන් අතර නැති වුණත්, එතුමා නිර්මාණය කරන ලද කෘතීන් ලෝකය අගයන මහා ශ්‍රේෂ්ඨ ප්‍රාඥයෙක්. ඒ නිසා එතුමාගේ කීර්තිය පිළිබඳව කොයි යම් ආකාරයක හෝ අවතක්සේරු කිරීමක් මෑත කාලයේ සිදු වෙලා නැහැ. මම ඒකට ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. අද ඔබතුමන්ලා සියලු දෙනාටම මේ ආරාධනා පත්‍ර භාර දුන්නා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පවත්වන ගරු අභිමානී උත්සවයේ. ඒ කියන්නේ, ලියුම් කවරයේ බැලුවත් මම හිතන්නේ ඒ තත්ත්වය මැනවින් පැහැදිළි වෙනවා. ඒකෙත් තියෙන්නේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අංක 76, ආනන්ද කුමාරස්වාමි මාවත, ග්‍රීන්පාත්, කොළඹ 07. ගැසට් පත්‍රයත් මගේ ළඟ තිබෙනවා. මම ඒකත් ඉදිරිපත් කරන්නම්. පළමුවෙන්ම මම මේ යෝජනාවේ සංශෝධනයක් ඉදිරිපත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ දෙවැනි ඡේදයේ - මම හිතන්නේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ යෝජනාව කියවලාවත් නොවෙයි ස්ථිර කළේ. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට සිංහල භාෂාව හැසිරවීමේ යම් අපහසුතාවයක් නිසා එතුමා යෝජනාව සකස් කිරීමේදී වචනයක අඩුපාඩුවක් සිද්ධ වුණාද කියලා මම දන්නේ නැහැ. එහෙත් ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාට සිංහල භාෂාව පිළිබඳව වරදිනවයි කියන්නේ හරි කනගාටුදායකයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දෙවැනි ඡේදයේ,

*"එමෙන්ම එතුමන්ලාගෙන් ඉටු වූ සේවාව කෘතවේදීව, නිරන්තරයෙන් සිහිපත් කිරීමට අපේක්ෂා කරන රටේ අනාගත පරපුරටද, එමගින් අත්වනුයේ මහත් පිටුවහලකි."*

මේ පිටුවහල කියන්නේ අර ගුණරත්නම්ට කළේ. නේද? අර ඔස්ට්‍රේලියා පුරවැසියාට. ඔහුව ඔස්ට්‍රේලියාවට පිටුවහල් කළා. ඒ පිටුවහල් කළා. ඒක තමයි පිටුවහල් කරනවා කියන්නේ. මේක "*පිටිවහලක්*" කියලා නිවැරැදි විය යුතුයි. සිංහල වචනය වෙන්නේ පිටිවහලක්. මේ පිටුවහල් කරනවා කියන එක වෙන එකක්. ආනන්ද කුමාරස්වාමි මැතිතුමාගේ මේ යෝජනාව සම්බන්ධව සිංහල භාෂාව පවා - මම හිතන්නේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා යෝජනාව ස්ථිර කිරීමේදී ඒ පිළිබඳව බැලුවා නම් අඩු ගාණේ එතුමාට ඒ සහයෝගයවත් දෙන්න තිබුණා. පක්ෂය ඇතුළේ තිබෙන අර්බුද මේ අවස්ථාවේදී පෙන්වා දීම හරිම කනගාටුදායකයි. කොහොම නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේදී වල්පල් කිසිම දෙයක් කීමට අවශ්‍ය නැහැ. මේ නෙළුම් පොකුණ මාවත යනුවෙන් නම් කරලා තිබෙන්නේ කොළඹ සෙන්බ්‍රිජ්ට් වටරවුමේ ඉඳලා ග්‍රීන්පාත් වටරවුම දක්වා කොටස පමණයි. කොල්ලුපිටියේ සිට දිගමට මේ පාර ආනන්ද කුමරස්වාමි මාවත හැටියට තමයි තිබුණේ. මේ කොටස -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලියුම් කවරේ -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ලියුම් කවරේ විතරක් නොවෙයි. මේ තියෙන්නේ ගැසට් එක.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෝඩ් ගලවලා. බෝඩ් තියෙනවාද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

බෝඩ් තියෙනවා. දැනුත් තියෙනවා. ඔබතුමා ගිහිල්ලා බලන්න. මේ ගැසට් පත්‍රය මම කියවන්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෝඩ් නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

බෝඩ් තියෙනවා. දැන් ගිහිල්ලා බලන්න කෝ? මේ බලලා නැහැ. නිකම් බොරුවට ජාතිවාදය අවුළුවන්න කොහෙන් හරි කොණක් හොයන පහත් තුට්ටු දෙකේ නිර්ලජ්ජී දේශපාලනය. පහත් තුට්ටු දෙකේ නිර්ලජ්ජී දේශපාලනයට වැටිලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා තමයි එහෙම කරන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මගේ කථාව අහගෙන ඉන්න. කුලප්පු වෙන්න එපා අහගෙන ඉන්න. අමන දේශපාලනයට බැහැලා මඩ ගොහොරුවේ එරිලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගිහිල්ලා බලන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

බොරු කියන්න එපා. දැනුත් ගිහිල්ලා බලන්න. දැනුත් ගිහිල්ලා බලන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා නිකම් බොරුවට -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තියෙන්නේ රජයේ ගැසට් පත්‍රය. අතිවිශේෂ ගැසට් පත්‍රය. 2011 දෙසැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා - 2011.12.08.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතිවාදය අවුස්සන්නේ ඔබතුමා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ජාතිවාදය අවුස්සගෙන දඹුල්ලේ සිද්ධියත් දඩමීමා කරගෙන පාසල්වල ප්‍රශ්නත් ඇදගෙන ජාතිවාදය තමයි අවුළුවන්නේ. එවන් පහත් පෙළට වැටෙන්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආනන්ද කුමාරස්වාමි මහතා ශ්‍රී ලාංකිකයෙක්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ජාතිය පාවා දෙන්න එපා. මේ රටේ මුස්ලිම් ජාතික නායකයෝ, මේ රටේ ජාතික නිදහස වෙනුවෙන් සටන් කරපු මිනිස්සු අවස්ථාවාදී බඩගෝස්තර ජාතිවාදීන් නොවෙයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතිවාදය අවුස්සන්න එපා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මුස්ලිම් ජාතික නායකයෝ හිටියා ඒ මුස්ලිම් ජාතිකයෝ මේ රටේ ජාතික නිදහස වෙනුවෙන් සටන් කළා. තුප්පහි දේශපාලනය කරන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආනන්ද කුමාරස්වාමි මහතා ශ්‍රී ලාංකිකයෙක්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක තමයි අපිත් කියන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතිවාදය අවුස්සන්න එපා. ජාතිවාදය අවුස්සන්නේ ඔබතුමා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක තමයි අපිත් කියන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආනන්ද කුමාරස්වාමි මහතා නොවෙයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

මේ සභාව අනවශ්‍ය තැන්වලට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මගේ කාලය ලබා දෙන්න. තුට්ටු දෙකේ, පහත් පෙළේ, සක්කිළි දේශපාලනයට වැටිලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මම භය නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි කොහොමත් භය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා අසුන් ගන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපිත් භය නැහැ. අපිත් භය නැහැ ඔය කිසි දේකට. ඔයිට වඩා කට්ටිය අපි දැකලා තියෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔයිට වඩා ලොකු මිනිස්සු අපි දැකලා තියෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි දැකලා තියෙනවා. අපිත් දැකලා තියෙනවා. අපි දන්නවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔයාට වඩා ලොකු චන්ඩි අපි දැකලා තිබෙනවා. අපි භය වෙන්නේ නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපි දන්නවා කවුද කියලා. මට අමුතුවෙන් ඔයා ගැන කියන්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතිවාදය අවුස්සන්නේ ඔයා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මට අමුතුවෙන් ඔයා ගැන කියන්න එපා. මෙතැන ඉන්න අයගෙන් වැඩියෙන් ඔයාගේ දේශපාලනය දන්නේ මම.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ආනන්ද කුමාරස්වාමි කියන්නේ ශ්‍රී ලාංකිකයෙක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔව්. අපි කියන්නේත් ඒක තමයි. අපි කියන්නේත් ඒක තමයි. එවැනි ශ්‍රේෂ්ට මනුස්සයෙකුගේ නමක් භාවිතා කරමින් ජාතිවාදය අවුස්සන්න හදන්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා ජාතිවාදය අවුස්සන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා පොඩ්ඩක් මූලාසනයට සවන් දෙන්න. මම හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදීව කරුණු දැක්වීම ඉතාම සුදුසුයි. අනවශ්‍ය වාද විවාදවලට යන්න එපා. විශේෂයෙන්ම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාගේ කථාවට කිසි කෙනෙකුගෙන් බාධාවක් ඇති වුණේ නැහැ. ඒ වාගේම රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, අනවශ්‍ය කරුණුවලට ඉඩ සලසා ගන්නේ නැතුව ඔය සංශෝධනයත් එක්ක ඔබතුමාගේ කරුණු දක්වන්න කියලා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව කරන්න පසුව අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ගැසට් පත්‍රය කියවන්නම්. ගැසට් පත්‍රයේ උපලේඛනයේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා.

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - | කොළඹ මහ නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - | කොළඹ |
| 03. | වීථියේ වර්තමාන නම | - | ආනන්ද කුමාරස්වාමි මාවත සහ හෝර්ටන් වටරවුම |
| 04. | අලුතින් යොදා ඇති නම | - | නෙළුම් පොකුණ මාවත සහ නෙළුම් පොකුණ වටරවුම |
| 05. | මාර්ග විස්තරය | - | මෙම මාර්ගය සර් මාර්කස් ප්‍රනාන්දු මාවත අසලින් ආරම්භව කුරුඳුවත්ත නාගරික කොට්ඨාසයේ ආනන්ද කුමාරස්වාමි මාවතේ වරිපනම් අංක 86 සහ වරිපනම් අංක 110 හා ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත අසලින් අවසන් වේ.<br><br>ආනන්ද කුමාරස්වාමි මාවත හා හෝර්ටන් පෙදෙස අතර ආචර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවතේ ඇති වටරවුම. |

[ ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

මෙය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් තිබෙන රජයේ ගැසට් පත්‍රය. මම එය මේ අවස්ථාවේ සභාගත කරනවා.[3] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අර ආරාධනා පත්‍රයත් සභාගත කරන්න. ඔබතුමා ඒක ගෙනහැර දැක්වූවා.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පුළුවන්. ඒකේ ආරාධනා පත්‍රය නොවෙයි. ලියුම් කවරය මම සභාගත කරන්නම්.[4] ඒකෙයි ලිපිනය තිබෙන්නේ. ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආනන්ද කුමාරස්වාමි මහතාට ගරු කරනවා නම් අද රෑයේ නොවෙයි ගරු කරන්න තිබුණේ. මේ පාරේ ඔතැන නෙළුම් පොකුණ හදන්න ඉස්සෙල්ලා තිබුණේ නොමැඩිස් ක්‍රීඩාංගණය. රෑ 07.00 න් පස්සේ මෙතැන තියෙන්නේ බාර් එකක්. ආනන්ද කුමාරස්වාමි කියන මහ ප්‍රාඥයාට ගරු කරන්න අද අමාරුව, කැක්කුම හැදිලා තිබෙන පාදඩ දේශපාලනයේ යෙදෙන මිනිස්සුන්ට එදා උවමනාවක් තිබුණා නම්, ආනන්ද කුමාරස්වාමි කියන ශ්‍රේෂ්ට මනුස්සයාගේ නාමය තිබෙන මාර්ගයේ අරක්කු විකුණන මධ්‍යස්ථානයක් පවත්වන්නේ නැහැ. ඒකෙන් අරක්කු බීපු අය අද ආනන්ද කුමාරස්වාමි මහත්මයා වෙනුවෙන් කථා කරනවා. ඒකේ අරක්කු බීලා බේබද්දෝ හැටියට මාලිගාවත්ත පැත්තේ පිනුම් ගහපු අය අද ආනන්ද කුමාරස්වාමි මහත්මයාගේ අභිමානය ගැන කථා කරනවා. මේ අයට තමයි පහත් පෙළේ, තුට්ටු දෙකේ මිනිස්සු කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආනන්ද කුමාරස්වාමි මහත්මයාට ගරු කරනවා කියන්නේ -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඇයි නෙළුම් පොකුණ දැම්මේ? ඇයි නොළුම් පොකුණ දාන්න ගියේ? ඇයි මොකටද -

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කහින්න එපා. ඉන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔයාලා නේ දාගත්තේ? අපි යැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංවිධායකතුමා ඒ අරක්කු බීපු අය මේ ගරු සභාවේ නැහැ නේද?

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකේ බීපු අය කියන්න බැහැ. මොකද, අපි දන්න කාලේ ඉඳලා නොමැඩිස් ක්‍රීඩාංගණයේ අරක්කු විකුණනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අය මේ සභාවේ නැහැයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපව අමාරුවේ දාන්න එපා. මොකද මම බීලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බීලා නැහැ. මම ජීවිතයට අරක්කු නොබීපු මිනිහෙක් හින්දා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

---

[3] කථාව අවසානයේ පළ කර ඇත.
[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ඔබතුමාගේ වෙලාව පිළිබඳව -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්නයක් මතු වෙනවා. ඔබතුමාගේ කරුණු දැක්වීම සහ සංශෝධනයක් පිළිබඳව මට ඇහුනා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

සංශෝධනය තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කියන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip


ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නෙළුම් පොකුණ කියන එක සංස්කෘතික කේන්ද්‍රයක් හැටියට රජය විසින් දීර්ඝ කාලයක් තිස්සේ සැලසුම් කරලා සියලුම සංස්කෘතික ආයතන සම්බන්ධ සියලු මධ්‍යස්ථාන එක තැනකට කේන්ද්‍ර කරන්න තමයි සැලසුම් කළේ. ඒ අනුව තමයි නොමැඩිස් ක්‍රීඩාංගණය රජයට පවරාගෙන - මේක චීන රජයේ පරිත්‍යාගයක්. මහ විශාල පරිත්‍යාගයක්. නෙළුම් පොකුණ කියන නිර්මාණය මේ භූමියේ කළේ. එතකොට මේකේ නෙළුම් පොකුණ රංග ශාලාව නොවෙයි තියෙන්නේ. නෙළුම් පොකුණේ මහින්ද රාජපක්ෂ රංග ශාලාවයි තියෙන්නේ. ඒ කුහකත්වය තමයි මේ යෝජනාවෙන්ම තියෙන්නේ. මේ කුහකත්වය ඒක. නෙළුම් පොකුණ රංග ශාලාව කියලා කියනවා. නෙළුම් පොකුණ රංග ශාලාව නොවෙයි තියෙන්නේ. ඒ කුහකත්වය, ජාතිවාදයේ ජරා ජීර්ණ මළ කුණු මේ යෝජනාව තුළ සම්පූර්ණයෙන්ම ඇතුළත් කරලා තියෙනවා. සාමාන්‍යයෙන් ස්වභාවිකව දේශපාලනයත් එක්ක ඒ වාගේ කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. ඒ තරම් පහත් පෙළේ ක්‍රියාවකට තමයි මේ ඇවිල්ලා තියෙන්නේ. ආනන්ද කුමාරස්වාමි කියන ප්‍රාඥයාට දිය යුතු ගෞරවය, ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ගනිමින් මේ රටට චීන රජය කරන ලද පරිත්‍යාගය අගය කරමින්, ඒ නෙළුම් පොකුණ කියන මධ්‍යස්ථානය මුළු මහත් රටේම ඉන්න අහිංසක මිනිස්සුන්ට පහසුවෙන් ළඟා වෙන්න පුළුවන්, හඳුනා ගන්න පුළුවන් තැනක් හැටියට නෙළුම් පොකුණ මාවත කියලා නම් කළේ මේ ස්ථානයට ළඟා වීමේ පහසුව ලබා ගැනීම සඳහා.

ඒ වාගේම ආනන්ද කුමාරස්වාමි මැතිතුමා වෙනුවෙන් ගරු කරනවා නම් අපට තහනමක් නැහැ. අවසානයක් නැහැ. තවත් පුළුවන් අපට ගෞරව දක්වන්න. හුහක් දේවල් කරන්න. අපට නෙළුම් පොකුණ උස්සාගෙන යන්න පුළුවන්කමක් නැහැ. මොකද, නෙළුම් පොකුණ කියන නිර්මාණය මේ ජාතියට හම්බ වුණු මහ සම්පතක්. ඒ නෙළුම් පොකුණ කියන දේ වෙන තැනකට උස්සගෙන යන්න පුළුවන්කමක් නැහැ. ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට කරන ගෞරවය, ඒ ආකාරයෙන්ම ආරක්ෂා කරමින් නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවට ආසන්නම භූමි භාගයේ කොටස විතරයි නෙළුම් පොකුණ මාවත හැටියට නම් කළේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ යෝජනාවේ හතරවැනි ඡේදයේ ඉඳලා, එනම්, එහෙත් වර්තමානයේ මෙම ඓතිහාසික මාර්ගය නෙළුම් පොකුණ මාවත නමින් කියන කාරණයේ ඉඳලා තිබෙන කොටස සම්පූර්ණයෙන් බැහැර කරලා මම මේ ආකාරයට සංශෝධිත යෝජනාවක් සභාවට ඉදිරිපත් කරනවා.

*"එසේම වර්තමානයේදී ආනන්ද කුමාරස්වාමි නම් වූ මහා ප්‍රාඥයාගේ නමද ආරක්ෂා කරමින් චීන රජය මගින් අප රටට දායාද කළ නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල ආසන්න කොටස පමණක් චීන රජය කරන ලද පරිත්‍යාගයට ගෞරවයක් ලෙසත් අප රටේ කොළඹින් බැහැර ජනතාවගේ පහසුව උදෙසා ද නෙළුම් පොකුණ මාවත යනුවෙන් නම් කිරීම පිළිබඳව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව ස්තූතිය පුද කර සිටී."*

ඒ සංශෝධනය යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා, ජාතිවාදය කියන මහ ජරා ජීර්ණ මළ කුණ නැවතත් මේ රටේ ඉස්මතු කරන්න ඉඩ නොදේවා කියන ප්‍රාර්ථනාව කරමින්.

0789



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1735/32 - 2011 දෙසැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා - 2011.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

පළාත් පාලන නිවේදන

කොළඹ මහා නගර සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 71(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "නෙළුම් පොකුණ මාවත" යනුවෙන් නැවත නම් කරනු ලැබ ඇති බැව් සහ හෝර්ටන් පෙදෙස අසල ඇති වටරවුම නෙළුම් පොකුණ වටරවුම ලෙස නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. බී. ජයවර්ධන,
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව.

2011 දෙසැම්බර් මස 07 දින,
මහා නගර සභාව,
පුරහල,
කොළඹ 07.


උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - | කොළඹ මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - | කොළඹ |
| 03. | වීථියේ වර්තමාන නම | - | ආනන්ද කුමාරස්වාමි මාවත සහ හෝර්ටන් වටරවුම |
| 04. | අලුතින් යොදා ඇති නම | - | නෙළුම් පොකුණ මාවත සහ නෙළුම් පොකුණ වටරවුම |
| 05. | මාර්ග විස්තරය | - | මෙම මාර්ගය සර් මාර්කස් ප්‍රනාන්දු මාවත අසලින් ආරම්භව කුරුඳුවත්ත නාගරික කොට්ඨාසයේ ආනන්ද කුමාරස්වාමි මාවතේ වරිපනම් අංක 86 සහ වරිපනම් අංක 110 හා ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත අසලින් අවසන් වේ. ආනන්ද කුමාරස්වාමි මාවත හා හෝර්ටන් පෙදෙස අතර ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවතේ ඇති වටරවුම. |

12 - 829

1A - PG 001313— 385 (2011/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

0790



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 1735/32 - 2011 දෙසැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා - 2011.12.08
No. 1735/32 – THURSDAY, DECEMBER 08, 2011

(Published by Authority)

PART IV (B) — LOCAL GOVERNMENT

Local Government Notifications

THE COLOMBO MUNICIPAL COUNCIL

IT is hereby notified that the road described in the Schedule hereunder has been re-named as "Nelum Pokuna Mawatha" and that the Horton Roundabout as Nelum Pokuna Roundabout by the Honourable Chief Minister of Western Province Provincial Council and Honourable Minister in charge of the Subject of Local Government under Section 71 (1) of the Municipal Council Ordinance No. 29 of 1947 (Chapter 252) which shall read with the Section 02 of the Provincial Council's Act (Incidental Provisions) bearing No. 12 of 1989.

J. M. B. Jayawardena,
Municipal Commissioner,
Colombo Municipal Council.


Municipal Council,
Town Hall,
Colombo 07,
07th December, 2011.

Schedule

| | | | |
|---|---|---|---|
| 1. | Name of the Local Authority | - | Colombo Municipal Council |
| 2. | District | - | Colombo |
| 3. | Present Name of the Street | - | Ananda Kumaraswamy Mawatha and Horton Roundabout |
| 4. | New Name of the Street | - | "Nelum Pokuna Mawatha and Nelum Pokuna Roundabout" |
| 5. | Road Description | - | This road ends from near the Assessment Nos: 86 and 110 of Ananda Kumaraswamy Mawatha and Dr. C.W.W. Kannangara Mawatha within Cinnamon Garden Municipal Ward commencing from near Sir Marcus Fernando Mawatha. The Circus at the Dr. C.W.W. Kannangara Mawatha between Ananda Kumaraswamy Mawatha and Horton Place. |

12 - 829

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA. 1A



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

அதி விசேஷமானது

අංක 1735/32 - 2011 දෙසැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා - 2011.12.08
1735/32 ஆம் இலக்கம் – 2011 ஆம் ஆண்டு திசெம்பர் மாதம் 08 ஆந் திகதி வியாழக்கிழமை

(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)

பகுதி IV (ஆ) – உள்ளூராட்சி

உள்ளூராட்சி அறிவித்தல்கள்

கொழும்பு மாநகர சபை

1989 ஆம் ஆண்டின் 12 ஆம் இலக்க, உள்ளூராட்சிமன்ற (ஒழுங்குவிதிகள்) கட்டளைச் சட்டத்தின் 2 ஆம் பிரிவுடன் சேர்த்து வாசிக்கப்படவேண்டிய (252 ஆம் அத்தியாயம்) 1947 ஆம் ஆண்டின் 29 ஆம் இலக்க மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் 71 (1) ஆம் பிரிவின் கீழ் மேல் மாகாண உள்ளூராட்சி மன்றத்தின் முதலமைச்சர் மற்றும் மாகாண நிர்வாக விடய பொறுப்பான கௌரவ அமைச்சர் அவர்களினால் கீழே தரப்பட்டுள்ள அட்டவணையில் விபரிக்கப்பட்டுள்ள பாதையை "நெளும் பொகுன மாவத்தை" என்றும் ஹோர்ட்டன் சுற்று வட்டம் நெளும் பொகுன சுற்று வட்டம் என்றும் மீண்டும் பெயரிடப்பட்டுள்ளதாக இதன் பிரகாரம் அறிவிக்கப்படுகிறது.

ஜே. எம். பி. ஜயவர்தன,
மாநகர ஆணையாளர்,
கொழும்பு மாநகர சபை.

மாநகர சபை,
நகர மண்டபம்,
கொழும்பு 07,
07.12.2011.

அட்டவணை

| | | | |
|---|---|---|---|
| 1. | உள்ளூராட்சி நிறுவனத்தின் பெயர் | : | கொழும்பு மாநகர சபை |
| 2. | மாவட்டம் | : | கொழும்பு |
| 3. | பாதையின் தற்போதைய பெயர் | : | ஆனந்த குமாரசுவாமி மாவத்த மற்றும் ஹோரட்டன் சுற்று வட்டம் |
| 4. | புதிதாக இடப்பட்டுள்ள பெயர் | : | நெளும் பொகுன மாவத்த மற்றும் நெளும் பொகுன சுற்று வட்டம் |
| 5. | பாதையின் விவரம் | : | இப்பாதை சர் மாக்கஸ் பிர்னாண்டோ மாவத்தையிலிருந்து ஆரம்பித்து கருவாதோட்ட நகரப் பிரதேசத்தில் ஆனந்த குமாரசுவாமி மாவத்தையில் வரிபண இலக்கம் 86 மற்றும் வரிபண இலக்கம் 110 மற்றும் கலாநிதி சி. டபிள்யூ. டபிள்யூ கன்னங்கர மாவத்தையின் அருகில் முடிவடையும். ஆனந்த குமாரசுவாமி மாவத்த மற்றும் ஹோரட்டன் பிரதேசத்திற்கு இடையிலுள்ள கலாநிதி சி. டபிள்யூ. டபிள்யூ. கன்னங்கர மாவத்தையிலுள்ள சுற்று வட்டம். |

12 – 829

இலங்கை அரசாங்க அச்சுத் திணைக்களத்திற் பதிப்பிக்கப்பெற்றது.

1A

[ අ.භා. 12.59 ]

**îæóõô Æëõ ÆÕçõä°**
ගරු කුමරගුරුබරන්

îæóõô çðõêðê° êôðòèóˆ íô˜æÎó, ôïéëÁèæ Íñ°æðùê°êðù° ÎçòðÁðÕå°êèÙë° …ì ¡ä°× êëðïðù° Îçòùèë° öä°× åðéäæ°æðä°Î÷ä°. Though I have spoken English in the past meetings today I think it is better to speak in Tamil because some media says that I am being a Tamil I am not speaking Tamil; Really, I am worried to see æùèÎÁèæð Íäå°ê ÆëèõÒôèëð íô˜æÓéìÁ îçÁéõ ¡ô°ôóÔ Êýõë° Îæôùç°çÌê°Êôêèæ ¡å°ê òéç åìå°Ê îæèÈìéë Æ÷ðê°Ê, ãÈéëÁðÎù åèä° æôéùç°çÌæðä°Î÷ä°, Æ÷ðç°çèæ öñ°æóÊ ÍÓñ°æì°òðÁðÄéìÁ îæèõìè íô˜æó° Íäå°ê ÆëèõÒôèëðÁðÄéìÁ îçÁéõ ¡ô°ôóÔ Êýõë° ãÁ˜ê°êðç° Îçèì°Ì, Îçò°Ò ôïæ°æðÎù îòèù°ôè˜æó° çç°çèòðÁðù° Ö÷°×ôîêä°×, íç°çâÎÁ Ö÷°÷ðôðì°Ì íç°çâÎÁ îôì°â ôðÌôîêä°×, íç°çâÁèæê°êèä° Îçòðäè˜. ãÈéëÁðÎùÎÁ îæóõô ã×ç°çðä˜ ËÛðÇ˜ õàûëèä° íô˜æó° ¡å°ê çðÎõõéäéÁ îæèÈÌôå°êéëæ°æèæ åèä° íôÕæ°Æ åä°÷ð …÷ æìéëç° çì°âÕæ°æðä°Î÷ä°. Öîää°÷èù° íô˜ Ø˜ ¡Ý°ùèëðÁõèæ ¡Õå°ê îçèÏÊë°, Íäå°ê ÆëèõÒôèëð íô˜æéó ¡ùñ°éæÁõèæ çè˜ê°Êê°êèä° ¡å°ê çðÎõõéúéÁæ° îæèÈÌ ôå°êè˜. öñ°æÓéìÁ ÍÓë°æì°òðÁðä° çðõêèä Ö÷°çèì°ìèó˜ ÎõÚæ îçÎõõè íô˜æó°

îòèä°äÊ Îçèù íÎê çèééêÁê°êèä° åÐñ°æó° îçÁéõ ëè÷°÷ð ¡Õç°çêèæ ¡Õå°êèù°, æùèÎÁèæð Íäå°ê ÆëèõÒôèëð ëèôê°éê öä°× ¡Õå°ê øÕ çèõðÁ ôÐêðéÁ íéõôèòðÁèæ îôì°â ôðì°Â^æó°, íå°ê íéõôèòðÁèæ îôì°âÁ çèééæ°Æ üê°êê°éê åð×ê°êðÁêä° îçÁõèù° Ûäèêðçêð Áðä° îçÁéõ éôê°êðÕå°êèù° åèä° íéê çèõèì°âÁðÕç°Îçä°. Íäèù° Íäå°ê ÆëèõÒôèëðéÁæ° …ì íìæ°æ ËâÁèê "îåÙë° îçèÆú" öä°æðä°÷ îçÁÕæ°Æ öä°ä í^ê°êë° ¡Õæ°æðä°÷Ê. íå°ê ¡ìê°Êæ°Æ øÕ òðñ°æó í÷ðÑÕéìÁ îçÁéõ éôê°êðÕæ°æùèë°, íù°ùÊ üê°êê°éê åð×ê°êðäè^ öä°× ÛäèêðçêðÁðÄéìÁ îçÁéõ éôê°êðÕæ°æùèë°, íÊ Ö÷°×æ° îæèó°óæ° …âÁÊ öäÎô æùèÎÁèæð Íäå°ê ÆëèõÒôèëð öä°æðä°÷ øÕ ãùæë÷ðå°ê ëäðêÄéìÁ åðéäôèæ ¡ùñ°éæ íõòèñ°æë° êçèù° Ëê°êðéõ îôóðÁðì°ìÊ öä°× åèä° íä°× òå°ÎêèÜç°çì°Îìä°. Íäèù° ¡ä°× íå°ê çèééÊÁðä° îçÁéõ çèêðÁèæ ëè÷°÷ð ¡Õæ°æðä°÷Ð^æó°. öäÎô ¡äôèêë° ¡ù°éù öä°× îòèù°ùðæ° îæèÈÌ êÁÔ îòÁ°Ê ¡ç°çâÁèä îòÁù°æéó ¡ä°é÷Á æèù æì°ìê°êðÎù îòÁ°Á ÎôÈìèë° öä°× Îæì°Ìæ° îæèó°æðä°Î÷ä°.

Öîää°÷èù° åèñ°æó° ¡ùñ°éæÁ^ öä°× åðéäæ°æðä°÷ æèùê°éê ¡å°ê íõòèñ°æë° ãÕôèæ°æ ÎôÈÌë° öä°× åðéäê°Îêä° íù°ùÊ îÛäÐôèôð÷°Æç° çð÷ÎæÄë° åèñ°æó° ¡ùñ°éæÁ^ öä°× òðå°êðç°Îçèë° öä°× çè^ê°êèù° íç°çâÁèæ ¡ù°éù, Öîää°÷èù° ¡å°ê "îåÙë° îçèÆú" ôÐêð ëì°Ìëù°ù, êðÕæ°ÎæêÐÝ°ôõë° öä°æðä°÷ ¡å°Ê çðõÎêòê°êðÎù øÕ Îòæ°æðõì° çŒëðÁðÎù ¡ä°é÷æ°Æ åÐñ°æó° îçóê°ê ôðæèéõéÁæ° æì°â ¡Õæ°æðä°÷Ðè°æó°, øÕ îçóê°ê ÆÕëèéõ éôê°êðÕæ°æð÷Ð^æó°, "çðù°æðèðÎëÛ°" öä°× îòèù°ùð íé÷æéó æì°âÁðÕæ°æðä°÷Ðè°æó°, åèä° Æ÷ðç°çèæ öä°ÄéìÁ åú°ç^ îæóõô íééò°ò^ ãêÁ æë°ëä°çðù íô^æéóæ° Îæì°æðä°Î÷ä°, ò÷°× òðå°êðê°Êç° çèÕñ°æó° êë°Çó°éóÁðù° ¡Ý°ùèëðÁ^æóðä° çó°óð ¡Õç°çÊ êô× öä°÷èù°, êðÕæ°ÎæêÐÝ°ôõ Çäðê çŒëðÁðÎù öê÷°æèæ åÐñ°æó° ¡êéäæ° æì°Ìæð÷Ð^æó°. íñ°Îæ ¡õèÚô ôÐõ^æéóê° êôðõ øÕ îçóê°ê^ …ì ¡ù°éù. ¡ä°× æðéìê°êðÕæ°Æë° ÇêðÁ îòÁ°êð êðÕÎæèúëéù îçõðÁèÝ°çê°êðõðÁðù° æìå°ê Ëç°çê°Îêèä°çÊ ôÕì æèùëèæ ¡Õå°ê ¡å°Ê ÎæèÁðéù åæõ íçðôðÕê°êðæ°æèæ íæ÷°÷ ÎôÈÌë° öä°× ÁŒ.Â.Ö. Chairman æâêë° òÏêð ¡Õæ°æðä°÷è^. ò÷°× òðå°êðê°Êç° çèÕñ°æó° øÕ Îåèüó°ó ëäðêä° ÎÁèòðç°çÊ ÍÈìôÎä! öä°éäæ° æèç°çè÷°× öä°×, íê÷°æèæê°êèä° ÍÝ°çê°êðõðæóðÎù ÎæèÁðù°æéóæ° æì°âÁðÕæ°æð÷è^æó°, Îæèç°çèÁðù° ¡Õæ°æðä°÷ ¡å°Ê ÎæèÁðÙæ°Æ ãó°Îó îçóê°ê ôðæèéõéÁæ° æì°Ìæðä°÷Ð^æó°. öäÎô öÊ ¡äôèêë°? åèñ°æó° Öä° ¡ô÷°é÷ îòÁ°Á ÎôÈÌë°? îçóê°ê^æó° îçóê°ê^æóèæÔë°, ¡å°Êæ°æó° ¡å°Êæ°æóèæÔë°, ¡Ý°ùèëðÁ^ ¡Ý°ùèëðÁ^æóèæÔë° æìå°ê æèùñ°æóðÎù ¡Õå°êÊ Îçèä°× ¡Õç°Îçèëèæ ¡Õå°êèù° Öä° åèñ°æó° øÕ åù°ù òð÷Ð ùñ°æèéô ãÕôèæ°æ ËâÁèÊ. åèä° åðéäæ°æðä°Î÷ä° êëðï^æÎóè íù°ùÊ ¡Ý°ùèëðÁ^æÎóè ¡äôèêê°éêç° Îçòôðù°éù, åÐñ°æó° öñ°æéó òÏæèõ^æó° öä°×ë°, ¡å°ê åèì°âä° çðõéÛæó° öä°×ë° Îåòðê°Ê åìå°êèù° íç°çâÁèä çðõò°òéäæ°Îæ ¡ìëðù°éù. åù°ùðúæ°æë° ç÷°÷ð Îçò ÎôÈâÁ åèñ°æó° ¡ä°é÷æ°Æ îåÙë° îçèÆéúÁç° ç÷°÷ðç° Îçòðæ° îæèÈâÕæ°æðä°Î÷èë°. åèñ°æó° åù°ùðúæ°æë° ç÷°÷ð Îçò ÎôÈâÁ êÕúë° Íäèù° ¡ä°é÷æ°Æ øô°îôèä°é÷üë° ¡äôèêëèæê° êèä° çè^ê°Êæ° îæèÈâÕæ°æðä°Î÷èë°. ¡å°ê åðéù ëè÷ð åèñ°æó° øô°îôèÕôÕë° ¡ùñ°éæÁ^ öä°× òðå°êðæ°æ æìéëç°çì°âÕæ°æðä°Î÷èë°. íç°îçèÏÊ êèä° òð÷Ð ùñ°æèéô ãÕôèæ°æ ËâüÎë êôðõ, åèñ°æó° îçóê°ê ÎæèÁðù°æéóæ° æì°âæ° îæèÈÌë° íù°ùÊ ËÝ°ùðë° çó°óðéÁ ¡âê°Êæ° îæèÈÌë°, êë°Çó°éóÁðÙë° …ì ¡å°Êæ°æó° ôèï°å°êçâÁèù° ¡õÈÌ ÎæèÁðù°æó° ¡Õå°êä Íäèù° íñ°Æ ¡õÈÌÎë ¡âæ°æç°çì°Ì ôðì°ìä, íñ°Æ ê÷°ÎçèÊ ¡å°Êæ°æó° ¡ù°ùèê æèõúê°êðäèù° òÈéìÁðìôðù°éù ¡Êêèä° ¡ä°é÷Á åðéù öäÎô ¡å°ê åðéù ëè÷ð

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩි දෙකක වගේ කාලයක් තියෙන්නේ, මට ද්‍රවිඩ භාෂාව හොඳටම නොදැණුනත් ඉතාම සාරගර්භ අදහස් ප්‍රකාශ කරනවා. හැබැයි, මේ මාතෘකාවට ටිකක් අදාළව කථා කළොත් වඩාත් වැදගත් වෙනවා. ආනන්ද කුමාරස්වාමි මාවත සම්බන්ධවද ඔබතුමා කථා කරන්නේ ?

**îæóõô Æëõ ÆÕçõä°**
ගරු කුමරගුරුබරන්

åðò°òÁëèæ åèä° ¡å°ê ÎÁèòéä òë°ëå°êëèæê° êèä° îòèù°æðÎ÷ä° Íäå°ê ÆëèõÒôèëð ëèôê°ééÁ îåÙë° îçèÆéúÁèæ°ÆôÊë°, êë°Çó°éóÁðù° ãó°ó ¡Ý°ùèëðÁ çó°óðéÁ ¡âç°çÊë° öù°ùèÎë øä°×êèä°. ¡Ê òë°ëå°êëèæê° êèä° åèä° îòèù°æðä°Î÷ä° ¡å°ê åðéù ëè÷ ÎôÈÌë°. åèÄë° îæóõô íéëò°ò^ ãêÁ æë°ëä°çðù íô^æÓë° åÈç^æóèæ çóÆæðä°Î÷èë°, íÎêÎçèù° åèÄë° åÐñ°æÓë° åú°ç^æóèæ çóÆæðä°Î÷èë° Íäèù° íõòðÁùðù° ëì°Ìë° Öä° ¡å°ê Îçê°êéê Ö÷°çÌê°êð ¡å°ê åèì°éì Îæôùç°çÌê°êÊæðä°Î÷èë°, öä°÷ øÎõ øÕ æÕê°ÎêèÌ öäÊ Îçò°éò Ëâê°Êæ° îæèó°æðä°Î÷ä°.

[ අ.භා. 01.05 ]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1907 දී ශ්‍රී ලංකාවේ 20 වන ආණ්ඩුකාරවරයා විධියට ලංකාවේ වැඩ භාර ගත්තු ශ්‍රීමත් හෙන්ඩ්‍රි එඩ්වඩ් මැකලම් ආණ්ඩුකාරතුමාට ලිපියක් ලැබෙනවා. මේ ලිපියෙන් එක් කාරණයක් කියනවා. මේ රටේ සම්පත් හැකි පමණ කොල්ල කාගන්න. ඒකට කමක් නැහැ. මේ රටේ ජනතාව රිසි පරිදි හූරා කන්න. ඒකට කමක් නැහැ. හැබැයි එකම එක දෙයක් විතරක් කරන්න එපා. ඒ තමයි මේ රටේ පවතින සිංහල, බෞද්ධ, ගැමි සංස්කෘතිය විනාශ කරන්න එපා. එහෙම කියලා නතර වෙන්නේ නැතුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි - එහෙම කියන්න හේතුවක් තිබෙනවා. අදින් වසර සියයකට පසුව මේ ලෝකය මුහුණ දෙන දැවැන්ත, ආර්ථික, සංස්කෘතික, සමාජ අර්බුදයට බටහිර දර්ශනයන් තුළ උත්තරයක් නැහැ. හැබැයි, ඒ අර්බුදයට උත්තරය සිංහල, බෞද්ධ, ගැමි සංස්කෘතිය තුළ තිබෙනවා. ඒ යුගය උදා වනතෙක් මේ සංස්කෘතිය නොනැසී රැක ගැනීම ශ්‍රී ලංකාව පාලනය කරන ඉංග්‍රීසීන්ගේ වගකීමක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඓතිහාසික ප්‍රකාශය කරන්නේ සිංහලයෙක්වත්, බෞද්ධයෙක්වත් නොවෙයි. දෙමළ, හින්දු පඬිවරයෙක්. ඒ මහ පඬිවරයා තමයි අද අපේ මාතෘකාව වෙලා තිබෙන ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා. එතුමා සිංහලයෙක්, බෞද්ධයෙක් නොවුණාට සිංහල, බෞද්ධ උරුමය ගැන හඳුනා ගත්තු මේ එක පටු ගෝත්‍රයකට සීමා නොකර අනාගත ලෝකයේ දර්ශනවාදය විධියට සිංහල, බෞද්ධ සංස්කෘතිය දැකපු එකම විද්වතාණන්. ඒ නිසා එතුමා එතැනින් නතර වෙන්නේ නැහැ. එතුමා ඉතිහාසඥයෙක්. බුදු දහම සහ හින්දු ආගම පිළිබඳ පඬිවරයෙක්. දක්ෂ පරිපාලකයෙක්. භූ විද්‍යාඥයෙක්. ඒ වාගේම දාර්ශනිකයෙක්. මේ සියල්ලටම වඩා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක් මාතාව ලෝකය පුරා බබලවන්නට යෙදුණු විශිෂ්ට ලාංකික පුත්‍රයෙක්. මම සඳහන් කරන්නට යෙදුණා, එතුමා සිංහල, බෞද්ධයන්ට වඩා සිංහල බෞද්ධකම රැක්කා විතරක් නොවෙයි, බටහිර ලෝකයේ හින්දු සහ ඉන්දියානු චිත්‍ර කලාවේ තිබෙන දාර්ශනික පසුබිම ලෝකයට හඳුන්වලා දුන්නේත් ආනන්ද කුමාරස්වාමි මැතිතුමා. එතුමා සහ එතුමාගේ බිරිඳ විසින් රචිත මධ්‍යතන යුගයේ ශ්‍රී ලංකාවේ කලාවන් නැමැති ග්‍රන්ථයෙන් තමයි ශ්‍රී ලංකාව කියන්නේ විශිෂ්ට ශිෂ්ටාචාරයක් තිබෙන රටක්ය කියන කාරණය ලෝකය පුරා පැතිර ගියේ. ඒ වාගේම ශ්‍රී ලංකාවේ අපි අද මහඟු ලෙස භුක්ති විඳින සෑම ඛනිජ සම්පතක් පිළිබඳව, මැණික්ද, මිනිරන්ද, ඉල්මනයිට්ද මේ සියල්ලේම අයිතිය තිබෙන්නේ ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට. එතුමාගේ ආචාර්ය උපාධියට ලියපු ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සහ ඛනිජ සම්පත් විද්‍යාව. Ceylonese Minerals and Mineralogy කියන ග්‍රන්ථය ශ්‍රී ලංකාව මෙතරම් සම්පත් බහුල රටක් බවට ඉංග්‍රීසීන් හඳුන ගන්න යෙදුණා. ඒ නිසා ඉංග්‍රීසි ආණ්ඩුව එතුමාගෙන් ඉල්ලා සිටියා භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවක් පිහිටුවලා එහි ප්‍රධානියා විධියට කටයුතු කරන්න කියලා. අද තිබෙන භූ විද්‍යා පර්යේෂණ කාර්යාංශය විධියට ක්‍රමිකව විකාශනය වුණේ එතුමා ආරම්භ කරපු භූ විද්‍යා පර්යේෂණ දෙපාර්තමේන්තුව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විශිෂ්ට ලංකා පුත්‍රයා ගැන නොදන්නා කරුණු කිහිපයක් මේ සභාව ඉදිරියේ ගෙනහැර දැක්වුයේ, ජාතික හෙළ උරුමයේ නායකයෙක් විධියට කවුරු හරි මේ රටේ ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට හිමි තැන අහිමි කරන්න උත්සාහ කරනවා නම්, කවුරු හරි එතුමාගේ නම ඉතිහාසයෙන් මකා දමන්න උත්සාහ කරනවා නම් ඊට එරෙහිව පළමුව නැඟී සිටින්නේ අපයි කියන එක ඉතාම ගෞරවයෙන් මේ සභාවට මතක් කරන්න ඕනෑ නිසයි. එහෙම නම් මේ නම මාරු කරලා කියලා ලොකු චෝදනාවක් තියෙද්දී ජාතික හෙළ උරුමය බුදිද කියලා කාට හරි අහන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඒක මීට වඩා වර්ණවත්ව විස්තර කරන්න තේරෙන්නේ නැහැ. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉතාම විස්තරාත්මකව දත්ත සහ තොරතුරු ඇතුළත්ව මේ සභාවට කාරණා කිහිපයක් පෙන්නලා දුන්නා. පළමුවැනි කාරණය මේ නම ඉවත් කළේ නැහැ. ඇයි එහෙම නම් අඩුම ගාණේ මේ පාරේ කොටසක්වත් ඉවත් කළේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, චීනයෙන් අපට ලැබුණු තෑග්ග. නෙළුම් පොකුණ රඟහල. අපි ඉංග්‍රීසියෙන් කියනවා Land Mark එකක් කියලා. මේ රටේ සංකේතයක්. කොළඹ නගරයේ සංකේතයක්. අද බොහෝ දෙනෙක් නෙළුම් පොකුණ කොහේද තියෙන්නේ කිව්වාම

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා ]

දන්නවා. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව කොතැනද කියලා ඇහුවාම දන්නවා. එතකොට මේ නෙළුම් පොකුණ මාවත කියන ලිපිනය භාවිතා කිරීමෙන් එක පැත්තකින් අපට තෑග්ග දීපු චීනයට කළගුණ සැලකුවා වෙනවා. අනෙක් පැත්තෙන් පාරක් හොයාගෙන එන අයට නෙළුම් පොකුණ දන්න නිසා ඒ පාරේ ලිපිනයක් ඒ නමින් කිව්වාම හොයා ගන්න අපහසුතාවයක් නැතුව ඉතා පහසුවෙන් හොයා ගන්න පුළුවන් වෙනවා. අපි ආනන්ද කුමාරස්වාමි මැතිතුමා වෙනුවෙන් තවත් පාරවල් ඕනෑතරම් නම් කරමු. ඔය පාරේ එතුමා ජීවත් වෙලා නැහැ. එතුමා වෙනුවෙන් නම් කළා. ඒ වාගේම මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා වැරැදි තොරතුරක් පැවසුවා. මම නිවැරැදි කරන්න ඕනෑ. එතුමා ද්වේශයෙන් කරපු දෙයක් නොවෙයි. එතුමා දන්න ප්‍රමාණයෙන් ඒ කාරණය කිව්වේ. එතුමා කලාකරුවෙක් නොවෙයි.

අපි දන්නවා නෙළුම් පොකුණ රඟහල පාලනය කරනවා කර්නල් නිවුන්හැල්ල. එතුමා මේ නෙළුම් පොකුණ රඟහලේ පාලකයා විධියට කටයුතු කිරීම නිසා එතුමා කලාකරුවෙක් විධියට හඳුන්වන්න බැහැ. අපි ඉංග්‍රීසියෙන් කියනවා Curator තනතුර. කෞතුකාගාර, කලාගාරවල පරිපාලකයෙක් විධියටයි මෙතුමා කටයුතු කළේ. මෙතුමා චිත්‍ර ඇන්දේ නැහැ. චිත්‍ර විග්‍රහ කරමින් - ඉංග්‍රීසියෙන් විෂයයක් තිබෙනවා Symbolism. සංකේත විද්‍යාව. සංකේත විද්‍යාව හඳුන්වා දෙමින් අපේ ආසියානු චිත්‍ර පිටුපස තිබෙන දාර්ශනික පසුබිම ලෝකයට හඳුන්වා දීමයි කළේ. එතුමා චිත්‍ර ඇන්දේ නැහැ. ගීත ලියුවේ නැහැ. විශිෂ්ට ලේඛකයෙක්. ඒ නිසා කලාකරුවෙක් නිසා කලාවට අදාළ

ආයතන මේ පාරේ තිබෙන නිසා එතුමාගේ නමින් මේ පාර නම් කළාය කියන එකේ පදනමක් නැහැ. නමුත් එතුමාගේ නමින් මා හිතන්නේ පාරක් නොවෙයි, ගමක් නම් කළත් එතුමා කරපු විශේෂ සේවයට මම හිතන්නේ ඒක ගෞරවයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා වෙනුවෙන් අපි ජාතියක් විධියට පාරක් නම් කරලා තිබෙනවා. පාරේ දිග, පළල නොවෙයි වැදගත් වෙන්නේ. එතුමාට ගෞරව කරන්න පුළුවන් වෙන්නේ පාරක් නම් කරලා, ඒ පාරේ දිග පළල ගැන කෙටි කළාද, දික් කළාද කියලා වාද කිරීමෙන් නොවෙයි. එතුමාට ගරු කළ හැකි වන්නේ, එතුමා කියපු මතය අනුව තවත් වසර සියයකින් ලෝකය මුහුණ දෙන අර්බුදයට බටහිර දර්ශනයන්ට පිළිතුරු නැත. වසර සියය අපි දැන් පහු කරලා හමාරයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අද වසර 115 ක් ගත වෙලා තිබෙනවා. මේ රටේ අපේ සංස්කෘතියේ තිබෙන සරල ජීවන රටාව ඉල්ලමින් අද ලෝකයේ පරිසරවේදීන් හඬ නහනවා. අපි මේ සම්පත් නාස්ති කරන මේ ජීවන රටාවෙන් මිදිලා සරල ජීවන රටාවට නොගියොත් අපේ දරුවන්ගේ දරුවෝ මේ මහ පොළොව මත ජීවත් වන අවසාන පරම්පරාව වීමට ඉඩ තිබෙනවාය කියලා අද ලෝකය පුරා පරිසරවේදීන් කියනවා. නමුත් අපේ මේ සරල ජීවන රටාව ආනන්ද කුමාරස්වාමි මැතිතුමාගෙන් පස්සේ ලෝකයට හඳුන්වලා දෙන්න ඇත්තටම අපි කටයුතු කරලා තිබෙනවාද? ආනන්ද කුමාරස්වාමි මැතිතුමා බුදු දහම ගැන පළ කළ මතයන් එතුමාගෙන් පසුව බටහිර ලෝකයේ දාර්ශනිකයන් අතර සංවාදයට ලක් කරන්න අපි සමත් වෙලා තිබෙනවාද? ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට ගෞරව කළ හැක්කේ ඔහුගේ නමින් නම් කරන පාරේ දිග, පළල පිළිබඳව වාදවිවාද කරමින් නොව. ඔහු ගිය මග ගමන් කරමින් මේ රටේ උරුමය හදාරන්නටත්, ඒ උරුමය ලෝක ප්‍රචලිත කිරීමටත් කටයුතු කිරීමෙන් පමණක්ය කියන එක සිහිපත් කරමින් මා නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

[ අ.භා. 01.14 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවට අපේ අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දන්නවා ඕනෑම රටක ඉතිහාසය ගොඩ නහන්න උදව් වුණු පුද්ගලයන්, පුද්ගල කණ්ඩායම් සිටිනවා. ඒ අය වෙනුවෙන් ජීවත් වන වර්තමාන පරම්පරාවට කරන්න පුළුවන් දේවල් බොහොමයක් තිබෙනවා. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කිව්වා වාගේ කළ හැකි ඉහළම දේ තමයි ඔවුන් ඒ කරපු සේවය, රට පිළිගත්තු ඒ සේවය ඉස්සරහාට අරන් යන එක. හැබැයි ඒක ඒ විධියට නොවන හින්දා සංකේතාත්මකව වර්තමාන පරම්පරාව විසින් අනුගමනය කරන දේ තමයි ඒ ඒ පුද්ගලයාගේ නමින් එක්කෝ පාරවල් නම් කිරීම. එහෙම නැත්නම් ගොඩනැගිලි නම් කිරීම. එහෙම නැත්නම් ස්මාරක හැදීම. සමරු දින පැවැත්වීම ආදී දේවල්. එය අපි කල්පනා කරනවා ඉතිහාසයේ අවිච්ඡින්නතාවය, අඛණ්ඩතාවය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා විශේෂයෙන් වර්තමාන පරම්පරාවට ඒ ශ්‍රේෂ්ට පෞරුෂයක් සහිත නායකයන් දායාද කරපු දේවල් ඉදිරියට අරගෙන යාම සඳහා කරන හොඳ දෙයක්. එය සුළු වුණත්, හොඳ දෙයක්. ඒ නිසා පාරේ දිගෙන්, පාරේ පළලින් හෝ වෙනත් දේවල්වලට එය ලඝු කිරීම හෝ එහෙම නැත්නම් එය නොසලකා හැරීම වැරැදියි. දැන් අපි කල්පනා කළොත් එහෙම ආනන්ද කුමාරස්වාමි මැතිතුමා කියලා කියන්නේ සිංහලයෙක් හෝ ද්‍රවිඩයෙක් හෝ මුස්ලිම් ජාතිකයෙක් නොවෙයි. අපි කල්පනා කරන විධියට එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ශ්‍රී ලාංකිකයෙක්. එතුමාගේ පියා දකුණු ඉන්දියාවෙන් ආපු ලංකාවේ පළමුවෙනි නයිට් ගෞරව පදවිය ලබා ගත්තු මුදලියර් මුත්තු කුමාරස්වාමි. එතුමාගේ මෑණියන් බ්‍රිතාන්‍ය ජාතික කාන්තාවක්. එලිසබත් කියලා. එතකොට ජන්මයෙන් ගත්තොත් එහෙම බ්‍රිතාන්‍ය සහ දකුණු ඉන්දියානු ජන්මයක් තිබෙන්නේ. හැබැයි, එතුමා ඉපදුනේ ශ්‍රී ලංකාවේ. ශ්‍රී ලංකාවේ ඉපදිලා තමන්ගේ අධ්‍යාපනයෙන් ලංකාවේ විතරක් නොවෙයි, විශේෂයෙන් ඉන්දියානු කලාව සහ භාරතීය කලා ක්ෂේත්‍රයේ, අනෙක් පැත්තෙන් ගත්තොත් එහෙම දකුණු ආසියාවේ තිබෙන කලාව, සාහිත්‍ය ලෝකයට අරගෙන යන්න අතිවිශිෂ්ට මෙහෙවරක් කරපු විශිෂ්ට ගණයේ බුද්ධිමතෙක්. එය ශ්‍රී ලාංකිකයන් හැටියට අපි ආඩම්බර වෙන්න ඕනෑ. එහෙම කෙනෙක් අපේ මේ භූමියේ ජන්ම ලාභය ලැබීම සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙන්න ඕනෑ. ඔහුගේ අම්මා, තාත්තා කවුද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. ඒ නිසා අපි මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රේෂ්ට ශ්‍රී ලාංකිකයෙකුට කරපු අවමානයක් විධියට. අපි පාරක් නම් කරන්නේ ඇයි? පාරක් හෝ ගොඩනැගිල්ලක් නම් කරන්නේ ඔහුට කරන ගෞරවයක් විධියට. එහෙම නම් එයින් කොටසක් ඉවත් කරනවා කියලා කියන්නේ මොකක්ද? ඔහුට තිබුණු ගෞරවය කොටසකින් හරි ඉවත් කරනවා කියන එක. ඔහුට අවමාන කළා කියන එක. එහෙම නම් අපි එතුමාට දක්වපු ඒ ගෞරවය එලෙසම පවත්වාගෙන යන්න තිබුණා, මේ පාර නම් නොකළා නම්. ඒකත් හරි. හැබැයි පාර නම් කරලා, භාගයක් අයින් කරනවා. සම්භවය කවුද කියන එක අදාළ නැහැ. ඔබතුමා කල්පනා කරලා බලන්න, අර ITN එකට යන පාර වික්‍රමසිංහපුර, බත්තරමුල්ල. මහ උත්සවයක් තියලා ඒ පාර කලින් නම් කළා බලන්ගොඩ ආනන්ද මෛත්‍රී නායක හාමුදුරුවන්ගේ නමින්. පොඩි දවසයි තිබුණේ. ඒ ආයතනයෙන් විරෝධයක් ආවා. වාණිජ අරමුණු වෙනුවෙන්, ඒක අයින් කළා. දැන් බලන්ගොඩ ආනන්ද මෛත්‍රී හාමුදුරුවන් වාගේ ශ්‍රේෂ්ට හාමුදුරු කෙනෙකුගේ නමක් තිබුණු පාරක් වාණිජ අරමුණු වෙනුවෙන් අයින් කළා. ඉතින් මේ තීන්දු ගැනීම සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ. ඉතිහාසයට පිටුපස හරවලා හරි යන්නේ නැහැ. ඉතිහාසයට පස්ස හරවලා හරි යන්නේ නැහැ.

මේ නෙළුම් පොකුණ රඟහල ගැන කථා කළොත් එහෙම විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණේ අපට විජිත හේරත් ගරු මන්ත්‍රීතුමා සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා වෙලා ඉද්දිද්දී මේක අපි ඉස්සෙල්ලා පටන් ගත්තු වැඩක්. නෙළුම් පොකුණ රඟහල කියලා කියන්නේ අපට ඉස්සෙල්ලා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඉන්න කාලේ ගිවිසුම් ගහලා පටන් ගත්තු වැඩක්. හැබැයි, ඒක ඒ තරම් වේගයෙන් ඉස්සරහාට ගියේ නැහැ. ඒ නිසා අපත් මැදිහත් වෙලා මේක රටේම ශ්‍රේෂ්ට කලා කේන්ද්‍රයක් විධියට ගොඩ නඟන්න උදව් කරපු තැනක්.

ඒ නිසා අපි කල්පනා කරනවා. හරි නම් මේ රඟහල වුණත් නම් කරන්න තිබුණේ මේ රටේ ජාතික සමගියට විශිෂ්ට දායාදයක් එකතු කරන්න පුළුවන් විධියට. මේ රටේ කලාව ලෝකයට ගෙන ගිය පුද්ගලයෙකුගේ නමින්. නිකම් මේ පින්සලක්වත් අල්ලපු නැති, එක වන්නමක් දන්නේ නැති, තාලම්පටක් අල්ලපු නැති කෙනෙකුගේ නමින් නොවෙයි. එය කරන්න තිබුණේ, ශ්‍රේෂ්ට කලාකාරයෙකුගේ නමින්. නෙළුම පොකුණ රඟහල විතරක් නොවෙයි, නෙළුම් පොකුණ මාවත විතරක් නොවෙයි, මේ සියලු ප්‍රදේශය හරි නම් ආනන්ද කුමාරස්වාමි මහත්මයාගේ නමින් නම් කරන්න තිබුණා. එහෙම වුණොත් තමයි අපට චීනයටත් පෙන්වන්න පුළුවන්කම ලැබෙන්නේ. චීනයේ ජාතිකත්වයන් 56 ක් එකතු කරගෙන චීන ජාතිය හදලා, චීන ජාතිය හද හදා ලෝකයේ ඉස්සරහාට යනකොට ඔන්න අපට චීනයට කියන්න පුළුවන් මෙන්න බලන්න අපි ආනන්ද කුමාරස්වාමි මහත්මයාගේ නමින් නම් කළා. ඔබටත් හොඳයි. එහෙමයි. දැන් මේකෙන් භාගයක් අයින් කළාට පස්සේ වෙන වැඩේ තමයි එතුමාටත් අවමානයක් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මේක සුළු සිදුවීමක් විධියට අපට අහක දාන්න බැහැ. ඇයි? මම උදේත් කථා කළා වාගේ අවුරුදු 30 ක බෙදුම්වාදී යුද්ධයකින් බැට කාපු රටක්. ජාතිවාදය, බෙදුම්වාදය දක්වා වර්ධනය වෙලා ත්‍රස්තවාදී යුද්ධයක් දක්වා පරිවර්තනය වුණේ සුළු සුළු සිදුවීම් එකතු වෙලා. දැන් මේ සිදුවීම - අපි දන්නවා යුද්ධය නිසා දෙමළ ජනතාව අතර විරසකයක් තිබෙනවා. හිත් බිඳීමක් තිබෙනවා. අවිශ්වාසයක් තිබෙනවා. මොකද, ඒ දවස්වල උතුරෙන්, නැගෙනහිරෙන් කවුරු හරි දෙමළ ජාතිකයෙක් ආවා නම් බැලුවේ අවිශ්වාසයෙන්, සැකයෙන්. අපේ ප්‍රධාන වගකීම තමයි යුද්ධය ඉවර වෙලා අවුරුදු තුනකට පස්සේ ඒ අවිශ්වාසය බිඳ වට්ටන්න ඕනෑ. අපි ජාතික සමගිය හදනවා නම් මුලින්ම විශ්වාසය හදන්න ඕනෑ. සත්‍ය හෙළිදරව් කරලා විශ්වාසය හදන්න ඕනෑ. මෙවැනි දෙයක් කළාට පස්සේ - අපි දන්නේ නැහැ මේක කරනකොට ආණ්ඩුවේ මොන අදහසක් තිබුණාද කියලා. හැබැයි මෙහි ප්‍රතිඵලය ගැන තේරුම් ගත යුතුව තිබුණා. ඕනෑ නම් ඕනෑම ජාතිවාදියෙකුට - දැන් ආණ්ඩුවෙන් චෝදනා කළා වාගේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා - මම හිතන්නේ නැහැ එතුමා එහෙම කියලා. හැබැයි ඕනෑම ජාතිවාදියෙකුට පුළුවන් මේක අවුස්සලා ආයිමත් ජාතිවාදී මතවාදයක් හදන්න. මෙන්න බලන්න ආනන්ද කුමාරස්වාමි මහත්මයා දෙමළ වීම නිසා මේක අයින් කළා කියලා ජාතිවාදී මතයක් හදන්න ඉඩකඩ තිබුණා. ඒ අවස්ථාව දිය යුතු නැහැ.

ඒ නිසා තමයි මෙවැනි සිදුවීම් වළක්වන්න ඕනෑ කියලා අපි කියන්නේ. තමුන්නාන්සේ දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මඩකලපු නගරයේ තිබුණු ගාන්ධි ප්‍රතිමාව, බේන් ෆවල් ප්‍රතිමාව තවත් ද්‍රවිඩ ජාතික නායකයෙකුගේ ප්‍රතිමාව බිඳ හෙළුවා. මේවා කළේ කවුද කියලා අපි දන්නේ නැහැ. අපට අරංචි විධියට ඒ පළාත් සභාවේ කෙනෙකුත් සම්බන්ධයි. හැබැයි මේ වාගේ සිදුවීම් එකතු වුණාට පස්සේ මොකද වෙන්නේ? මෙවැනි සිදුවීම් එකතු වුණාට පස්සේ වෙන්නේ නැවත වතාවක් ජාතික සමගිය පලුදු වෙන එක. ඒ නිසා ජාතික සමගිය ගොඩ නඟන්න නම් මෙවැනි සිදුවීම් ගණන් ගත යුතුයි. මෙය නිකම් හුදු ජාතිවාදී කෝණයෙන් හරි වෙන වෙන කෝණවලින් බලලා හරි යන්නේ නැහැ. ඒ නිසා දැන් රටේ මතු වෙමින් තිබෙන තත්ත්වය. අපි සියලු දෙනාම මේකට වග කියන්න ඕනෑ. මේ තත්ත්වයත් පෙරළා අනික් පැත්තට හරවන්න අපි සියලු දෙනාම දායක වෙලා වැඩ කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. දැන් අපි අහනවා මොකක්ද ප්‍රශ්නය? ආණ්ඩුවේ තිබෙන සමහර උත්තර ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීට ඉස්සෙල්ලාත් කිව්වා ආණ්ඩුව හිතාගෙන ඉන්නවා ජනතාව ලේසියෙන් රවට්ටන්න පුළුවන් කියලා. ජනතාවට මොකක්වත් තේරෙන්නේ නැහැයි
[ ගරු නලින්ද ජයතිස්ස ]

කියලා. අර මම එක දවසකුත් හෝටල් සිද්ධියක් ගැන කිව්වා. මේකත් ඒ වාගේ. දැන් නෙළුම් පොකුණු කියලා අකුරු හයේ නමක් දාගත්තාට පස්සේ රටේ ජනතාවට හරි ෂෝක් එකට Address එක හොයා ගන්න පුළුවන් කියලා තමයි දැන් උත්තරේ කියන්නේ. මිනිස්සු කවුරු කියලාද හිතාගෙන ඉන්නේ? Address එක හොයා ගන්න පුළුවන් විධියට. මොකක්ද මේ? එහෙම නොවෙයි. නිකම් හිතන්න කොහේ හරි වරායක් හැදුවොත් ඒ වරායට දානවා රාජපක්ෂ මහත්මයාගේ නම. කොහේ හරි ඉස්කෝලයක් හැදුවොත් ඒකට දානවා රාජපක්ෂ මහත්මයාගේ නම. කොහේ හරි ක්‍රීඩාංගණයක් හැදුවොත් දානවා රාජපක්ෂ මහත්මයාගේ නම. කොහේ හරි නැටුම් ශාලාවක් හැදුවොත් දානවා රාජපක්ෂ මහත්මයාගේ නම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ වෙලාව අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ (බාධා කිරීම්) මේ සම්පූර්ණ මාවතම ආනන්ද කුමාරස්වාමි මහත්මයාගේ නමින්

නම් කරන්න. මෙය බරපතළ සිදුවීමක් විධියට අරගෙන මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. මූලාසනයෙන් හැමදාම මතක් කරනවා වාගේ මතක් කරන්න ඕනෑ. මේ යෝජනාව අතිශයින් වැදගත් යෝජනාවක්. ඉතින් ප්‍රජාතන්ත්‍රවාදීව අදහස් ප්‍රකාශ කරන්න කාටත් ඉඩකඩ තිබෙනවා. ඉතින් ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ප්‍රකාශ කරගෙන ගිහිල්ලා ලස්සන කිරි භාජනයකට අවසාන මොහොතේ ඉතින් ගොම බිංදුවක් දාගන්න වෙලාවලුත් තියෙනවා. ඒකට මූලාසනයට කරන්න දෙයක් නැහැ. හැබැයි මම හිතනවා නිවැරැදි වෙන එක වඩා හොඳයි. ඒ වාගේම මේ වැදගත් යෝජනාව අවස්ථාවේදී තැන් තැන්වල කථා බහ යනවා. මූලාසනයෙන් අපි අවවාද කළාම ඒක නරකටත් හිතනවා. හැබැයි යෝජනාව අතිශයින් වැදගත් යෝජනාවක්. ඒ නිසා නිවැරැදි වෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් නියමිතව තිබෙනවා.

[ අ.භා. 01.24 ]

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ වාගේ වැදගත් යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කිරීම ගැන අපේ සහෝදර මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට. මේ යෝජනාවෙන් එතුමා කුමක් අරමුණු කළත්, මේ යෝජනාව ආණ්ඩු පක්ෂයට ලබා දීපු විශාල ආශිර්වාදයක් හැටියටයි මා දකින්නේ. මෙම පාර නම් කිරීම සම්බන්ධයෙන් ගැසට් නිවේදනය මම හිතන්නේ නැහැ මේ රටේ ජනතාවගෙන් **5%** ක්වත් කියවා තියෙනවා කියලා. අඩු තරමින් මන්ත්‍රීවරුන් හැටියට අපිත් ඔබතුමාගේ යෝජනාව නිසා තමයි අපි මේ ගැසට් පත්‍රය බලන්න පෙළඹුණේ. ඒ නිසා අද ඔබතුමා කරලා තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුව විසින් ආනන්ද කුමාරස්වාමි මාවත කියන නම මකා දැම්මේ නැත. එය ගැසට් පත්‍රයක් මගින් ස්ථාවර කර තිබෙනවාය කියන මතය මේ ජනමාධ්‍ය හරහා මුළු රටටම කියන්න අපට අවකාශය ලබා දීමයි. ඒ ගැන පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ උගත් මිත්‍රයා, අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ආනන්ද කුමාරස්වාමි මැතිතුමාගේ ජන්මය සම්බන්ධයෙන් යම් යම් කාරණා මතු කෙරුවා. ඇත්ත වශයෙන්ම ආනන්ද කුමාරස්වාමි කියන්නේ රිදී හැන්දක් කටේ ගෙන ඉපදුණු දරුවෙක්. ඔහුගේ තාත්තා තමයි මුත්තු කුමාරස්වාමි මහත්මයා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කථා කරන්න බැරුව ඇති.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

අපේ පැත්තේ වගේම මොළේ කකුල් දෙකේ තිබෙන මන්ත්‍රීවරු තමුන්නාන්සේලාගේ පැත්තේත් ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියාගෙන ආවේ රිදී හැන්දක් කටේ ගහගෙන ආවා කියලා කියන්නේ යම් ආප්තයක්. ආප්තයක් කියන්නේ ආප්පයක් නොවෙයි. මොකද, ආප්ප නමින් හඳුපු මන්ත්‍රීවරුත් මේ සභාවේ කාලයක් හිටියා. ඔය හෝමාගම පැත්ත නියෝජනය කරමින්. මොකද ආප්තයක් කිව්වාම ඒක ආප්පයක්ද කියලා අහයි කියලා හිතපු නිසා තමයි ඒක ආප්පයක් නොවෙයි කියලා කිව්වේ. රිදී හැන්දක් කටේ ගහගෙන උපදිනවා කියලා කියන්නේ ජීවිතය රෝස මල් යහනාවකින් ආරම්භ කරපු, ජීවිත පටන් ගත්තු පුද්ගලයන්ට. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා රිදී හැන්ද කටේ ගහගෙන ඉපදුණු නායකයෙක්. ඒ වාගේම තමයි කුමාරස්වාමි මැතිතුමාත් උපදින්නේ රිදී හැන්ද කටේ ගහගෙන. මුතු කුමාරස්වාමි කියන ශ්‍රී ලාංකිකයෙක් විධියට පළමුවරට ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ බැරිස්ටර්වරයෙක් හැටියට දිවුරුම් දුන්නු ඒ පුද්ගලයාගේ සහ එංගලන්ත ජාතික මාතාවකගෙන්, එනම් එලිසබත් මහත්මියට දාව උපදින මේ නායකයා දෙමළ ජාතියට අයිති නායකයෙක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නායකයා තමයි පළමුවරට සිංහල ජාතිය වෙනුවෙන්, සිංහල ජාතියේ අභිමානය වෙනුවෙන්, සිංහල සංස්කෘතිය වෙනුවෙන්, සිංහල කලා ශිල්ප වෙනුවෙන් තමන්ගේ හඬ ජාත්‍යන්තරයට අවදි කරපු නායකයා. ඇත්තෙන්ම ඔහු දේශපාලනයට ආවා නම් මේ රටේ අග්‍රාමාත්‍ය ධුරයට වඩාත්ම සුදුසු පුද්ගලයා වන්නේ ආනන්ද කුමාරස්වාමි මැතිතුමයි කියන එකයි මගේ විශ්වාසය. ඒ නිසා මේ ආණ්ඩු පක්ෂයේ අපි කිසිවෙකුටත් ආනන්ද කුමාරස්වාමි මැතිතුමා පිළිබඳව ගැටළුවක් නැහැ. ඇත්තෙන්ම එතුමා වෙනුවෙන් මේ පාර නොවෙයි, පිළිරූ නොවෙයි, කොළඹ නගරය නම් කළත් අපි ඊට විරුද්ධ වන්නේ නැහැ. නමුත් අවාසනාවකට අපි මේක පිළිගන්න ඕනෑ. නෙළුම් පොකුණ ඉදි වෙන්නේ ඒ මාර්ගය ආසන්නයේ. නෙළුම් පොකුණ අපට වෙනත් තැනකට ගෙන යන්න ඉඩකඩක් තිබුණේ නැහැ.

ඒ නිසා තමයි ආණ්ඩුව තීරණය කරන්නේ මේ උදාර ශ්‍රී ලාංකිකයාගේ නම අයින් කරන්නේ නැතුව ඒ නෙළුම් පොකුණ ආශ්‍රිත කලාපයට විතරක් මේ නම යොදා ගන්න. අයින් කරලා නැහැ. ගැසට් පත්‍රය සභාගත කරලා තිබෙනවා. තමුන්නාන්සේලාට ඒක කියවන්න පුළුවන්. මෙතැනදී වැරැදි ආකල්පයක්, වැරැදි මතයක් ලෝකයට, රටට යන වෙලාවේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනැල්ලා ඒක නිවැරැදි කරන්න අපට උදව් කරලා තිබෙනවා කියන එක බොහොම නිහතමානීව මම සඳහන් කරන්න ඕනෑ. මෙතුමා 1877

අගෝස්තු මාසේ 22 වැනිදා උපදින්නේ කොළඹ, කොල්ලුපිටියේ. අපට පුළුවන් තමුන්නාන්සේලා කියනවා නම් ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට මේ සිද්ධියෙන් යම්කිසි අගෞරවයක් වුණා කියලා ඒ වැරැද්ද නිවැරැදි කරන්න එතුමා ඉපදුණු ඒ භූමි ප්‍රදේශය තුළ පාරක්, ප්‍රදේශයක්, වටරවුමක් එතුමාගේ නමින් නම් කරලා. ආණ්ඩුව ඒ සඳහා නිර්ලෝභීව ඉදිරිපත් වෙන්න සූදානම්. ඒ නිසා මේ අවස්ථාවේදී අපි බොහොම වගකීමෙන් යුතුව කියන්න ඕනෑ, ආනන්ද කුමාරස්වාමි මැතිතුමාගේ ගෞරවාන්විත නාමය ඉස්සරහාට දාලා යම්කිසි පටු දේශපාලන අරමුණක් ඉෂ්ට කර ගන්න කවුරු හරි සූදානම් වෙනවා නම්, අපි ඒ සඳහා අපේ විරුද්ධත්වය පළ කරනවා. ඇත්තෙන්ම ආනන්ද කුමාරස්වාමි මැතිතුමා, ඒ දාර්ශනිකයා, ඒ ප්‍රාඥයා ඒ යුගයේ සම්භාවනාවට, ගෞරවයට පාත්‍ර වුණේ නැහැ. ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ දෙපා ලෙවකමින් පහතරට සිංහලයන් ක්‍රිස්තියානි ආගම වැළඳගෙන ඔවුන්ගේ ජාවාරම්වලට හවුල් වෙලා, කිසිදු ඉවක් බවක් නැතුව පෙරේරලා, සිල්වලා, ප්‍රනාන්දුලා, සොයිසලා සල්ලි හම්බ කරගෙන, හම්බ කරගෙන යන වෙලාවේ මෙලෝ රහක් නැතුව සල්ලි පස්සේ දහලන වෙලාවේ මධ්‍යතන යුගයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මදකට අසුන් ගන්න. සභාවේ කාලය දීර්ඝ කළ යුතුයි.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි** – සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය විනාඩි 15 දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

අල්මේදලාත් අයිතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni de Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සොයිසලා ආගම වෙනස් කරලා නැහැ. එහෙම සොයිසලාත් ඉන්නවා. මම මේ වෙලාවේ ඒකත් මතක් කරනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මගේ සහෝදර මන්ත්‍රීතුමා, සුමිත් ද සොයිසා මැතිතුමාගේ පියා මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක සාමාජිකයෙක් විධියට මේ රටේ සිංහල බෞද්ධ ප්‍රගතිශීලී ව්‍යාපාරයට නායකත්වය දීපු නායකයෙක්. එතුමා මේ කොහේවත් යන තොප්පියක් ඔළුවේ දාගන්න හදනවා. මම කථා කළේ එහෙම ජාතියට ජීවය දුන්නු පෙරේරලා, සොයිසලා, ප්‍රනාන්දුලා ගැන නොවෙයි. මම කථා කළේ එදා අධිරාජ්‍යවාදී සුද්දන්ගේ පිටිපස්සේ ගිහිල්ලා ඔවුන්ගේ සපත්තු ලෙවකමින්, ඔවුන්ගේ කොන්ත්‍රාත් ව්‍යාපාර කරමින්, කෝපි වතු වවමින්, රේන්ද කරමින් කෝටි ගණන් සල්ලි හම්බ කර ගත්තු යුගයක සිංහලයේ මධ්‍යතන කලාව ගැන, චිත්‍ර ගැන, සාහිත්‍ය ගැන පොතක් ලියනවා කියන්නේ උඩුගම් බලා පිහිනීමක්. ඒ පොත ඒ යුගයට නොවෙයි වටින්නේ. ඒ පොත වටින්නේ අදට. එදා ඒ පොත සමාජය පිළිගත්තේ නැහැ. එදා කිව්වා නම් කෝපි වවන්නේ කොහොමද, අරක්කු රේන්දයක් ටෙන්ඩර් කරලා ගන්නේ කොහොමද කියලා පොතක් ලිව්වා නම් ඒ පොතට තමයි එදා කළු සුද්දන්ගේ ආශිර්වාදය ලැබෙන්නේ. නමුත් මෙතුමා යුගයට, කාලයට ඉස්සරහින් හිතපු ප්‍රාඥයෙක්. දාර්ශනිකයෙක්. ඒ නිසා එතුමාගේ අදහස් එදා මේ රටට ගැළපුනේ නැහැ. අනගාරික ධර්මපාලතුමා තමන්ගේ අවසන් හුස්ම හෙළුවේ මේ රටේ නොවෙයි. ඒ වාගේම

[ ගරු කීර්ති උඩවත්ත ]

ආනන්ද කුමාරස්වාමි මැතිතුමා තමන්ගේ ජීවිතයේ අවසාන කාලය ගත කරන්නේ ලංකාවේ නොවෙයි. ඔහුට සිද්ධ වෙනවා ලංකාව අතහැරලා යන්න. ලංකාවේ ජන සමාජය දෙමළ, සිංහල, මුස්ලිම් ඒ සියලු සමාජය ඔහුගේ මතවාදයන්වලට නියම ගරුත්වය දෙන්නේ නැති වෙලාවේ (බාධා කිරීමක්) එතුමා ලංකාව හැර යනවා. ලංකාව හැර ගිහිල්ලා ඇමරිකාවේ බොස්ටන් නගරයේ 1947 සැප්තැම්බර් 09 වැනිදා එතුමා අවසන් හුස්ම හෙළනවා. එතුමා මිය යන්නේ අංශභාග රෝගය හැදිලා අවුරුදු හත අටක් දුක් විඳලා නොවෙයි. එතුමා මිය යන්නේ පිළිකා රෝගය, එහෙම නැත්නම් වෙනත් ස්වභාවික කනගාටුදායක මරණයකින් නොවෙයි. බොහොම සුන්දර මරණයක් ආනන්ද කුමාරස්වාමි මැතිතුමාට ලැබෙන්නේ. එතුමා කියනවා මට නිකන් අපහසු ගතියක් දැනෙනවා. ඒ නිසා මම ඉස්සරහා තියෙන තණකොළ පිට්ටනියේ පොඩ්ඩක් වැතිරෙනවා. විනාඩි ගණනකින් එතුමාගේ මරණය සිද්ධ වෙනවා. ස්වභාව සෞන්දර්ය, ස්වභාවික පරිසරයත් එක්ක. ඒ වාගේ වාසනාවන්ත මරණයක් එතුමාට උරුම වන්නේ ඔහු දුවිඩයෙක් විධියට නොවෙයි. ඔහු ශ්‍රී ලාංකිකයෙක් විධියට අපේ මේ පුංචි රටට විතරක් නොවෙයි, මුළු ලෝකයටම දීපු ඒ උත්තරීතර දර්ශනය

නිසා කියන එකයි මා විශ්වාස කරන්නේ. ඒ නිසා මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ විශිෂ්ටයෙක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරමින් අපේ බුද්ධිමය නිම් වළලු පුළුල් කිරීම සඳහා දායකවීම පිළිබඳවත් - මේ පාර අපේ ඉතිහාසයෙන් අකා මකා දැම්මේ නැත. ඒ පාර ඒ විධියට තවමත් තියෙනවාය කියන පණිවුඩය මේ රටට, ලෝකයට ගෙන යන්න අපට දීපු ධෛර්යය සහ සහයෝගය සම්බන්ධයෙන් ඔබතුමාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ ගරු සභාපති සුනිල් විජේරත්න මැතිතුමා මූලාසනාරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [ රංජිත් සෝමවංශ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සභාපතිතුමා [ සුනිල් විජේ රත්න මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව කිරීමට මම ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 01.35 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඇත්තට මම ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු මම හිතන්නේ, මටත් වැඩිය ආනන්ද කුමාරස්වාමි මහතා ගැන සැහෙන්න විස්තරාත්මකව කථා කළා. එතුමා ගැන සමහර කරුණු මමත් ඔවුන්ගෙන් දැන ගත්තා. නමුත් මෙතැන තිබෙන කාරණය තමයි විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කථාව පටන් ගන්නකොටම එතුමාගේ ඒ සුපුරුදු - මම ඒ වචනය කියන්න කැමැති නැහැ. ජාතිවාදය ගැන.

ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ගෙනාවේ මමත් ශ්‍රී ලාංකිකයෙක් හැටියට විතරයි. මේකේ කිසිම ජාතිවාදී පදනමක් නැහැ. ආනන්ද කුමාරස්වාමි මහතා ශ්‍රී ලාංකිකයෙක් කියලා තමයි ආණ්ඩු පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන් අද තර්ක කළේ. මට වැඩිය එතුමා සිංහල බෞද්ධකම ගැනත්, එතුමා සිංහල බෞද්ධකම ගැන ලියපු පොත් ගැනත් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාත්, අපේ හිතවත් කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාත් කථා කළා. ඒකෙන් පේන්නේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු පවා පිළිගන්නවා එතුමා ශ්‍රී ලාංකිකයෙක් කියන එක. ඒක අපට අමතක කරන්න බැහැ. ඒවා මකන්නත් බැහැ. ඒ නිසා මේ යෝජනා ගෙනා පමණින් ඒවාට උත්තර දෙන්නේ නැතුව, ඒවා වෙනස් කළේ ඇයි කියලා කියන්නේ නැතුව නිකම් ජාතිවාදී ලේබල් අලවලා කථා කිරීම ගැන මම මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉතාම කනගාටු වෙනවා, එතුමාගේ දේශපාලන මතය ගැනත්, එතුමාට තිබෙන දේශපාලන බුද්ධිය ගැනත්. මොකද මට වැඩිය උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා ලොකු විස්තරයක් කළා. ආනන්ද කුමාරස්වාමි මහතා මේ රටේ බෞද්ධ ජනතාව වෙනුවෙන්, මේ රටේ බෞද්ධ උරුමය ගැන, ඒවා ආරක්ෂා කර ගන්න එතුමා ක්‍රියා කළ ආකාරය ගැන. එතකොට මමත් ඒ පැත්තේ ඉඳලා තමයි ආනන්ද කුමාරස්වාමි කියන නම අයින් කරන්න එපා, මේ මනුස්සයා මේ රටට ලොකු වැඩ කොටසක් කළා, ඒ වැඩ කොටසෙන් වැඩි හරියක්ම මේ රටේ සිංහල, බෞද්ධ ජනතාවගේ සංස්කෘතිය, කලාව ලෝකයට ගෙන යන්න කටයුතු කරපු ඒ මනුස්සයාගේ නම ආරක්ෂා කිරීමට කථා කරන එක ජාතිවාදීකමක්ද කියලා මම ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් අහනවා. මොකක්ද ඒකේ තිබෙන ජාතිවාදීකම? ඒකේ තිබෙන ජාතිවාදීකම මොකක්ද? ඒකේ ඇති ජාතිවාදීකමක් නැහැ. ඒකේ තිබෙන්නේ එතුමාගේ දේශපාලන බංකොලොත් භාවය. ඒකට එතුමාට උත්තර දෙන්න බැහැ. ජනාධිපතිතුමාට කඩේ යන්න ඕනෑ. ඒකයි එතුමාගේ තිබෙන උවමනාව. එහෙම නැතුව වෙන දෙයක් මෙතැන නැහැ. මේකේ කිසිම දේශපාලන අරමුණක් නැහැ ගරු සභාපතිතුමනි. ඒක තමයි මම කිව්වේ මට වැඩිය හොඳට ආණ්ඩු පක්ෂයේ සමහර උදවිය එතුමා ගැන කථා කළා. එහෙම නම් අද කථා කරපු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා මේ නම වෙනස් කරලා නැහැයි කියලා. මගේ ළඟ ගැසට් එක තියෙනවා. පාරේ කොටසක් වෙනස් කරලා තිබෙනවා. කොටසක් වෙනස් කරනවා කියන්නේ, වෙනස් කරලා තියෙන්නේ. එක කොටසක් වෙනස් කළා. ඇයි එක කොටසක් වෙනස් කළේ? ඒක වෙනස් කරන්න හේතු වුණේ මොකක්ද? ඒක පිළිගන්න ඕනෑ. අපි ඉස්සෙල්ලාම පිළිගන්න ඕනෑ අපි වෙනස් කළා. ආනන්ද කුමාරස්වාමි ගැන මෙතැන අඩලා වැඩක් නැහැ. ආනන්ද කුමාරස්වාමි මෙච්චර අපට කළා. අච්චර අපට කළා. අපි මෙච්චර කළා කියලා අඩන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එතුමාට ඒ කරපු අගෞරවය පිළිගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**

Hon. Mohamed Mujibur Rahuman

පිළිඅරගෙන කථා කරන්න. බොරු කියන්න එපා. දේශපාලන බංකොලොත් කථා කියන්න එපා. ජාතිවාදය ඉස්සරහාට දාලා හැංගෙන්න එපා. හැමදේකටම ජාතිවාදය අවුස්සන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව අවසන් කරන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අපි යෝජනාවල් ගෙනාවාම අපි මේ සභාවේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කාලය අවසානද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධ විවාදය මෙයින් අවසන් වෙනවා. එම යෝජනාවට ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සංශෝධනයක් ඉදිරිපත් කළා. එම සංශෝධන සහිත යෝජනාවට සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු යූ. ජෝර් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සීනුව නාද කරන්න.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 36 යි, විරුද්ධව 12 යි වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 36 for, 12 against and 00 decliners.*

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.45 ට, 2012 මැයි මස 22 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 01.45 p..m till 09.30 a.m, on 22.05.2012.*